
# (අ)ප්‍රකාශිත



ආර්.එම්.තීක්ෂණා
වෙලේගෙදර

# (අ)ප්‍රකාශිත

කතෘ:- තීක්ෂණා දින්ලිනී වෙලේගෙදර

<u>කතෘගෙ වෙනත් කෘති</u>

¥ නොනිවුණු ගිනිදැල්

¥ ධීර්

¥ හදවතක රිද්මය

මහ/මහමායා බාලිකා විද්‍යාලය-මහනුවර

9C

2026/05/10

9786242089584

# පිදුම.....

වචනයක් හෝ නොපවසා මටත් නොදැනෙන ලෙසින් මා පසු පස සෑම විටම රැදෙමින්,වැටෙන විට නැගිටින හැටි මෙන්ම ජීවිතයට පැමිණෙන සියළු බාදක වලට නොබියව මුහුණ දෙන හැටි කියා දුන්,මහමෙරක් තරම් හිතේ සගවාගෙන,මට නොදැනෙන්න මට ආදරය කරන අප්පච්චීට ආදරයෙන්....

# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරණ බාලිකා අධ්‍යාපනයෙ හැරවුම් ලක්ෂයක් ලෙස මහමායා බාලිකා විද්‍යාලයෙ මූලිකත්වයෙන් සිදු කරන හේමමාලා උපහාර ගත්කරණ ව ව්‍යාපෘතිය නම් කල හැක. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත් කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවර වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්ණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමු කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවි ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරට අංගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩම කර වූ හේමමාලා කුමරියට උපහාරයක් වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මාණකරණයෙන් දායක වූ පාසල් දරුවන් මග පෙන්වූ ගුරුබවතුන් ඇතුළු සැමට ස්තුතිය පුද කරමි.

ශෂිකලා සේනාධිර

විදුහල්පතිතුමිය

මහමායාබාලිකා විද්‍යාලය

මහනුවර

සුභාශිංසන පණිවුඩය

මහනුවර මහමායා බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථ කරනවියාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළිදැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ආණ්ඩුකාර වර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර,එය පොත් පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ.සිසු දරුවන්ගේ දක්ෂතා,නිර්මාණශීලිත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි වියාපෘති මගින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථ කරන ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව,සමස්තසමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබා දෙනු ඇති බව විශ්වාස කරමි.එමෙන්ම මෙවැනි උත්සහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරුමංණ්ඩලය, සිසුදරුවන් සහ සම්බන්ද වූ සියලු දෙනාට මාගේ හර්දාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම වියපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමෙ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අඹිහයකෝන්,

ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත,

සම්මානනීය මහාචාර්‍ය,පේරාදෙනිය විශ්වවිද්‍යාලය,

2026.05.10

සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථ කරණයට යොමු කිරීමෙ අරමුණින් මහනුවර මහමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල් වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය ඇතුළු ආචාර්ය මංඩලය,ශිෂ්‍ය දියණිවරුන්ට,සෙසු පාසල් වල දූ පුතුන්ට සහ මෙම ව්‍යාපෘතිය සැලසුම් කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයන්තය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්,අනිවාර්ය,ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමගින් අනාගතේදී බුද්ධිමත් කුසලතා පූර්ණ සුරපාපි පරපුරක් බිහිකිරීමටත් කැපවී සිටී.එවන් පසුබිමක සුසමාහිතවූ සමබර පෟරුෂයක් සඳහා නිර්මාණ හැකියාව,විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථ කරණ වැඩසටහන හේතුපාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේම මාලා උපහාර ග්‍රන්ථ කරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,

දියවඩන නිලමේ,

ශ්‍රී දළදා මාළිගාව,

2026.05.10.

~~~~~ (අ)ප්‍රකාශිත හැඟීම් ගොන්නක ආරම්භය~~~~~





*පළමු පරිච්ඡේදය*

හද එළිය කාමරේ ඇතුළට එන එක නවත්තන්න දාලා තියෙන තිර රෙදි වලින් පෙරිලා ආපු හද එළිය නිසා කාමරේ ඇතුළෙ තිබුණෙ වෙනම වයිබ් එකක්.ලස්සනට හද එළියත් එක්ක අඳුර හරි අපූරුවට මිශ්‍ර වෙලා තිබුණා.

Brzzzzz Brzzzz Brzzzz Brzzzz Brzzzz Brzzzz Brzzzz Brzzzz
~~~~~

හදිස්සියේම ස්ටඩී ටේබල් එක උඩ තිබ්බ නොනවත්වාම නාද වෙන දුරකතනය දිහා එයා බැලුවෙ ඕනාවට එපාවට  වගේ.ඒත් ඒකේ සටහන් වෙලා තිබුණ නම දැක්කම නම් මෙච්චර වෙලා අඳුරු වෙලා තිබුණ එයාගෙ මූණට ලා හිනාවක් ආවා.

"හෙලෝ...."

"හෙට විභාගෙ ලියන්න ලෑස්තිද සුදු නෝනා?"

"හ්ම්ම්ම්ම්...."

"හුම්ම්ම්....හුම්ම්ම්.... ගෑවට හරියන්නෙ නෑ බන්.හොද රිසාල්ට් එකක් දැම්මම කාටද ඉතින් ආඩම්බර..."

"මං ගැන ආඩම්බර වෙන්න ඉන්නෙ කවුද අශී?"

"මන් කිව්වා කියලා...."

"පාඩම් කරනවද?"

02

"නෑ පොඩ්ඩක් රිලැක්ස් වෙන්නත් එක්ක ඔයාට කෝල් එකක් දැම්මෙ...ඒත් උඹ නම් ඉන්නෙ ප්‍රෙෂර් එකක කියලා උඹගෙ වොයිස් එකෙන් තේරෙනවා?"

"අනේ මන්දා...."

"හරි....හෙට වෙලාවට වරෙන්...."

"ශුවර්....ගුඩ් නයිට්...."

"ගුඩ් නයිට් සුදු නෝනා..."

කෝල් එක කට් වෙනවත් එක්කම එයාගෙ මූණෙ තිබුණ හිනාව අතුරුදහන් වෙලා ගියා.අශිනි වෙච්ච එයාගෙ හොඳම යාළුවාට කොච්චර වෙනසක් නොපෙන්නන්න හැදුවත් පොඩි කාලෙ ඉඳන්ම එයා ළඟින් හිටිය ***අශිනි නවීනායාට*** එයාගෙ හොඳම යාළුවාගෙ වෙනස තේරුණා.ඉතින් එයා එහෙම්මම ෆෝන් එක මේසෙ උඩින් තියලා ඇඳට වැටුනෙ ඇඳේ තිබුණ ඒසී එකේ රිමෝට් එකෙන්,ඒසී එක උපරිමේටම වැඩි කරලා බෙඩ්ශීට් එකත් පොරව ගන්න ගමන්.

කොළඹ හතේ සුප්‍රසිද්ධ බාලිකා පාසලක තියෙන සාමාන්‍ය පෙළ විභාග ශාලාවක් ළග ළමයි එකතු වෙලා ඉන්නෙ හා හා පුරා කියලා ඉස්ස ඉස්සෙල්ලාම බුද්ධ ධර්මය පේපරේ ලියලා විභාගෙ ආරම්භ කරන්න.ඉතින් අශිනි වගේම එයාලගෙ පන්තියෙම තව ළමයි දෙන්නෙක් වෙච්ච එනුදියි,නවීෂයි මේ බලන් ඉන්නෙ අදාල පුද්ගලයා එනකල්.කොයි වෙලාවෙත් වෙලාවක් කිව්වොත් හරියටම ඒ වෙලාවටම එන පුරුද්දක් නම් අදාල පුද්ගලයට ඕනාවටත් වඩා හොදට තිබුණා.

"තාම නෑනෙ අශී?"

03

බලන් ඉදලා බැරිම තැන එනුදි ඇහුවෙ නවීෂගෙ අතේ තිබුණ වොච් එකෙන් වෙලාව බලන ගමන්.මොකද මේ තුන්දෙනා දැන් මේ විනාඩි දහයක ඉඳන් තමා එයා එනකල් බලන් ඉන්නෙ.කිව්ව වෙලාවට තව විනාඩියක් ඉතුරු වෙලා තිබුණත් අනිත් තුන්දෙනාටනම් ඉවසීමක් තිබුණෙ නෑ.

"ඔය එන්නෙ...."

ගේට්ටුවෙන් ඇතුල් වෙන අදාල පුද්ගලයව ඉස්සෙල්ලම දැක්ක නවීෂා,අනිත් දෙන්නටත් එයාව පෙන්නුවා. වෙලාව නම් වෙලාව.අන්න ඒකයි එයාගෙ

තියරිය.සාමාන්‍ය සුදුගවුම,ටයි එක,බෑග් එක වගේම සාමාන්‍ය සපත්තු වලට එක්තරා අසාමාන්‍ය දේකට තිබ්බෙ ඒ මුහුදු නිල්පාට ඇස් විතරයි.කලාතුරකින් මනුස්සයෙක්ට පිහිටන ඒ ඇස් දිහා වයස් භේදයකින් තොරව හැමෝම දෙපාරක් බලන්න අමතක කරේ නෑ.සාමාන්‍ය සුදු හම,කඩා හැලෙන කොට කොණ්ඩේ, සනකම් ඇහිබැම,කොට ඇහිපිහාටු එයාට ගෙනාවෙ වෙනම පෙනුමක්.***තිශේන්‍යා දිනර්චි පලිහක්කාර***.දඩබ්බර, මුරණ්ඩු පෙනුමකට උපතින්ම උරුමකම් කිව්ව තිශේන්‍යා තමා මේ කතාවෙ කතානායිකාව.

"ඇති යන්තම් රජ කුමරිය සැපත් වුණා....දැන්වත් යමන් අනිත් අය ඉන්න තැනට.."

මෙච්චර වෙලා බලන් හිටිය නවීෂා එනුදිව ඇඳන් යද්දි අශිනි එක්ක තිශේන්‍යා ඊට පිටිපස්සෙන් ආවා.යන මග දිගටම තිශේන්‍යාට බැන බැන යන්න නම් නවීෂා අමතක කරේ නෑ.

බුද්ධ ධර්මය ජේපරේ හරි අපූරුවට ලියලා ඉවර වෙලා, මේසෙ උඩ නිදාගෙන හිටියා කියලා අශිනිගෙන් හොද බැනුමකුත් අහලා තමා තිශේන්‍යා මේ කාමරේට වැදිලා ඉන්නෙ.නිකන් නෙවෙයි,එයාගෙ කලුපාට ගිටාර් එකේ තත් ඔහේ තද කරන ගමන්.වෙන කෙනෙක් තත් ඔහේ ඕනාවට එපාවට තද කරානම් ඒකෙන් කැත සංගීතයක් නිකුත් වෙන්න ඉඩ තිබ්බා .පුදුමෙකට වගේ විශ්වාස කරනවද තිශේන්‍යා ඔහේ තත් තද කරත් හරි අපූරු සංගීතයක් නිකුත් වුණා කියලා.ඇත්තටම තිශේන්‍යා මේ ගිටාර් එකක් බදාගෙන ඉන්න ප්‍රධානම හේතුව හෙට තියෙන්නෙ මියුසික්



ජේපර් එකලු.හැබැයි මුලින් ලියන්න ඕනි ජේපර් එක,පස්සෙ තමයි ප්‍රැක්ටිකල් එක තියෙන්නෙ කියලා මෙයාට මතක නැති පාටයි.

Brzzzz Brzzzz Brzzzz Brzzzz Brzzzz Brzzzz Brzzzz Brzzzz

නෑ...මේපාර අශිනි නෙවෙයි.අශිනිගෙ නම තිබුණ කෝල් එක එද්දි ඒ අඳුරු වෙලා තිබුණ මූණට පොඩි එළියක් ආවත් මේ කෝල් එකෙන්නම් වුණේ එයාගෙ මූණ තවත්

අදුරු වුණ එක.බර හුස්මක් පිටකරලා තිශේන්‍යා ගිටාර් එකත් පැත්තකින් තියලා කෝල් එක කට් වෙන්න ඔන්න මෙන්න තියලා තමයි ඒ කෝල් එක ආන්ස්වර් කරේ.

"කියන්න මාස්ටර්...."

"ඇයි මෙච්චර පරක්කු වුණේ?"

"නිදාගෙන හිටියෙ මාස්ටර්..."

"හ්ම්ම්ම්....කමක්නෑ වෙපන්ස් ටික ගන්න යන්න..."

"ඕකේ මාස්ටර්...."

බොරුවකුත් කියලා කෝල් එක කට් වෙලා යනවත් එක්කම ආපහු බර හුස්මක් පිට කරපු තිශේන්‍යා ෆෝන් එක මේසෙ උඩින් තියලා අල්මාරිය ඇරලා කළුපාට හූඩි එකකුයි කළුපාට පොකට් ට්‍රවුසර් එකකුයි එළියට ඇරන් ඇඳන් හිටිය ඇඳුම ගලවලා ඇඳගත්තා.ඒකටම බූට් දෙකකුත් දාලා කළුපාට මාස්ක් එකකුයි කැප් එකකුයි දාගත්ත ම ඒ කොට කඩාහැලෙන කොණ්ඩෙ මූණට වැටෙන්නෙ නැති වෙන්න කැප් එක හදාගෙන.ඉතින් මේසෙ ලාච්චුවේ තිබුණ එයාගෙ පිස්ටල් එකත් ඉනේ ගහගෙන පරණ ෆෝන් එක වෙනුවට වෙන ෆෝන් එකක් සාක්කුවට දාගෙන කාමරෙන් එළියට ආවා. අවුරුදු දාසයක ළමයෙකුට පිස්ටල් එක්ක?ඔවු....ඒක තමා පළිහක්කාර

05

උරුමය.තමන්ට උරුම නොවන උරුමයක අයිතිකාරියක් තමයි තිශේන්‍යා කියලා කියන්නෙ. පළිහක්කාර කියලා වාසගමක් තිබුණත් අඩුම තමන්ගෙ තාත්තා කොයි වගේද කියලාවත් එයා දන්නෙ නැහැ.එයා දන්නෙ දැන් එයාගෙ මාස්ටර්...එහෙමත් නැත්නම් එයාගෙ අම්මාගෙ හොඳම යාළුවා වෙච්ච ***අශේන් පළිහක්කාර*** කියන්නෙ එයාගෙ භාරකාරයා කියලා විතරයි.ඉතින් නමින් වගේම රූපෙන් විතරක් අම්මා කවුද කියන්න දන්න තිශේන්‍යා හැමදාම උත්සහ කරේ එයාගෙ අම්මාටයි තාත්තටයි මොකද වුණේ කියලා හොයාගන්න.ඒත් මේ අවුරුදු දාසයටම ඒක එයාට හොයාගන්න බැරි වුණා.අවුරුදු දාසයක් තිස්සෙ අම්මා තාත්තාගෙ තියා භාරකාරයාගෙවත් ආදරයක් සෙනෙහසක් නොලැබුන තිශේන්‍යා එයාට ඕනි දේවල්

කරේ හරි අඩුවෙන්.යන්න ඕනි ඉස්කෝලෙ,කරන්න ඕනි සබ්ජෙක්ට්,කරන්න ඕනි ස්පෝට්ස්,සරලවම කිව්වොත් තිශේනායාටවත් අයිති නොවුණ එයාගෙ ජීවිතේ තිබ්බෙ අශේන්ගෙ අතේ.අශේන්ට ළමයි නොහිටිය නිසා පලිහක්කාර උරුමය ගියේ තිශේනායාට.ඉතින් අකමැත්තෙන් වුණත් එයාට ඒක කරන්න වුණා.

එයා පහළට එද්දි කන්ටේනර් එකක් වගේම ඩිෆෙන්ඩර් හතරක් මැන්ෂන් එක ඉස්සරහා නවත්තලා තිබුණා.තිශේනායා වගේම කළු ඇඳලා හිටිය අශේන්ගේ පුද්ගලික ආරක්ෂකයා වෙච්ච ***යෂාන් ඒකනායක*** තිශේනායාව දැකලා පුදුම වුණා.මොකද මේ ඉන්නෙ හෙට උදේට එක්සෑම් ලියන්න ඉන්න කෙනා.එයාට තේරුණා තිශේනායා මේ ඇවිල්ලා තියෙන්නෙ එයාගෙ කැමැත්තෙන් නෙවෙයි මාස්ටර්ගේ ඕඩර් එකකට කියලා.

"ඔයා ගිහින් නිදාගන්න ශේන්....මන් මේ ගැන බලාගන්නම්.."

"අවුලක් නෑ...යමු...."

යෂ් තව මොනා හරි කියන්න කලින් ඉස්සරහින්ම තිබුණ ඩිෆෙන්ඩර් එකේ පැසෙන්ජර් සීට් එකට නැග්ගෙ ඊළඟට එන ප්‍රශ්න වැලෙන් බේරෙන්න කියලා කිව්වත් වැරදි නැහැ.

"හෙට මොනාද?"

ඒ ඩිෆෙන්ඩර් එකේම ඩ්‍රයිවින් සීට් එකට නැග්ග යෂ් ඇහුවෙ ඩිෆෙන්ඩර් එක මන්ෂන් එකෙන් එළියට දාන ගමන්.යෂ් හැමදාම වගේ තිශේනායා ගැන හොයලා බැලුවා. අන්න ඒකයි තිශේනායා මෙහෙම  හරි හොඳින් ඉන්න එකම හේතුව.

06

"මියුසික්.."

තනි වචනෙන් උත්තර දීපු තිශේනායා ෂටර් එකෙන් බැලුවෙ පහු වෙන ගස් දිහා.මුළු කොළඹම ලස්සනයි. ටවුන් එක ඊටත් වඩා ලස්සනයි.ඒත් එක්කම සයිඩ් මිරර් එකෙන් පේන්නෙ පිටිපස්සෙන් එන වාහන පෝළිම.සරලවම ගත්තොත් ලංකාව වගේම දකුණු ආසියාවක් හොල්ලන් ඉන්න මාෆියා ටීම් එකක ඊළඟ උරුමක්කාරිය තමයි තිශේනායා කියලා කියන්නෙ.ඉතින් එයාට තියෙන ප්‍රෙෂර් එක හොඳටම වැඩියි.කෙලින්ම වාහන පෝළිම වරායෙන් නවත්තද්දි යෂ් වාහනෙන් බැහැලා එළියට ගියේ තිශේනායාට

ඇතුලෙම ඉන්න කියාගෙන.ඉතින් එයාට කොහොමත් ඔය ඩීල් එක වෙන තැනට යන්න බෑ කියලා දන්න නිසාම තිශේනායා ෂටර් එකේ ඔළුව ගහගත්තා.ඩීල් එක හරියට නොවුනොත් ඒ වැරුද්ද තිශේනායාපිට පැටවුණත් එයා දන්නෙ මේවගේ වෙපන්ස් ඩීල් එකක්,මේ වගේ කට්ටියක් එක්ක මේ වෙලාවට මෙතන වෙනවා කියන එක විතරයි.අශේන් වුණත් තිශේනායාව තාම ඒ ඩීල් වලට ඉන්වෝල් කරගන්න බයවුණා.මොකද මේ වෙලාව වෙද්දිත් එයාව වගේම තිශේනායාව මරන්න ඇති තරම් කට්ටිය ප්ලෑන් හදනවා ඇති.

යෂ් ගිහිල්ලා එයාට අදාල තැනින් ඉදගෙන එයාගෙ ඩීල් එක ගැන කෙටියෙන් කියන් යන දිහා බලන් හිටියා.රයන් ඩි සිල්වා.ලංකාවෙ වෙපන් මාෆියාවෙ ලොක්කා කියලා හිතාගෙන ඉන්න කෙනා.ඒත් රයන් දන්නෙ නෑ එයා අශේන් අතේ නැටවෙන රූකඩයක් විතරයි කියලා.අශේන් පොඩ්ඩක්වත් කැමති නෑ එයාගෙ නම කෙලින්ම මේ බිස්නස් වලට ගෑවෙනවට.ඒ නිසාමයි අශේන් කට්ටිය දම්මලා එයාගෙ වැඩටික කරගන්නෙ.ඒක රයන්ට තේරෙන්නෙ නැති එක තමයි මෙතන තියෙන ප්‍රශ්නෙ.

"වෙපන්ස් ටික?"

රයන් අත්පුඩියක් ගහද්දිම කට්ටියක් වෙපන්ස් බෑග්ස් දහයක් එක්ක ආවා.යෂ් ඒ ටික චෙක් කරා.කොච්චර රයන් එක්ක ඩීල් කරත් අශේන්වත් යෂ්වත් රයන්ව විශ්වාස කරේ නෑ.

"හරි...."

යෂ් වෙපන් ටික ඇරන් එයාලගෙ කන්ටේනර් එක බාන අය දිහා බලන් හිටියා.ඒත් යෂ් දැක්කෙ නෑ මේ වෙලාවෙ රයන්ගෙ මූණෙ තිබ්බ ඒ කුරිරු හිනාව

07

*දෙවන පරිච්ඡේදය*

යෂ් එද්දිත් තද නින්දේ හිටිය තිශේනායාව ඇහැරවන්නෙ නැතුව යෂ් ඩීල් එකත් සක්සස් කරගෙන මැන්ෂන් එකට ආවා.ඒ එද්දිත් අශේන් මැන්ෂන් එකේ මේන් එන්ට්‍රන්ස් එකේ දොර ළඟ පඩිපෙළේ හිටන් හිටියෙ මැන්ෂන් එකේ ගේට් එකෙන් ඇතුළට දාපු වාහන ටික දිහා බලාගෙන කට කොනේ හිනාවක් එක්ක.අශේන්ට පහලින් නවත්තපු ඩිෆෙන්ඩර් එක ළඟට අශේන් පඩිපෙළත් බැහැලා ගියේ එයාගෙ දකුණු අත වෙච්ච තිශේනායා එළියට බහිනකල් බලාගෙන වුණත් යෂ් එලියට බහිනකලුත් තිශේනායා

එළියට බැස්සෙ නෑ.ඇයි කියන්න යෂ් දිහා බලලා ඇහිබැමක් උස්සලා ඇහුවත් යෂ් කරේ ඩිෆෙන්ඩර් එකේ පැසෙන්ජර් සීට් එකේ දොර ඇරපු එක.තිශේන්‍යාව දැක්කම කට කොනේ හිනාව නැති වෙලා හැඟීමක් නැති ඇස් වලින් එයා දිහා බලන් හිටියා.කිසිම හැල හොල්මනක් නැතුව ඇස් වහගෙන මාස්ක් එකයි කැප් එකයි දාන් හිටිය තිශේන්‍යාට රවන්නත් අශේන් අමතක කරේ නෑ

"ඇහැරවන්න එපා මාස්ටර්...හෙට එක්සෑම්...."

අශේන් තට්ටු කරලා තිශේන්‍යාව ඇහැරවන්න හැදුවත් ඊට ඉස්සර වෙච්ච යෂ් අශේන්ව නැවැත්තුවා.

"එයාට අන්ඩර්බොස් කියලා පෝස්ට් එකක් දීලා තියෙන්නෙ නිදාගන්න නෙවේනෙ යෂ්.."

යෂ් රවලා තිශේන්‍යාගෙ අතට තට්ටුවක් දැම්මත් තිශේන්‍යා හිටියෙ තද නින්දෙ නිසා එයාගෙ කිසිම සෙලවීමක් තිබ්බෙ නෑ.

08

"මාස්ටර්...."

"යෂ් ඒගැන කරදර වෙන්න එපා.....මං මෙයාව ඇහැරවන්නම්...නිදාගන්න නෙවේනෙ තියෙන්නෙ..."

යෂ්ටත් වෙන කරන්න දෙයක් නැති නිසා අශේන්ට ඔළුවත් නවලා කන්ටේනර් එකයි ගාඩ්ලා ටිකයි එක්ක මැන්ෂන් එක පිටිපස්සෙ තියෙන ස්ටෝ රූම් එකට ගියා.යෂ් යනකල් බලන් හිටිය අශේන් තිශේන්‍යාව අත් දෙකට අරන් කකුලෙන් ඩිෆෙන්ඩර් එකේ දොරත් වහලා දාලා තිශේන්‍යාව අරන් ගියේ තිශේන්‍යාගෙ කාමරේට.දොර අරිද්දිම ආපු දරාගන්න බැරි සීතල නිසා අශේන්ව වෙවුලුවා.ඒසී එක උපරිමේටම වැඩි කරලා.අශේන් තිශේන්‍යාව ඇදෙන් තියලා බූට් දෙකත් ගලවලා දාලා රිමෝට් එක අරන් ඒසී එක අඩු කරා.

"ඇන්ටාක්ටිකවෙ ඉන්නවා කියලද දන්නෑ හිතන් ඉන්නෙ...."

අශේන් තිශේන්‍යාටත් බැන බැනම ඒසී එකත් අඩු කරලා කවදාවත් නිදාගනිද්දි දාන්නෙ නැති ටේබල් ලැම්ප් එකේ නයිට් ලයිට් එකත් දාලා මාස්ක් එකයි , කැප් එකයි අයින් කරලා ෆෝන් එක අරන් තිශේන්‍යා විතරක් දන්නවා කියලා හිතන් ඉන්න පාස්වර්ඩ් එකත් එන්ටර් කරලා උදේ පහට එලාම් එකත් තියලා එයාගෙ කාමරෙන් එළියට ආවා.

දවස් නවයක් තිස්සෙ තිබුණ විභාගෙත් ඉවර කරලා තිශේන්‍යා මේ ඉන්නෙ අශේන් වගේම යෂ් එක්ක එයාලට වෙන් වෙලා තිබුණ මීටින් රූම් එකේ.

"මේක හරියන වැඩක් නෙවෙයි මාස්ටර්....."

අශේන් අතින් නලල මිරිකගන්න ගමන් සෝෆා එකේ ඔළුව තියාගත්තා.එයාටත් හිතාගන්න බෑ කවුද මේ එයා පස්සෙන් ෆලෝව් කරන්නෙ කියලා.ඒ ගැන කතාකරන්න යෂ්ටයි තිශේන්‍යාටයි එන්න කිව්වත් හදිස්සියේ මතක් වුණ වැඩක් නිසා අශේන් සෝෆා එකෙන් නැගිට්ටා.

09

"හරි...යෂ්...අපි බලමු හෙට මොකද්ද කරන්න පුලුවන් කියලා...ශේන්...මාත් එක්ක යන්න එනවා..."

ඒ මොකද්ද වුණේ කියලවත් හිතන්න වෙලාවක් නොතියා අශේන් මීටින් රූම් එකෙන් එළියට ගියේ යන්නෙ කොහෙද කියලාවත් තේරුමක් නැතුව තිශේන්‍යාත් අශේන් එක්ක මැන්ෂන් එකේ පාක් එකට එද්දි.අශේන් මේ වෙලාවෙ හිටියෙ සුදු ෂර්ට් එකට

කලු ට්‍රවුසර් එකක්.තිශේන්‍යාත් හිටියෙ සුදු හූඩ් එකකට ජීන්ස් ට්‍රවුසර් එකක් ඇඳලා.ඉතින් එයා නිකමට හිතුවා මේ යන්නෙ සෙමෙට්‍රි එකට වෙන්න ඇති කියලා.මොකද තිශේන්‍යා මීටින් රූම් එකට එන්න කලින් ගාඩ් කෙනෙක් අතේ අශේන් පණිවිඩයක් එවලා තිබ්බා සුදු ඇඳුමක් ඇඳන් එන්න කියලා.වෙනදා කවදාවත් එයාව එක්කන් නොගිය සෙමෙට්‍රි එකට අද එයාවත් එක්කන් යනවා කියලා හිතුන නිසා තිශේන්‍යාට පොඩි හිනාවක් ගියා.

"ගන්න..."

කාර් එකේ යතුර තිශේන්‍යාට දාන ගමන් අශේන් පැසෙන්ජර් ශීට් එකට නැග්ගා.තිශේන්‍යා වාහනේ මැන්ෂන් එකෙන් එළියට දාලා අශේන් කියන කියන පැත්තට වාහනේ හැරෙව්වා.

"වමට දාන්න..."

අශේන් අහක බලාගෙනම තිශේන්‍යාට වමට දාන්න කිව්වාම යන්නෙ කොහෙ තියෙන සෙමෙට්‍රි එකටද කියලාවත් දන්නෙ නැතුව තිශේන්‍යා වම් පැත්තට තිබ්බ ලොකු අතුරු පාරට වාහනේ දැම්මා.බල්ලෙක්වත් නැති පාරෙ එකම එළියකට තිබ්බෙ තිශේන්‍යාලා යන වාහනෙන් නිකුත් වෙච්ච එළිය විතරමයි.මිනිස් වාසයක් ඇති කියලා හිතන්න බැරි පාරකින් වාහනේ ඇදෙද්දි තිශේන්‍යාගෙ තීක්ෂණ ඇහැට අහුවුණේ බයික් හතරක් එයාලා යන පාර ඉස්සරහා නවත්තලා තියෙනවා කියලා.එතන කළු ඇඳගත්ත අය අට දෙනෙක් ඉන්නවා කියලාත් තිශේන්‍යාට ඈත ඉඳලාම කියන්න පුලුවන් වුණා. වෙන්න යන්නෙ හොඳ දෙයක් නෙවෙයි කියලා තේරුම් ගත්ත තිශේන්‍යා අශේන්ගේ අණ ලැබෙන්න කලින්ම යූ ටර්න් එකක් ගහලා වාහනේ අනිත් පැත්ත හරව ගත්තා.ඒත් එක්කම බයික් කාරයෝ අට දෙනාත් එයාලාගෙ බයික් වලට නැග්ගේ තිශේන්‍යා ආපු වේගෙට වඩා දෙගුණෙකින් වාහනේ ඩ්‍රයිව් කරන් යද්දි.ඩ්‍රයිව් කරන ගමන් යෂ්ටවත්



කාටවත් ලොකේෂන් ශෙයා කරන්න බැරි නිසා තිශේන්‍යා කෙලින්ම ෆෝන් එක දුන්නෙ අශේන් අතට.

"යෂ් කියලා සේව් කරලා තියෙන නම්බර් එකට ලයිව් ලොකේෂන් ශෙයා කරන්න මාස්ටර්...."

වචනයක්වත් නොකිව්ව අශේන් තිශේන්‍යාගෙ ෆෝන් එක අතට ගත්තාම තමයි මතක් වුණේ ගත්තාට මොකද පාස්වර්ඩ් එක දන්නවා කියලා තිශේන්‍යාට පෙන්නන්න බෑ කියලා.

"පාස්වර්ඩ් එක?"

"72105"

අශේන් පාස්වර්ඩ් එක දැනන් හිටියත් තිශේන්‍යාට සැක නොහිතෙන්න පාස්වර්ඩ් එක මොකද්ද කියලා ඇහුවා.පාස්වර්ඩ් එක එක දිගට කියාගෙන ගිය තිශේන්‍යා 110යට පැද්ද එක 170 වටම ස්පීඩ් කරා.ලොක් ස්ක්‍රීන් එකෙන් හෝම් ස්ක්‍රීන් එකට ආවම අශේන් දැක්කෙ තිශේන්‍යා  ස්කූල් බොටමකට ස්කූල් බොක්සින් ටීෂර්ට් එකක් ඇඳලා ලොකුම ලොකු ට්‍රෝෆි එකක් අතේ තියාගෙන හරි ලස්සනට හිනාවෙලා ඉන්න ෆොටෝ එකක්.ඒක දිහා තප්පර කීපයක් බලන් හිටිය අශේන් ඉක්මනට යෂ්ට ලොකේෂන් ශෙයා කරලා ඒ ෆෝන් එකෙන්ම යෂ්ට කෝල් එකක් ගත්තා.

කියන්න ශේන්...."

"මන් අශේන්...."

"අහ්....කියන්න මාස්ටර්...."



"මන් ලොකේෂන් ශෙයා කරා...පුලුවන් තරම් ඉක්මනට ටීම් එකක් එක්ක එන්න...."

"ඕකේ මාස්ටර්...."

කෝල් එක කට් වෙනවත් එක්කම තිශේන්‍යා වේගෙන් වංගුවක් ගත්ත නිසා අශේන්ව දකුණු පැත්තට විසික් වුණා.එතකොටයි අශේන් දැක්කෙ තිශේන්‍යා මේ යන්නෙ 270 ට කියලා.මේ යන වේගෙට ගියොත් කොහෙ හරි හොස්පිට්ල් එකකවත් නවතින්න වෙන්නෑ කියලා තේරුම් ගත්ත අශේන් ඉක්මනට පිටිපස්ස බැලුවෙ තාමත් ඒ බයික් හතර එයාලාගෙ පස්සෙන් එනවද බලන්න.කොහෙද...මදි පාඩුවට කළු පාට ඩිෆෙන්ඩර් හතරකුත් එයාලාගෙ පස්සෙන් එන්න පටන් අරන්. තිශේන්‍යා මේ ස්පීඩ් එකේ යන එක සාධාරණයි.ඇත්තටම කිව්වොත් තිශේන්‍යා යන්නෙ කොහෙද කියලා අඩුම එයාවත් දන්නෙ නැහැ.

"යන්නෙ කොහෙද කියලා දන්නවද?"

අශේන්ගෙ ප්‍රශ්නෙට ලැබුණෙ නෑ කියන්න ඔළුව වැනීමක් විතරයි. තිශේන්‍යා ෆුල් ට්‍රයි එක දෙන්නෙ වාහන මග ඇරලා ඒ ස්පීඩ් එක තියාගෙන යන්න.

"ළමයෝ රෙඩ් ලයිට්....."

කවදාවත් තිශේන්‍යාය හරි නමවත් කියලා නැති අශේන් එයාට ළමයෝ කියලා කිව්වහම එයාගෙ ඇස් ගැස්සෙනවා අශේන් මිරර් එකෙන් හොඳටම දැක්කා. ඒත් රෙඩ් ලයිට් වැටිලා තිබ්බත් මිනිස්සු පාර පනිනවා කියන එකවත් ගානක් නැතුව තිශේන්‍යා ඒ ස්පීඩ් එකේම සුදු ඉර පහු කරා.මිනිස්සු තිශේන්‍යාට වගේම ඊට පිටිපස්සෙන් එන වාහන වල ඩ්‍රයිවස්ලාට බනිද්දි ඒවා ඇහුනෙ නෑ වගේ තිශේන්‍යා තවත් අතුරු පාරකට දැම්මා.ඒ මිනිස්සු කියපු ඒවා තිශේන්‍යාට ඇහුනෙ නැති එක වෙනම කතාවක් හැබැයි.ඒ අතුරුපාර දිගෙත් වාහනේ හයි ස්පීඩ්ම ඇරන් යද්දි හදිස්සියේම වැදිච්ච බ්‍රේක් පාර නිසා අශේන් ඉස්සරහා ශීට් එකේ ඔලුව වද්දගන්නෙ නැතුව බේරුනේ අනූ නවයයි දශම නවයෙන්.අශේන් ඉස්සරහා බලද්දි දැක්කෙ ග්‍රවුන්ඩ් එකක්.එතනින් එහාට පාරක් නෑ.ඒකෙ තේරුම තමයි මේ දෙන්නා කොටුවෙලා කියන එක.වෙන කරන්න දෙයක් නැති නිසා අශේන් කාර් එක පිටිපස්සෙ ශීට් එකේ තිබ්බ ගන් දෙකෙන් එකක්



තිශේන්‍යාගෙ පැත්තට දාන ගමන් එයා දොර ඇරන් එළියට බැස්සා.තිශේන්‍යා අශේන්ගේ ආරක්ෂාවට එයාට එහාපැත්තෙන් හිටගනිද්දි ඩිෆෙන්ඩර් වල අය වගේම බයික් වල අයත් බැස්සෙ කඩු කිනිසි අරගෙන.බැලූ බැල්මටම කියන්න පුළුවන් මේ අය පාතාල කාරයෝ කියලා.මොකද මාෆියා එකේ අය කවදාවත් කඩු කිනිසි විතරක් පාවිච්චි කරන්නෙ නැහැ.ඔවු.ඒක එයාලාගෙ සම්ප්‍රදායක්.මාෆියාවෙ සම්ප්‍රධායක්.

දැනුත් තිශේනායා ළඟ වගේම අශේන් ළඟත් ගන්ස් හතරක් තියෙනවා.ඒ වගේම කිනිසි දෙකයි. ඔක්කොම උණ්ඩ විසි හතරයි.එයාලාට විරුද්ධවත් විසි හතරයි.තිශේනායා එයා ළඟ තියෙන මාෆියාවේ අය යූස් කරන කිනිසි දෙකෙන් එකක් අතට ගත්තා.මෙතනදි ෆයිට් එකක් ඇදලා ගත්තොත් ඒ දෙන්නාට අවාසියි.විසිහතරට විරුද්ධව දෙන්නයි.ගොඩක්ම අවාසියි.ඒවුණට සටන ලේසි යෙන් අතාරින්න අකමැති අශේන් වගේම තිශේනායා මූණට මූණ බලලා ඔළුව වනලා ඉස්සරහා හිටිය කෙනෙක්ට තිශේනායාගෙ අතේ තිබ්බ කිනිස්සකින් දමලා ගැහුවෙ ඒ මනුස්සයාගෙ පපුවෙ දකුණු පැත්තතෙන් කිනිස්ස ගිහිල්ලා රුදවෙද්දි. වැදිච්ච කිනිසි පාර දිහා එකපාරක් බලපු මනුස්සයා කිසිම හැල හොල්මනක් නැතුව බිම ඇදගෙන වැටුණා.ඒත් එක්කම ක්‍රියාත්මක වෙච්ච කළු ඇදන් හිටිය කට්ටිය තිශේනායාට වගේම අශේන්ට ඇටෑක් කරන්න ඉස්සරහට ආවා.තිශේනායාගෙ දෙවෙනි කිනිස්සත් ගිහිල්ලා තව මනුස්සයෙක්ගේ ඇගේ ඇමිනෙද්දි අශේන් තිශේනායාගෙ පැත්තට දාපු රිදී පාට චක්‍රය මැදින් අල්ලගත්ත තිශේනායා ඒකත් තව මනුස්සයෙක්ගෙ බෙල්ල ඒම් කරලා විසික් කරා.එතනම තුන් දෙනෙක් පරලොව යද්දි අශේ එයාගෙ පැත්තට ආපු පස් දෙනෙක්ව ඉවර කරලා තිබ්බා.එහෙම්මම තිශේනායා බිම වැටිච්ච එක්කෙනෙක්ගේ කිනිසි දෙකක් අතට අරන් ඒක කරකවලා තවත් දෙන්නෙක්ව ඉවර කරා.පළවෙනි ගන් එකේ බුලට්ස් ඉවර වුණ නිසා ඒක පැත්තකට විසික් කරපු අශේන් අනිත් ගන් එකෙන් වැඩ පටන් ගත්තෙ තිශේනායා එයාගෙ පළවෙනි ගන් එකෙන් වැඩ පටන් ගත්තා තව දාහතරකට ඇටෑක් කරන්න දෙන්නා ළඟම තියෙන බුලට්ස් මදි කියලා තේරුම් ගත්ත දෙන්නා බිම වැටිච්ච අයගෙම වෙපන්ස් ඇරන් එයාලටම ඇටෑක් කරා.ශේන් පිටිපස්ස හැරිලා හිටිය නිසා වගේම එයාගෙ ඉස්සරහින් ඇටෑක් කරන්න එන අයට
අවදානෙ දීලා තිබ්බ නිසා එයාට පිටිපස්සෙන් කිනිස්සක් ඇරන් එයාට අනින්න එන කෙනාව අශේන් දැක්කෙ නැහැ.ඒත් ඒ මනුස්සයාව තිශේනායා දැක්කා.ඒත් තප්පර කීපයක් පරක්කු වෙලා.ඉතින් එයා පුලුවන් තරම් ඉක්මනට ගිහිල්ලා ඒ කිනිස්ස නවත්තලා ඒ මනුස්සයාටම ඒ කිනිස්සෙන් ඇන්නා.වුණේ මොකද්ද කියලා බලන්න හැරුණ අශේන් දැක්කෙ දකුණු අතෙන් ලේ පෙරාගෙන වම් අතින් ශූට් කරන තිශේනායා.ඒගැන බලන්න වෙලාවක් නොතිබ්බ නිසා ඉතුරු වුණ අන්තිම බුලට් දෙකෙනුත් තව දෙන්නෙක්ව ඉවර කරපු අශේන් තිශේනායා ළඟට ගියා.

"බුලට් ඉවරයි...."



ඒත් එක්කම තිශේනායා එයා ළඟ තිබ්බ අනිත් ගන් එක අශේන්ට විසික් කරේ එක පාරින්ම එයා ඒ ගන් එක අල්ලගද්දි. අශේන් පිටිපස්සෙන් තිශේනායාට ඇටෑක් කරන්න ආව දෙන්නාටත් වෙඩි තිබ්බෙ ඒ මිනිස්සු දෙන්නා ලේ පෙරාගෙන බිම වැටෙද්දි.අන්තිමට තිශේනායාශෙ අත විතරක් නෙවෙයි නළලත් තුවාල වෙලා තියෙද්දි අශේන්ගේ වම් අතේ උරහිසත් වැලමිටත් අතර කැපුමක් තිබුණා.

"අමාරු නෑ නේද මාස්ටර්?"

බැලූ බැල්මටම පේනවා වැඩියෙන්ම අමාරු තිශේන්‍යාට කියලා.ඒත් එයාම අශේන්ගෙන් අමාරුද කියලා අහද්දි අශේන් එයාට රැව්වා.ඒ දෙන්නගෙ කතාවට බාදා කරගෙනම එතන ඇවිත් නැවැත්තුවේ ඩිෆෙන්ඩර් හතරක්.ඒත් එයාලා එද්දි වෙන්න ඕනි ඔක්කොම වෙලා ඉවරයි හැබැයි.

"මාස්ටර්....මාස්ටර්.....මොකද වුණේ?"

ඉස්සල්ලාම යෂ් අශේන් ළගට ඇවිත් මොකද වුණේ අහද්දි අශේන් බැලුවෙ එයාලා ඉස්සරහින් නවත්තපු ඩිෆෙන්ඩර් දිහා.

"ඉස්සරවෙලා හොස්පිට්ල් එකකට යමු....ඒ අතරෙ හොයන්න කව්ද මේ වැඩේ කරේ කියලා..."

මේ වැඩේ කරේ කවුද කියලා හොයන එක එතන හිටිය යෂ්ගෙ ගෝලයෙක්ට බාර දීපු යෂ් අශේන් එක්ක වගේම තිශේන්‍යා එක්ක හොස්පිට්ල් එකට යන්න කාර් එකට නැග්ගා.විනාඩි පහක් විතර ඩ්‍රයිව් කරත් වාහනේ ඇතුලෙ තිබ්බෙ ලොකු නිශ්ශබ්ද තාවයක් විතරයි.

"ලේ යන්න දෙන්න එපා."



අශේන් නිහඩතාවය බිදලා දාලා කිව්ව දේට ෂටර් එකේ ඔළුව ගහන් හිටිය තිශේන්‍යා  ඉස්සල්ලාම පොඩ්ඩක් කම්පියුස් වුණා.මුලින්ම එයාට තේරුණේ නෑ ඒ කියන්නෙ එයාට කියලා.සාමාන්‍ය දැනීම නෑ කියලා ඉතින් මොනා කරන්නද?

"ඔයාට කියන්නෙ ශේන්.....හූඩි එකෙන් හරි කවර් කරගන්න....."

ඩ්‍රයිව් කරන ගමන් හිටිය යෂ් කියපු දේට ඔලුව වනපු තිශේනායා හූඩි එක ගලවලා දකුණු අත ලාවට වගේ ඔතාගත්තා.හූඩි එකට යටින් ඇදලා හිටිය ආම්කට් එක නිසා දකුණු අතේ තිබුණ කැපුම් පාර දැකලා අශේන් තිශේනායා දිහා අමුතු විදිහට බැලුවා.ඒ සුදු පාට හූඩි එක රතු පාට වෙන්න වැඩි වෙලාවක් ගියේ නෑ. එයා දන්නවා ඕනාවටත් වඩා එයාගෙ ඇගෙන් ලේ පිටවුණා කියලා.ඔන්න එතකොටයි තිශේනායා දැක්කෙ එයා දිහා අමුතුවට බලන් ඉන්න අශේන්ව.

"අතට මොකද වුණේ?"

"ප්‍රැක්ටිස් කරද්දි කම්බියකට කැපුණා."

තිශේනායා සත්‍යවාදීව බොරුවක් කිව්වා.ඉස්කෝලෙ අන්තිම දවසෙදි රණ්ඩුවක් වුණා කිව්වොත් හොද බැනුම් ටිකක් අහගන්න වෙන නිසා එයා පොඩි බොරුවක් කිව්වා.ඒත් ඇත්ත හේතුව දන්න යෂ්නම් තිශේනායාට රැව්වා.ඒත් ඒක අශේන් දැක්කෙ නෑ.ලාවට වගේ කැරකිල්ලක් ආවත් ඒ ගැන ලොකුවට හිතපු නැති තිශේනායා ආපහු ෂටර් එකේ ඔළුව ගහගත්තා. ආපහු ඇස් ඇරලා බලද්දි තිශේනායා හිටියෙ හොස්පිට්ල් එකේ ඇදක.වම් අතෙන් එන අමතර වේදනාව මොකද්ද කියලා බලද්දියි එයා දැක්කෙ අතට කැනියුලා එකක් ගහලා තියෙනවා කියලා.ඊටපස්සෙ වෙච්ච හැමදේම එයාගෙ ඔළුවට ගලන් එද්දි එයා සේලයින් බෝතලේ දිහා බැලුවා.ප්‍රයිවට් හොස්පිට්ල් එකක් වෙච්ච නවලෝක හොස්පිට්ල් එක සම්පූර්නයෙන්ම හොදම ඩොක්ටස්ලා වගේම ඇටෙන්ඩන්ස්ලා විතරක් නෙවෙයි හැමදේම හොදටම තියෙන හොස්පිට්ල් එකක්.තිශේනායා බැලුවෙ ඇතින් පේන දර්ශනය දිහා.වින්ඩෝ එකෙන් පේන්නෙ කොළඹ නගරය.තාම මිනිස්සු ගැවසුනේ නැතත් දවල් වෙද්දි මිනිස්සුන්ගෙන් පිරිලා ඉතිරිලා යන වීදි දිහා තිශේනායා බලන් හිටියා.ඊටපස්සෙ තිශේනායා බලන් හිටියෙ එයාගෙ හාට් බීට් එක පෙන්න තිබ්බ මැෂින් එක දිහා.



*තුන්වෙනි පරිච්ඡේදය*

හොස්පිට්ල් එකේ ඇදක හිටියත් එයා ළග මේ වෙද්දි කවුරුත් හිටියෙ නෑ.අඩුම යෂ්වත් හිටියෙ නෑ.වම් අතට ගහලා තිබුණ සේලයින් එක ගලවලා දාන්න හැදුවත් ආය ඒකත්

අවුලක් වෙයි කියලා තිශේන්‍යා නිකන් ඔහේ සිවිලිම දිහා බලන් හිටියා.කල්පනා කරන්න ගොඩක් දේවල් තිබ්බත් ඇගට පණ නැති ගතිය නිසා එයාගෙ ඔලුවට මොකුත්ම ආවෙ නෑ.එයාට දුක එයාට සෙමෙට්‍රි එකට යන්න බැරිවුණ එක.එයා එයාගෙ අම්මාගෙ ග්‍රේව් එක වත් දැකලා නෑ. තාත්තගෙ නමවත් දන්නෙ නෑ. හේතුව අශේන් ඒ ගැන හොයන්න දෙන්නෙ නැති එක.ඉස්සර එයා ඒ ගැන හොයන්න ට්‍රයි කරත් ඒක වැඩක් වුනේ නැති නිසා තිශේන්‍යා ඒක අතෑරලා දැම්මා. ඒ අතින් තිශේන්‍යා කියන්නෙ මාර දරාගැනීමක් තියෙන කෙනෙක්. ඉස්කෝලෙදි එක දවසක් එක්කෙනෙක් එයාට අනාතයා කිව්වම ඉවසීමෙ අන්තිම සීමාවෙ හිටිය තිශේන්‍යා ඔවු මන් අනාතයෙක් තමයි කියලා ඉන්නෙ නැතුව ඒ කියන කෙනාට තිශේන්‍යාගෙ කේන්තිය පිටවෙනකල් ගහලා තියෙනවා.ඉතින් ආය කවුරුත් එහෙම දෙයක් තිශේන්‍යාට කියන්න ආවෙ නැහැ.ඒ වගේම පොඩි කාලෙ ඉඳන් අම්මා අප්පච්චිගෙ ආදරේ කියන්නෙ කොයි වගේ හැඟීමක් ද කියලා දන්නෙ නැතුව ලොකු වෙනවා කියන්නෙ හරි අමාරු වැඩක්.ඊටත් හපන් මාෆියා ෆීල්ඩ් එකේ ඊලග ක්වීන් වෙනවා කියන එක. එළියේ කීදෙනෙක් මේ වෙලාගෙ තිශේන්‍යාගෙ ජීවිතේ නැතිකරන්න ට්‍රයි කරනවද කියලා අඩුම එයාවත් දන්නෙ නෑ.ඉතින් ඒ හැම දුකක්ම වේදනාවක්ම දරාගත්ත තිශේන්‍යාට අමුතුවෙන් මේ අතෙන් එන වේදනාව දරාගන්න දෙයක් නෑ.ඒත් එයා කරේ අතට ගහලා තිබුණ කැනියුලා එක ගලවලා දාපු එක.නහරෙකට ගහලා තිබුණ කැනියුලා එක ගලවද්දි ලේ ආවත් ඒක ගනන් ගත්තෙ නැති තිශේන්‍යා හොස්පිට්ල් රූම් එකේ තිබුණ වින්ඩෝ එක ළගට ගියා.උදේ ඉර පායන්න තව ටික වෙලාවයි තියෙන්නෙ.ඉතින් අහසෙ තියෙන්නෙ හරිම ලස්සනක්.අහසත් එක්ක ගනුදෙනු කරන තිශේන්‍යා එයා ආස කරන අහසත් එක්ක කාටවත් නොතේරෙන කතා බහක් කර්න් යද්දි නැගෙනහිර අහසෙන් හරි ලස්සනට ඉර පායක් එනවා.තිශේන්‍යාගෙ ආසම දර්ශන වලින් එකක්.ඉර පායන එක.අනිත් එක ඉර බහින එක.ගිනි බෝලයක් අහසට නගිද්දි තිශේන්‍යාගෙ මූණට ලා එළියක් වැටුණා.මේ මනුස්ස පරානෙගෙ මූණට එහෙම ලේසියෙන් හිනාවක් වැටෙන්නෙ නෑ.දැනටමත් ඒකට ඉතින් සාක්ශි ඕනි නැනෙ.මේ වෙලාවෙ හොස්පිට්ල් රූම් එකේ දොර ඇරන් ඇතුලට ආවෙ යෂ්.

"මේ මොකද කැනියුලා එක ගලවලා?"



තිශේන්‍යා කරේ උත්තර දෙනවාවෙනුවට යෂ්ගෙ ඇස් දිහා බලපු එක.

"හරි කමන්නෑ එන්න මන් සුප් එකක් ගෙනාවා."

සුප්.. තිශේන්‍යාට පේන්නම බැරි දේවල් වලින් එකක්.ඒ නිසාමයි එයා එපා කියන්න ඔලුව දෙපැත්තට වැනුවේ.

"එපා කියලා බෑ...මෙන්න මෙහෙ එනවා.."

යෂ් බලෙන්ම තිශේන්‍යාව ඇදෙන් ඉන්දවලා ගෙනාපු සුප් බෝල් එකෙන් එක හැන්දක් තිශේන්‍යාගෙ කටට ලංකරත් තිශේන්‍යා කරේ කට ඇරියෙ නැති එක.ඒත් එක්කම යෂ්ට කෝල් එකක් ආවෙ අශේන්ගෙන්.

"කියන්න මාස්ටර්..."

"සිහිය ඇවිල්ලද?"

"ඔවු මෙතන ඉන්නවා මාස්ටර්...සුප් බොන්න බෑ කියනවා."

"ඩොක්ට මොකද කිව්වෙ?"

"මුලින්ම සුප් දීලා දවල්ට කෑම දෙන්න කිව්වා."

"එහෙනම් බොන්න කියනවා."

"බෑ කියලා කියනවනෙ මාස්ටර්...."



"ඉතින් යෂ් තමුන්ගෙවත් මගේවත් බඩට නෙවේනෙ.බැරිනම් නිකන් ඉන්න කියනවා."

"ඒත් මාස්ටර්...."

"යකා අවුස්සන්නෙ නැතුව ෆෝන් එක තියනවා යෂ්..."

අශේන්ගෙනුත් බැනුම් අහලා යෂ් කෝල් එක කට් කරලා ආපහු සුප් හැන්දක් කටට ලං කරත් තිශේන්‍යා එයාගෙ ෆෝන් එකට අවදානෙ දුන්නෙ නිකන් හරියට යෂ් කියලා කෙනෙක් එතන නෑ වගේ.

"මේක බොනවා තිශේන්‍යා...පුදුම වදයක්නෙ ඕයි දෙන්නෙ?"

තිශේන්‍යා කරේ ලාවට හිනාවෙන එක.මෙයාගෙ මේ සම්පූරණ හිනාවම එළියට ගන්න පුලුවන් වුණේ අශිනිට විතරයි.

"කවුරුත් යෂ්ට කිව්වෙ නැනෙ මාව වදයක් කරගන කියලා..ඒ නිසා මට වදයක් වෙන්නෙ නැතුව යන්න..."

ඔවු...යෂ්ට ඒකට තරහා ගියා.බාරකාරයා එයාට සලකන්නෙ නෑ කියලා දන්න නිසාම තකහනියක් මේඩ් කෙනෙක්ට කියලා සුප් එකක් හදවගෙන ආවම ඒක බොන්නෙ නැතුව යන්න කියද්දි යෂ්ගෙ ඉවසීමේ සීමව පැන්නා.ඒ නිසාමයි සුප් එක ටේබල් එක උඩින් තියලා යෂ් තිශේන්‍යාටත් රවලා එතනින් එළියට ගියේ.ඒ තිශේන්‍යා සුප් බොන්න අකමැති නිසාමත් නෙවෙයි.අශේන් බැරිනම් නිකන් ඉන්න කිව්ව නිසා.මේ මනුස්සයාගෙ ඉතින් ඇඟ පුරාම මුරන්ඩුකම.ඒ නිසා කාටවත් සකන්ඩ් වෙන්න කැමති නැහැ.

ටිකට් කපාගෙන ගෙදර ආපු ගමන් තිශේන්‍යාට සිද්ධ වුණේ අශේන් එක්ක රයන්ගෙ තිත් පොළට යන්න.හේතුවක් නැති වුණත් රයන් අශේන්ලාට එන්න තිබුණ වෙපන් ස්ටොක් එකක් වෙන ටීම් එකකට දීලා.ඉතින් ඒකට හේතුව දැනගන්න ඕනි



නිසා අශේන් බලෙන්ම තිශේන්‍යාවත් එක්කන් රයන්ලා ළගට ආවා.මෙ වෙද්දි රයන් හිටියෙ එයාගෙ ගාඩ්ලා වටකරගෙන සෝෆා එකක ඉදගෙන.මෙතන තිබ්බේ හරි අදුරු පෙනුමක්.තෙත වෙලා තිබ්බ පොළවෙ තිශේන්‍යාගෙ වගේම අශේන්ගෙ බූට් වල සද්දෙ රැව් දුන්නා.

"ඉදගන්න මිස්ටර් අශේන්...."

ඒ ආරාධනයත් එක්ක අශේන් රයන් ඉදන් හිටිය සෝෆා එකට ඉස්සරහා තිබුණ සෝෆා එකෙන් ඉදගනිද්දි තිශේනායා අශේන්ග පිටිපස්සෙන් හිටගත්තා.

"මොකද්ද රයන් මේකෙ තේරුම?"

අශේන් මේ අහන්නෙ වෙපන්ස් ගැන.ඒත් රයන් නම් හිටියෙ මේ වෙන දේවල් ගැන කිසිම දෙයක් දන්නෙ නෑ වගේ.

"මොකක් ගැනද මේ කියන්නෙ?"

රයන්ගෙ උත්තරේ නිසා තිශේනායාගෙ අත ඉබේම එයා ඉනේ ගහන් හිටිය ගන් එක ළගට ගියා.

"රයන් නොදන්නවා වෙන්න බැනෙ?"

අශේන්ගේ ඒ කටහඬේ තිබ්බේ තරහක්.ඒත් ඒ තරහා පාලනය කරගෙනයි අශේන් හිටියෙ.

"ඒකට වගකියන්න ඕනි මේ ඔයාගෙ පිටිපස්සෙ ඉන්න කෙනා..."



අශේන් එකපාරටම බැලුවෙ තිශේනායා දිහා.තිශේනායා බැලුවෙ අශේන් දිහා.රයන් මේ මොනවද කියවන්නෙ කියලා තිශේනායාට තේරුම් ගන්න බැරුවයි හිටියෙ.තිශේනායාට විතරක් නෙවෙයි අශේන්ටත් තේරුණේ නෑ රයන් මේ මොනවද කියවන්නෙ කියලා.

"මේක කෝටි හයක ඩීල් එකක්නෙ මිස්ටර් අශේන්...ඔයාලගෙන් කෝටි පහක් මට ලැබුණ නිසා මන් ඒක කෝටි හතකට විකුණුවා.මන් හිතන්නෙ ඒකෙ වැරැද්දක් නෑ."

ඔවු.අශේන් මේ ඩීල් එකට ගෙව්වෙ කෝටි පහයි.එතනින් එහාට අශේන් යන්න කැමති වුණේ නෑ.මොකද ඒ ගාන ඕනාවටත් වැඩියි.අශේන්ට වගේම තිශේන්‍යාටත් තේරුණා රයන් මේ කියන්නෙ බොරුවක් කියලා.

"හරි...අපි ගෙවපු කෝටි පහ ආපහු රිටන් කරන්න....."

අශේන් මෙතනට එන්න ප්‍රධානම හේතුව වුණේ ආපහු ඒ කෝටිපහ ගන්න එක.මොකද කෝටියක් කියන්නෙත් සල්ලිනෙ.

"අශේන් මොනාද හිතුවෙ?මන් ඒක අශේන්ලාගෙ මැන්ෂන් එකටම යැව්වා...."

අන්න එතකොටයි අශේන්ට වගේම තිශේන්‍යාට තේරුණේ මේක උගුලක් කියලා.දැන් මෙතනින් එහාට මොනවා වෙයිද කියලා හිතාගන්න බැරුව වුණත් අශේන් වගේම තිශේන්‍යා කලබල වුණේ නැහැ.

"රයන්ට මොනවද ඕනි?"

මෙතනින් යන්න ඕනි කියලා දැන දැනත් අශේන් තවත් රයන් එක්ක කතා කර කර ඉන්න හදනවා කියලා හිතුණ තිශේන්‍යා අශේන්ට හිතෙන් බැන්නා.

"මට ඕනි ඔයාගෙ ගෝලයාගෙ ජීවිතේ..."



ඒකට තිශේන්‍යා බයවුණේ නෑ කිව්වොත් බොරු.ඒත් තිශේන්‍යා වගේම රයන් දැක්කෙ නෑ අශේන්ගෙ ඇස් තරහෙන් රතු වෙනවා.ඒ ඇස් වල නහර පවා රතුපාටින් පේන තරමටම අශේන් හිටියෙ තරහෙන්.

"ඒක දෙන්න බෑ කිව්වොත්.?..."

ඒක ස්තීරයි.මොකද ඒ කටහඬේ තිබ්බෙම ස්ථිර බවක්.මෙතන ඉන්නෙ එයයි තිශේන්‍යායි විතරයි කියලා දැන දැනත් අශේන් හිටියෙ මෙතන ෆයිට් එකක් ඇදලා ගන්න මානසිකත්වෙකින්. මොකද මේ රයන් ඉල්ලන්නෙ එයාගෙ හොඳම ගෝලයාගෙ ජීවෙතේ.ඊළඟ මාෆියා ක්වීන්ගෙ ජීවිතේ.ඉතින් අශේන් ලේසියෙන් ඒක රයන්ට දෙයි කියලා රයන්ට හිතුනානම් රයන්ට වැරදිලා.

"බලෙන් හරි ගන්නවා...."

සලා∘∘∘∘∘∘∘

වීදුරුවක් බිඳිලා යන සද්දයක් එක්ක ලොකු දුමකින් මුළු බේස්මන්ට් එකම වැහිලා යද්දි රයන්ගෙ කට්ටිය කලබල වෙලා හතරවටටම වෙඩිතියන්න ගත්තෙ රයන්ව කවර් කරන ගමන්.විනාඩි හතරක් වගේ යද්දි දුම අඩුවුණත් තිශේන්‍යා වගේම අශේන් එතන හිටියෙ නෑ.මේක කොච්චර ලැජ්ජාවක්ද? රයන්ගෙ කට්ටිය විස්සක් විතර හිටියත් තිශේන්‍යා වගේම අශේන්ව අල්ලගන්න එයාලට බැරි වුණා.

"ශිට්.....අතට ආව චාන්ස් එක මිස් වුණා.....ශිට්....."

රයන් එයාට තිබ්බ තරහා ළග හිටිය ගාඩ් එකෙන් පිට කරද්දි අශේන් හිටියෙ තිශේන්‍යා එක්ක මැන්ෂන් එකට යන ගමන්.අශේන් හිටියෙ තරහෙන් පුපුරණ ගමන්.අබ ටිකක් දැම්මොත් පුපුරණ සයිස් එකේ තරහකින් අශේන් මේ වෙලාවෙ හිටියෙ.වෙන ඩ්‍රයිවර් කෙනෙක් වාහනේ ඩ්‍රයිව් කරද්දි අශේන් බැලුවෙ පිටිපස්සෙ ඉන්න තිශේන්‍යා දිහා.බෙහෙත් වල සැරට ෂටර් එකේ ඔළුව තියාගෙන හැරිලා. බැන්ඩේජ් එක රතුවෙලා තියෙන්නෙ තුවාලෙ ආයෙත් පැරිලා නිසා කියලා හිතුව අශේන් ඩ්‍රයිවර්ට වාහනේ හොස්පිට්ල් එකට හරවන්න කිව්වෙ තුවාලෙට බෙහෙත් දාගන්න කියලා.හොස්පිට්



එකට ඇවිල්ලා තිශේන්‍යාවත් ඇහැරවගෙන ඇතුලට ඇවිල්ලා තිශේන්‍යාව හොස්පිට්ල් එකට ඇඩ්මිට් කරලා අශේන් ටිකකට එළියට ගියේ තිශේන්‍යාව හොස්පිට්ල් රූම් එකේ තනි කරලා.කොහොම නමුත් ඊළඟ තප්පරේ ආපු කෝල් එක නිසා තිශේන්‍යා මූණ ඇඹුල් කරගත්තා. මොකද ඒ කතා කරේ එයාගෙ කෝච්. ඉතින් වෙන කරන්න දෙයක් නැති නිසා එයා කෝල් එක ආන්ස්වර් කරා.

"කොහෙද ඔයි ඉන්නෙ....කැප්ටන් මෙහෙම පිස්සු නැටුවාම හරියනවද?"

"සොරි කෝච්...."

"සොරි කිව්වාම ඔක්කොම හරියනවනෙ නේද.....හෙට උදේම රින්ග් එකට එන්න...."

"කෝච්...."

"නෝ එක්ස්කියුසස්....."

"කෝච්.........."

"කිව්වනේ....උදේ අට වෙද්දි රින්ග් එකේ ඉන්න කියලා.කියන සිංහල තේරෙන්නෙ නැද්ද?..."

"මන් හොස්පිට්ල් ඇඩ්මිට් වෙලා ඉන්නෙ..."

තප්පර කීපෙකට කෝච්ගේ කට වැහුණා.

"මොකද වුණේ?"



"අත පොඩ්ඩක් කැපිලා..."

"වමද දකුණද?"

"දකුණ...."

"එහෙනම් සොරි පුතේ...."

"අවුලක් නෑ...ටූනමන්ට් එක දවසට ප්ලේ කරන්න පුලුවන්..."

"අනේ මන්දා කෙල්ලේ....රෙස්ට් කරන්නකො ඉස්සල්ලා..."

"ප්ලීස් කෝච්...මේක මගේ ලාස්ට් ටූනමන්ට් එක....මට ප්ලේ කරන්න දෙන්න...."

"දකුණනම් කොහොමද ළමයෝ ප්ලේ කරන්නෙ...අතත් තුවාල කරගෙන ෆයිට් කරන්න ගිහිල්ලා ගුටි  කන්නයි වෙන්නෙ.."

"ප්ලීස් මන් ට්‍රයි කරලා බලන්නම්..."

"හ්ම්ම්ම්....ඉස්සල්ලා රෙස්ට් කරන්නකෝ....පුලුවන්නම් විතරක් අනිද්දා වගේ ඇවිල්ලා යන්න..."

"ඕකේ..."

"පරිස්සමින්..."

23

බර හුස්මක් පිට කරද්දිම අශේන් කඩාගෙන බිදගෙන රූම් එක ඇතුළට ආවෙ තරහින් පුපුරන ගමන්.ඒ පස්සෙන් යෂුත් ආවෙ ඊළගට වෙන්න යන දේ ගැන තේරුණ නිසා.යෂ් ආවෙ කොයි වෙලාවෙද කියලා හිතාගන්න බැරුව හිටිය තිෂේනායාට ටික වෙලාවකින්

තමයි තේරුණේ අශේන් මෙච්චර වෙලා හිටියෙ එයාගෙයි එයාගෙ කෝච්ගෙයි කතාව අහගෙන කියලා

"කෝච්ට කෝල් එකක් අරන් කියනවා ඒ ටූනමන්ට් එක ප්ලේ කරන්නෙ නෑ කියලා..."

සාමාන්‍ය වුණත් තරහත් එක්ක මිස්‍ර වෙච්ච හඩකින් එහෙම කිව්වත් තිශේන්‍යා නම් හිටියෙ ඒවා අහගෙන නෙවෙයි.එක්කො අහගෙන හිටියෙ නෑ,නැත්තන් ඇත්තටම ඇහුනෙ නෑ.අනිත් එක එයාගෙ හිත ඇතුලෙ වැඩ කරේ ඒ ටූනමන්ට් එක ප්ලේ කරන්න එපා කියන හේතුව මොකද්ද කියලා.

"ඇහුනද?"

අශේන්ගෙ කටහඩ උස් වෙද්දි කවදාවත් නැතුව තිශේන්‍යා ඉදන් හිටිය තැනින් නැගිටලා අශේන් එක්ක මූණට මූණ හිටගත්තා.අශේන්ට වඩා උපරිම අගලක් කොට තිශේන්‍යාගෙ මේ ක්‍රියාකලාපෙ නිසා යෂ්නම් හිටියෙ ඇස් දෙකත් කටේ දාගෙන.

"මං බෑ කිව්වොත්?"

තිශේන්‍යා ඒ වගේම වොයිස් එකකින් ඇහුවෙ යෂ්ගෙ ඇස් තවත් ලොකු වෙද්දි.එයා තිශේන්‍යාගෙ මේ පෞර්ෂය දකින්නෙ මාහියා ෆීල්ඩ් එකේදි විතරයි.ඒත් අද?අශේන් එක්ක එකට එක තියා හරියකට වචනයක්වත් කතා නොකරන තිශේන්‍යා අද මෙහෙම හැසිරෙද්දි අශේන් පවා අඩියක් පස්සට ගත්තා.බයට නෙවෙයි තිශේන්‍යාට කේන්ති ගියොත් එයාව කන්ට්‍රෝල් කරගන්න එයා ලෑස්ති වෙලා ඉන්න ඕනි නිසා.



"මෙච්චර කල් මන් ඔයා කිව්ව දේවල් කරා.එකක්වත් මගාරින්නෙ නැතුව කරා.ඒත් අද...ඒක කරන්න බෑ.මං ඒ ටූනමන්ට් එක ප්ලේ කරනවා...ඒක නවත්තන්න ඔයාට බෑ.."

අශේන් කරේ එයාවම සන්සුන් කරගන්න එක.මොකද මේ වෙලාවෙ එයත් කේන්ති ගත්තොත් මෙතන ලොකු ප්‍රශ්නයක් වෙන්න පුලුවන්.

"ඔහොම නෙවෙයි කොහොම කිව්වත් තමුන්ට ඒක ප්ලේ කරන්න බෑ.ආය ඒක වෙනස් වෙන්නෙත් නැහැ."

තිශේන්‍යාගෙ ඇස් බලන් ඉද්දි රත ගැහුණා,ඒ දකුණු අත මිටමෙලවුණා. අශේන් එයාව කොච්චර පාලනේ කරන් හිටියත් එයා දැනන් හිටියා තිශේන්‍යා තව එක වචනයක් හරි කිව්වොත් එයාගෙ ඉවසීම පනිනවා කියලා.

"වූනමන්ට් එකට ප්ලෙ කරන්නෙ මම නම්, ප්ලේ කරන්නෙත් මමනම්,මේක මගේ ලයිෆ් එකනම් ඒකට අත දාන්න ඔයාට කිසිම අයිතියක් නෑ."

තිශේන්‍යා පුලුවන් උපරිම සන්සුන් වෙන්න උත්සහ කරත් එයාට ඒක කරගන්න බැරිවුණා.ලොකු අවුලක් නැති නිසා මැහුම් නොදාපු අතේ තුවාලෙ පෑරිලා බැන්ඩේජ් එක තවත් රතට හැරවෙන්න වැඩි වෙලාවක් ගියේ නෑ.  ඇත්තරම පෑරිලා තිබ්බ තුවාලෙ තවත් පෑරුණා.

"නෑ...මට ඒකට අයිතියක් තියෙනවා.මන් තමුන්ගෙ භාරකාරයා...ඉතින් තමුන් කරන්න ඕනි මන් කියන දේ...අනිත් එක කතා කරන්නෙ කාටද කියලා දැනගෙන කතා කරනවා."

"කතා කරන්නෙ කාටද කියලා හොදටම දැනගෙන කතා කරන්නෙ...මගේ දේවල් වලට අතදාන්න එපා-"



චටස්...චටස්...

"-දෙයක් කිව්වම අහන්න පුරුදු වෙනවා!තමුන්ට ඒ ටූනමන්ට් එක ප්ලේ කරන්න බෑ....ඒක තමා ලාස්ට් ඩිසිෂන් එක...දැට්ස් ඕල්....."

වැදිච්ච තද කම්මුල් පාරවල් දෙක නිසා අමාරුවෙන් වුණත් වැටෙන්නෙ නැතුව කෙලින් හිටිය තිශේනායාට කියන්න තියෙන දේත් කියලා අශේන් එතනින් යන්න ගියේ එයාටත් රවලා අහක හිටිය යෂ්ටත් රවලා.

*හතරවෙනි පරිච්ඡේදය*

මේ වෙද්දිත් තරහා ගිහිල්ලා හිටිය තිශේනායා ඒ ළඟම තිබ්බ වින්ඩෝ එකට දකුණු අතින්ම ගහගෙන ගහගෙන ගියේ ගහපු හතරවෙනි පාරින්ම වින්ඩෝ එක බිදිලා යද්දි.මේ ධනපති පන්තියේ වැසියට කවුරු හරි මතක් කරලා දෙන්න මේ ඉන්නෙ හොස්පිට්ල් එකක කියලා.

"පිස්සුද ඕයි...."

"බයවෙන්න එපා තව ටික දවසකින් ඒකත් හැදෙයි"

එයාව එතනින් ඇදලා ඇදට දාපු යෂ්ටත් කෑගහලා ඇදේ අනිත්පැත්ත හැරුනෙ ඒ වින්ඩෝ එක කැඩුවෙ එයා නෙවෙයි වගේ.

"දැන් මේකටත් ගෙවපන්කෝ...."

යෂ් තිශේනායාටත් බැන බැනම ගියේ අශේන්ව හොයාගෙන.හොස්පිට්ල් එකෙන් එළියෙ තියෙන බෙන්ච් එකක ඉදන් හිටිය අශේන් ෆෝන් එකේ ලොකු වැඩක් කියලා ලොකු මවා පෑමක් කරන්න තමා මේ ලෑස්ති වුණේ.ඒත් ඊට කලින් එතනට ආව යෂ්



අශේන්ගෙ ෆෝන් එක උදුරලා ගත්ත නිසා ඒ මවාපෑම හරියට කරගන්න අශේන්ට බැරිවුණා.

"මාස්ටර් දන්නවානෙ එයාගෙ මෙන්ටල් කන්ඩිෂන් එක ගැන...ඇයි මෙහෙම හැසිරෙන්නෙ?"

අශේන් කරේ යෂ්ට රවපු එක.අශේනුයි තිශේන්‍යායි දන්න එකම දේ රවන්න විතරයි කියලා තමයි යෂ්ටනම් මේ වෙලාවෙ හිතුනෙ.

"අර අහිංසකීගෙ තිබ්බ එක ගතියක්වත් එයාට ඇවිත් නෑ.."

අශේන් මේ නොකියා කියන්නෙ තිශේන්‍යාගෙ අම්මාගෙ ගතිගුණ එකක්වත් එයාට ඇවිල්ලා නෑ කියලා. ඒත් ඒකට යෂ් කරේ ලාවට හිනාවෙන එක.

"හැබැයි අප්පච්චිගෙ ගතිනම් එහෙම්පිටින්ම ඇවිත් තියෙනවා. අප්පච්චිටත් ඒ විදිහටම තරහා යනවානෙ?"

ඒ කතාව ඇත්ත කියලා අශේන්ගෙ හිතේ කොටසක් කිව්වත් එයා ඒක පිළිගන්න කැමති වුණේ නෑ.

"***යුග්මට*** තරහා ගියාට ඌ දන්නවා ඒක කන්ට්‍රෝල් කරගන්න.මේක එහෙම නෙවෙයිනේ...."

අන්න ඒ නිසාමයි අශේන් ඒ වගේ උත්තරයක් දුන්නෙ.

"යුගාන් හිටියානම් අද ඒ කෙල්ල යුග්ම එක්ක සතුටින් ඉදියි...."



යෂ් හිතුවෙ තිශේන්‍යා යුග්ම කියන කෙනත් එක්ක ජීවත් වුණානම් දැන්ට වඩා සතුටෙන් ඉදියි කියලා.

"දැන් එයා ළඟ ඉන්නෙ යුග්ම නෙවෙයිනෙ යෂ්...දැන් එයා ළඟ ඉන්නෙ අශේන්... අශේන් පලිහක්කාර...*යුගාන්‍ය අභිනව්ට* වඩා අශේන් පලිහක්කාර කියන්නෙ කොයිවගේ කෙනෙක්ද කියලා යෂ් දන්නවනෙ? අශේන් පළිහක්කාර කියන්නෙයි යුගාන්‍ය අභිනව් කියන්නෙයි දෙන්නෙක් කියන එක හොඳට මතක තියාගන්න යෂ්..."

අශේන්ට තරහා ගියා.යුග්ම ගැන මතක් කරද්දි අශේන්ට තරහා ගියා.හේතුවක් නොදැන අශේන්ට තරහා ගියා.

"මන් කිව්වෙ යුගාන්‍ය හිටියානම් කියලා විතරයි මාස්ටර්...ඇයි කලබල වෙන්නෙ?"

යෂ්ට හිතාගන්න බැරිවුණා ඇයි යුග්ම ගැන කතා කරන හැම පාරම අශේන් කලබල වෙන්නෙ කියන එක.ඉතින් එදා වගේම අදත් ඒක ගැන හිතාගන්න යෂ්ට බැරිවුණා.

"යුගාන්‍ය ආපහු අපි අතරට එයි කියලා හිතන්න බැනෙ යෂ්...."

ඒත් යෂ්නම් අශේන් දිහා බැලුවෙ පුදුම වෙලා.ලෝකෙන්ම හැංගිලා ඉන්න යුගාන් ඉන්න තැන අශේන් දන්නවද කියන එක තමා යෂ්ට ඉස්සල්ලම ආපු ප්‍රශ්නෙ.

"මාස්ටර් දන්නවද යුගාන් ඉන්න තැන?"

අශේන් කරේ ඔවු කියන්න ඔලුව වනපු එක.

"ඉතින් මාස්ටර් හිතනවද තිශේන්‍යා යුගාන්ව පිලිගනියි කියලා?"



ඒකට අශේන් කරේ නෑ කියන්න ඔලුව වනපු එක.අශේන් වගේ වැඩිය කතාවට කැමති නැති කෙනෙක්ව මෙහෙම හරි ටික වෙලාවක් කතා කරවගත්ත එක ලොකු

දෙයක්.යෂ්ට තේරුණා අශේන් ඉන්නෙ ලොකු ප්‍රෙෂර් එකක කියලා.ඉතින් ඒ නිසාමයි යෂ් ඇවිත් මේ විදිහට ටිකක් කතා කරන්න හිතුවෙ.

"ඒත් ඇත්තටම යුගාන් හිටියානම් අද තිශේනායා සතුටින් එයා එක්ක ජීවත් වෙනවා නේද මාස්ටර්?..."

"හ්ම්ම්ම්...සමහරවිට..."

සමහර විට කියලා කිව්වත් අශේන්ගෙ හිතනම් කිව්වෙ යුගාන් ආපහු එන්න එපා කියලා.

"සමහර විට?"

"හරි හරි...එයා එක්ක සතුටින් ඉදියි..."

යෂ් ඉස්සරහා අශේන්ට ඇත්ත පිළිගන්නෙ නැතුව ඉන්න බැරි වුණා.මොකද මේ ඉන්නෙ එයාව ඉස්සර ඉදන්ම දන්න මනුස්සයා.තමන් හැරෙද්දි මේ මොකටද හැරෙන්නෙ කියලා කියන්න පුලුවන් මනුස්සයා.එහෙවු එකේ තවත් මොකටද ඒ මනුස්සයා එ දේවල් හංගලා බොරුවට හිතෙන් විදවන්නෙ?

"ආය යුග්ම එන එකක් නැද්ද මාස්ටර්?"

"මං දන්නෙ නෑ...මට තේරෙන්නෙ නෑ යෂ්...පේනවට වඩා මන් හරි අසරණයි බං...අර කෙල්ලට ඇත්ත කියාගන්න බැරුව මන් හරි අසරණයි.....මන් මේ හැම ප්‍රශ්නයක්ම විසදනවා.අර කෙල්ලව මන් මැරෙන්න කලින් එක දවසක් හරි සතුටෙන් තියනවාමයි...."



අශේන් සම්පූරණයෙන්ම අසරණ වෙලා යෂ්ගෙ උරහිසට බරවුණා.මොකද මේ ගැන කියන්නවත් කෙනෙක් මේ වෙද්දි අශේන්ට හිටියෙ නෑ.ලෝකයක් පිළිගනියි ද හැගීම්

දැනීම් නෑ කියලා ලෝකෙයක් හිතාගෙන ඉන්න මාෆියා කින්ග්, මේ විදිහට එයාගෙ සෙකට්‍රිගෙ උරහිසේ ඔළුව ගහගෙන ඔහේ තේරුමක් නැතුව කියවන් යයි කියාලා?

"ඒත් මෙච්චර දේවල් වුණාට පස්සෙත් මාස්ටර් හිතනවද තිශේන්‍යා යුගාන්ට සමාව දෙයි ද කියලා?යුගාන්ට කෙසේ වෙතත් මාස්ටර්ට?"

"එයා යුගාන්ට සමාවදෙන එකක් නැද්ද යෂ්?එයා අඩුම මටවත් සමාව දෙන එකක් නද්ද?"

අශේන් ඇහුවෙ බලාපොරොත්තුවක් එක්ක.ඒත් යෂ් කරේ ඒ හිත ඇතුලෙ ඇතිවෙච්ච පුංචි බලාපොරොත්තුව නැති කරලා දාපු එක.

"මන් හිතන්නෙ නෑ මාස්ටර්...යුගාන්ටවත්, මාස්ටර්ටවත් එයා කවදාවත් සමාව දෙන එකක් නෑ...."

අශේන්ට ඉබේටම බර හුස්මක් පිට වුණා.

"කමක් නෑ යෂ්...හැමදේම විසඳුනාම එයා තනියෙන් හරි නිදහසේ ඉදියි.මන් විදවන්න ඕනි යෂ්.ඒක අනිවාරෙන් එහෙම වෙන්න ඕනි.තිෂූට මේ දෙන දුකට මන් විදවන්න ඕනි.ඒත් මන් හීන දකිනව යෂ් මට එක දවසක් හරි  තිෂූ එක්ක සතුටින් ඉන්න පුලුවන් වෙයි කියලා."

අශේන් හිටියෙ අනාගතේ  ගැන හීනයක් දකින ගමන්.එයා එක්ක නැතුව හරි යුගාන් එක්ක හරි තිශේන්‍යා සතුටින් ඉන්නවා දකින්නයි අශේන්ට ඕනි වුණේ.

"අනේ මන්දා මාස්ටර්....එයත් ශේන්ට වැරදි කරා.එයා ශේන්ගෙන් ලෝකෙන් හැංගුනා...ඒ විතරක්ද එයාගෙම දරුවව එයා අනාත නිවාසෙක දාලා ගියා...මාස්ටර් ඒ කෙල්ලව හදාගත්තෙ නැත්තන් එයා තාමත් අනාතයෙක් මාස්ටර්..."

"මට තිශේන්‍යාව මන් ළගට ගන්න සාධාරණ හේතු තිබ්බා"

යෂ් කරේ ලාවට අශේන් එක්ක හිනාවුණ එක.ඒත් අශේන්ගේ ඒ මූණෙ හිනා පොදක් ගෑවිලාවත් නෑ.

"එහෙමද?"

හිනාවෙලාම යෂ් අහද්දි අශේන්ටත් හිනා ගියා...මොකද එයාට ඒ හේතුව මතක් වුණා.

"හ්ම්ම්ම්...."

අශේන් ඉතින් සුපුරුදු පරිදි ආපහු හූම්ටි තිබ්බා.

"යුගාන්ව හංගන්න මාස්ටර් ශේන්ට බොරු කිව්වා.ලෝකෙටම බොරු කිව්වා...මාස්ටර් ඇත්ත කියාගන්න බැරුව විදවනවා.අරයා ඇත්ත දැනගන්න නැතුව විදවනවා..මට හරි බයයි මාස්ටර් මේ හැමදේම විසදුනාමත් අපි හැමෝටම විදවන්න වෙයි කියලා."

යෂ්ට හිතුනා මේ ප්‍රශ්න හැම එකක්ම විසදුනාමත් එයාලට විදවන්න වෙයි කියලා.

"සතුට කියලා දෙයක් දන්නෙ නැති අපි වගේ අයගෙ ජීවිත වලට විවනවා කියන එක අමුතු දෙයක් නෙවේනෙ යෂ්...මං නිසා යෂ්ටත් දුක් වෙන්න වෙයිද කියලයි මට බය..."

"මේක අපි පටන් ගත්තෙ එකටනෙ මාස්ටර්...මේක ඉවර කරද්දිත් ඊට පස්සෙත් මං මාස්ටර් ළඟ ඉන්නවා."

"දන්නවද යෂ්...ඒක තමා මගෙ හයිය..."

"නොදන්නවා නෙවේ මාස්ටර්...ඒත් මන් තාමත් කැමති යුගාන්ට..."

"ඒ කියන්න යෂ් යුගාන්ගෙ පැත්තෙ...හරි හරි කමක් නෑ...අන්තිමට අශේන් වැරදිකාරයාවෙලා යුගාන් හොඳ මිනිහා වෙනවා. කමක් නෑ ඉතින්..."

අශේන් ඒක කිව්වෙ හිනාවෙලා වුණත් ඒ කටහඬ ඇතුලෙ තිබ්බ වේදනාව යෂ්ට තේරුණා.ඉතින් එයාටත් ඕනි වුණේ මේ පීඩනකාරී කතාබහෙන් මිදෙන්න..

"අරයා වින්ඩෝ එකත් කඩලා දැම්මා.තව මොනා කඩයිද දන්නෙ නෑ..මන් ගිහින් බලලා එන්නම් මාස්ටර්...

"හ්ම්ම්ම්ම්...."

එච්චරයි....එතනින් එහාට අශේන් කරේ හිතෙන් අනාගතේ මොනවාගෙන් මොනවා සිද්ධවෙයිද කියලා හිතපු එක විතරයි.යෂුත් තිශේනායා ළඟට ගියේ මේ වෙලාවෙ එයා ළඟ කවුරුත් නැති නිසා.වින්ඩෝ එකක් කුඩු කරපු එයාට අනිත් ඒවා කිඩු කරන එක මහදෙයක් නෙවේනෙ ඉතින්..

"ඔවු....."

"..........."



"නෑ.....කියන්න බෑ...හිතුනොත් මාසයක් විතර ඉන්නවා..."

"..........."

"මේ වෙලාවෙ හැටියට නිදහසේ ඉන්න හොදම තැන තමයි කැන්ඩි කියන්නෙ අශී..."

".........."

"හරි...උඹත් පරිස්සමින් ගිහින් වරෙන්...."

".........."

"හ්ම්ම්ම්ම්...."

යෂ් යද්දිත් තිශේන්‍යා අශිනි එක්ක ලොකු කතාවක.එයාට යෂ් ආවද කියලාවත් සිහියක් නැහැ.එයා ඔහේ කියවන් යනවා.කෝල් එක කට් කරාමයි එයා දැක්කෙ යෂ් ඇවිල්ලා කියලා.ඉතින් ඇඳේ නිදාගෙන අශිනි එක්ක කතා කර කර හිටිය තිශේන්‍යා ඇඳෙන් ඉදගත්තා.

"කවද්ද යන්නෙ?"

එයා දන්නවා අශේන් එක්ක තරහා ගියොත් හරි,හිත රිදුනොත් හරි එයා යන්නෙ නුවරට කියලා.ඒක නිසාමයි යෂ් කවද්ද යන්නෙ කියලා විතරක් ඇහුවෙ.

"අදාල නෑ නෙ?"



තිශේන්‍යා ෆෝන් එකට අවදානෙ දුන්නා. තිශේන්‍යාට තරම් කාටවත් මිනිස්සුන්ව ඉග්නෝ කරන්න බැරුව ඇති.ඒ තරම්ම ඒක හිතට දැනෙනවා.ළග ඉන්න කෙනා එතන

නෑ වගේ හැසියෙන්න තිශේන්‍යාට උපතින්ම හැකියාවක් ඇවිත් තියෙනවා.කෙසේ වෙතත් එතනින් එහා වචනයක්වත් කතා නොකරපු යෂ්ට මීටර් වුණේ නෑ තිශේන්‍යාගෙ බැන්ඩේජ් එක තනි රතු පාටට හැරිලා කියලා.ඉතින් යෂුත් ෆෝන් එක අතට ගත්තා.

"ආ....මේ මොකද මේ....තුවාලෙ පාරගත්තෙ මොනා කරන්න ගිහිල්ලාද...නර්ස්...මැහුම් දාන්න වෙයි...."

යෂ් වෙන දෙයක් ගැන තිශේන්‍යාගෙන් අහන්න ගියත් ඊට කලින් එතනට ආපු ඩොක්ටර් බැලුවෙ මේ ටිකට තුවාලෙ පාරගන්න තරන් වුණේ මොකද්ද කියලා.එතකොටයි එයා දැක්කෙ වින්ඩෝ එක කැඩිලා තියෙන විදිහ.වෙච්ච දේ හිතාගන්න පුලුවන් වුණ ඩොක්ට යෂ් දිහා බැලුවෙ දැන් මේ වින්ඩෝ එකට ගෙවන්නෙ කවුද කියලා අහන්න වගේ...යෂ්ටත් ඉතින් මේ වෙලාවෙ කට උත්තර නෑ.මොකද තිශේන්‍යා අ ඉන්න තැන අදාල නෑ තරහා හියොත් ඔහොම තමා තරහා පිටකරන්නෙ.

"ආහ්හ්...මේක අද දවස ඇතුලත හදලා දෙන්නම් ඩොක්ටර්..මේ...පේමන්ට් එක ඩබල් ගෙවන්නම්...එතකොට මේක හදනකල් ඩොක්ටස්ලට පාඩුවක් නෑනෙ..."

ඩොක්ටර් හා කියන්න ඔලුව වනලා තිශේන්‍යාගෙ අත අරන් මේ වෙද්දිත් ලේ වලින් පෙගිලා තිබුණ බැන්ඩේජ් එක ගලවලා දැම්මමයි යෂ්ගෙ ඇස් ලොකු වුණේ.යෂ්ගෙ විතරක් නෙවෙයි ඩොක්ටර් ඉස්සල්ලා ගැස්සුනා.මොකද ඒ තුවාලෙ තවත් ගැඹුරට කැපිලා තිබුණා.

"රිදෙන්නෙ නැද්ද?"

ඩොක්ටර් ඇහුවෙ ගානක්වත් නැතුව ඩොක්ටර්ගෙ මූණ දිහා බලන් ඉන්න තිශේන්‍යාගෙන්.ඩොක්ටර් දන්නෙ නෑ එයාගෙ අතේ වේදනාවට වඩා මේ වෙලාවෙ හිතේ තියෙන වේදනාව වැඩියි කියලා.



"රිදෙනවා ඒත් ගනන් ගන්නෙ නෑ."

ඒකට නම් ඩොක්ටර්ට හිනා ගියා.නර්ස් කෙනෙක් ඉදිකටු අරවා ඒවා ඔක්කොම උස්සන් ඇවිත් ටේබල් එකෙන් තිබ්බම යෂ් එතනින් එළියට දිව්වේ අශේන්ව එක්කන් එන්න.මොකද මෙතන වගකිවයුතු පුද්ගලයෙක් ඉන්න ඕනිනේ.

"චුට්ටක් රිදෙයි...කඩියෙක් කනවා වගේ තමයි දැනෙන්නෙ...ගනන් ගන්න එපා..."

පොඩි ළමයෙක්ට ඉන්ජක්ෂන් එකක් විදින්න යනවා වගේ ඇදලා පැදලා කියලා එහෙම්මම ඩොක්ටර් ඉදිකට්ට අතට ගත්තා.

"ආවුවුවුවුවු...."

පළවෙනි ඉදිකටුපාර හම ඇතුළට යද්දි තමා තිශේනායාට තරු පෙනුනේ... මොකෝ රිදෙන්නෑ කිව්වට පස්සෙ කෑගහන්න ඇයි?.ඒ වෙලාවෙම තමා අශේන්ව එක්කන් එන්න ගිය යෂුයි අශේනුයි ආවෙ.

"හිරිවට්ටලා ඉන්න බැරිද ඩොක්ටර්..."

එතනට කඩාගෙන ආපු අශේන් ඩොක්ටර් ගෙන් අහද්දි ඩොක්ටර් කරේ බෑ කියන්න ඔලුව වනපු එක.මේ වුණ වෙස් පෙරලීම මොකද්ද කියලා තිශේනායා කල්පනා කරත් අතෙන් දැනෙන වේදනාව ඊට වඩා වැඩි නිසා එයාට ඒ විපර්යාසෙ ගැන හිතන්න බැරි වුණා.

"එහෙනම් සිහින නැති කරන්නම ඕනි මිස්ට..."

සිහිනැතිකරනවද අහන්න වගේ යෂ් තිශේනායා දිහා බැලුවම එපා කිව්වෙ සිහිය නැතිවුණොත් හවසවත් නුවර යන්න වෙන්නෙ නැති නිසා.මුරණ්ඩු කමට මොනා



කරන්නද කියලා හිතන ගමන් යෂ් කරේ අහක බලාගත්ත එක.එයාට එය සියුම් දේවල් බලන්න බැරිලුනේ.පවු ඉතින් අහිංසකයා.

"කමන්නෑ...ඔහොම කරන්න..."

ඉතින් අදාල කෙනාගෙ අවසර ලැබුණට පස්සෙ ඩොක්ර් ඇතුලට යවපු ඉදිකට්ට අනිත් පැත්තෙන් එළියට ගත්තා.හතර පස් පාරක් ගියාම මෙච්චර වෙලා බලපු නැති තුවාලෙ දිහා තිශේනාා බැලුවෙ ඉවර ඇති කියලා හිතාගෙන වුණත් තව බාගෙකටත් වැඩිය තියෙනවා කියලා දැක්කමනම් ආපහු තරු පෙනුනා.ඉතින් අවදානෙ වෙනස් කරගන්න කියලා හිතාගෙන ෆෝන් එක අතට ගන්න ගියත්

"දගලන්න එපා ළමයො...වෙන කොහෙහරි ඇනුනොත් ඔයාටමයි රිදෙන්නෙ..."

ඩොක්ටර්ටත් රවලා,ෆෝන් එකටත් රවලා,මදිපාඩුවට රෂ්ටත් රවලා,හතර වටටම රවලා,තුවාලෙට රැව්වම තමා එයා රවන එක නවැත්තුවේ.

"පොඩ්ඩක් ඉවසන්න දුව...."

ඩොක්ටට තේරුණා තිශේනාා ඉන්නෙ මේක නවත්තන්න කියලා කියාගන්න බැරුව කියලා.ඉතින් ඒකමයි ඉවසන්න කියලා කිව්වෙ.මොන ඉවසීමක්ද ඩොක්ටර් දිගටම එයාගෙ වැඩේ කරන් යද්දි තිශේනාා නම් හිටියෙ හකුත් එකට තද කරගෙන,වම් අතින් ඇඳේ ෂීට් එකත් ගුලි කරගෙන.මේක බලන් ඉන්න බැරුව යෂ් අශේන්වත් ඇදන් රූම් එකෙන් එළියට ගියා.ඔය පතාක යෝධයෝ වගේ ඉන්න වැඩිහිටියො දෙන්නටම මේ වගේ සියුම් දේවල් බලන්න බැරිලුනේ.මම නෙවෙයි කියන්නෙ ඒ දෙන්නාමයි.

"ඔන්න ඉවරයි."

මැහුම් පහළවකුත් දාලා,අලුත් බැන්ඩේජ් එකකුත් දාලා ඉවරයි කිව්වම තමා තිශේනාා උඩට ගත්ත හුස්ම පහළට දැම්මේ.ඩොක්ටට නම් ඉතින් හිනා.රිදෙනවා ඒත් ගනන්



ගන්නෙ නෑ කිව්ව කෙනා නේද දැන් මේ වේදනාව කාගෙන හිටියෙ කියලා තමා ඩොක්ටර් නම් කල්පනා කරේ.

"හවසට ටිකට් කපන්න පුලුවන්..ආය පාරගන්නෙ නැතුව ඉන්න..."

තිශේන්‍යා හා කියන්න ඔලුව වැනුවමම ඩොක්ටර් රූම් එකෙන් එළියට ගියා.වැඩේ ඉවරයි කියලා ඩොක්ටර් යන ගමන් කියාගෙන ගිය නිසා විනාඩියකට විතර කලින් ගාඩ් කෙනෙක් ගෙනත් දුන්න කෑම එක යෂ් ඇතුළට ඇවිල්ලා මේසෙ උඩින් තිබ්බෙ කන්න කියලා ඇස් වලින් කියන ගමන්.ඒත් එයාට අමතක වුණා තිශේන්‍යාගෙ තුවාල වෙලා තියෙන්නෙ වම් අත කියලා.

"සොරි...ඉන්න කවන්නම්..."

අතෙන් කන්න බෑ කියලා මතක් වෙච්ච ගමන් යෂ් ඉක්මනට අත හෝදන් ඇවිල්ලා ඇඳ ළග තිබුණ පුටුවෙන් වාඩි වෙලා බත් එක මේසෙ උඩ දිගෑරලා පළවෙනි කට කැව්වා.

"ඔයාගෙ අම්මයි තාත්තයි ඔයාට ආදරෙයිද?"

*පස්වැනි පරිච්චේදය*

ඇහුව ප්‍රශ්නෙ නිසා දෙවෙනි බත් කට අනන ගමන් හිටිය යෂ් ඒක නවත්තලා තිශේන්‍යා දිහා බැලුවා.තිශේන්‍යා කියන්නෙ සාමාන්‍යයෙන් හිතලා යෂ් එක්ක කතා කරන්නෙ නැති කෙනෙක්. ඒත් මේ අම්මා අප්පච්චි කියන මාතෘකාව තිශේන්‍යා කතාකරන්නෙ යෂ් එක්ක විතරයි.

"ආදරේ ඇති..."

එයා දිහා බලාපොරොත්තුවෙන් බලන් ඉන්න ඒ ඇස් දිහා බලාගෙන යෂ්ට බොරු කියන්න බැරි වුණා.මේ කතා කරන්න හදන්නෙ එයාට දරාගන්නම අමාරු මාතෘකාව කියලා දැන දැනම යෂ් ඒ ගැන එයත් එක්ක කතා කරන්න හිත හදාගත්තා.

"ඒක කොයි වගේද?"

ඒ අහපු ප්‍රශ්නෙ නිසා නම් යෂ්ගෙ ඇස් වලට කඳුළු ආවා.එයා ගොඩක් වෙලාවට මේ ප්‍රශ්නෙ මගෑරලා තියෙනවා.ඒත් අද නම් ඒක මගාරින්න ක්‍රමයක් තිබුණෙ නෑ.අම්මා තාත්තාගෙ ආදරේ කොයි වගේද කියලා දන්නෙ නැති කෙනෙක් ඒ ආදරේ කොයි වගේද කියලා අහද්ද යෂ්ට ඒක දරාගන්න බැරි වුණා.

"කවද්ද කැන්ඩි යන්නෙ?"

ඒකට දෙන්න උත්තරයක් හොයාගන්න බැරිවුණ නිසා කැන්ඩි යන්නෙ කවද්ද කියලා ඇහුවත් තිශේන්‍යා කරේ හිනාවුණ එක.මොකද යෂ් මේ කරේ තිශේන්‍යාගෙ ප්‍රශ්නෙ මගෑරපු එක.

"ප්‍රශ්නෙ මගාරින්න හොද ප්‍රශ්නයක්.. ටිකට් කැපුවම යනවා."

දැනටමත් කතාවෙන් කතාව තිශේන්‍යා කටවල් පහ හයක් කෑවා.ඉතින් ඉතුරු ටිකත් කවාගන්න යෂ් කරේ කතාව දිගට ඇදන් ගියපු එක.ගලෙන් පට්ටයක් ගන්නවට වඩා අමාරු මේ මනුස්සයාගෙ වචනයක් ගන්න වුණාට මේ වෙලාවෙ එයා වෙනස්ම කෙනෙක්.ඒත් වචනෙන් දෙකෙන් තමා උත්තර.ඒක වෙනස් වෙන්නෙ නෑ ඉතින්.

"ටිකක් රෙස්ට් කරලා ගියානම් හරිනෙ?"

"බෑ...යන්න ඕනි.ටිකක් නිදහසේ හිටියානම් හොදයි..."

"ඔයාගෙ කැමැත්තක්."

"ඇති..."

"ඇති කියලා හරියනවා ඇයි...තව කටවල් දෙක තුනක් කන්න.."

බෑ...."

මේසෙ උඩ තිබුණ වතුර බෝතලෙන් වතුරත් බීලා තිශේනාා අනිත් පැත්ත හැරිලා ඇඳේ නිදාගත්තෙ ෆෝන් එකෙන් ඉන්ස්ට පැත්තෙ යන ගමන්.ආය මොනා කරලවත් කවන්න බෑ කියලා තේරුණ නිසා යෂුත් අත හෝදගෙන කෑම එක ඔතලා තිබුණ එකත් අරන් රූම් එකෙන් එළියට ආවා.

යෂ් ඇවිල්ලා නැවතුනේ අශේන් ළගින්.අශේන් තාම බෙන්ච් එකේ ඉඳගෙන බලාගත්තු අත බලාගෙන ඉන්නවා.

"කැන්ඩි යනවලු..."

යෂ් අශේන් ළගින් ඉඳගත්තෙ කේලම කියන ගමන්මයි.එක අතකින් බැලුවම ඒක කේලමකුත් නෙවෙයි.

"කවද්ද?"

හොඳ වෙලාවට අශේන් ඒක තේරුම් ගත්තා.

"ටිකට් කැපුවම යනවලු...."

අශාන් කරේ හා කියන්න ඔළුව වනපු එක.අශේන් වගේම යෂුත් එයාලාගෙ ලෝක වලට ගියේ මේ වෙන දේවල් ටික වෙලාවකට හරි අමතක කරලා දාන්න.

ටිකටුත් කපාගෙන හවස 1.00 විතර වෙද්දි තිශේන්‍යා නුවර බස් එකකට නැග්ගා.ඩබල් සීට් එකක ෂටර් එක ළග ඉදගත්ත තිශේන්‍යා එයාපොඩ්ස් දෙකත් ගහගෙන ඇදන් හිටිය නිල්පාට හූඩ් එකේ තොප්පිය දාගත්තෙ බෑග් එක උඩ රැක් එකකට දාන ගමන්.ඊ්ටපස්සෙ ෂටර් එකෙන් එළිය බලාගෙන ඔහේ පහුවෙන දේවල් දිහා බලන් හිටියා.මේ වෙලාවෙ බස් එකේ ගොඩක් සෙනග හිටියෙ නෑ.හැම ශීට් එකකම ෂටර් එක ගාව සීට් එකේ තමයි හැමෝම වාඩි වෙලා තිබ්බෙ.ටික දුරක් එද්දි කට්ටිය වැඩි වුණත් තාම කවුරුත් තිශේන්‍යා ළග වාඩි වුණේ නෑ.ඒත් මාවනැල්ලට එද්දි ඔෆිස් ඇරලා එනවා කියලා කියන්න පුලුවන් ගෑනුළමයෙක් තිශේන්‍යාට එහාපැත්තෙන් වාඩි වුණා.තිශේන්‍යා ෂටර් එක හෝ ගාලා ඇරලා තිබුණ නිසා ඒ ගෑනු ළමයාගෙ කොණ්ඩෙ හුළගට හැම තැනම යනවා.

"ෂටර් එක වහනවද?"

ඒක තිශේන්‍යාට ඇහුනෙ නෑ.

"හේයි....මේ ෂටර් එක වහනවද?"

තිශේන්‍යාගෙ මූණ ඉස්සරගින් දෙපාරක් අත අරන් ගිහිල්ලා තිශේන්‍යා එයාපොඩ්ස් දෙක ගලවනකල් ඉදලම එයාට වෙන්න ඕනි දේ කිව්වම තමා වෙනම ලෝකෙක හිටිය තිශේන්‍යා මේ ලෝකෙට ඇවිල්ලා ෂටර් එක වැහුවෙ.

"සොරි....ඇහුනෙ නෑ..."

"ඉට්ස් ඕකේ...."

එතනින් එහාට නුවරට එනකල්ම ආපහු තිශේන්‍යා කරේ එයාගෙම ලෝකෙට වෙලා ඔහේ කල්පනා කරපු එක.අඩුම ඒයාවත් දන් නැතුව ඇති එයා කල්පනා කරේ මෙලව තේරුමක් නැති දේවල් කියලා.අන්තිමට මාකට් එක ගාවින් බැස්ස තිශේන්‍යා පුරුද්දට වගේ ඉස්සල්ලම ආවෙ වැව රවුමට.ඒ එද්දි අයිස් කොෆී එකක් එක්ක ඉටලියා එකක් අරන් එන්න එයා අමතක කරේ නෑ.ඔෆිස් ටයිම් නිසා ලොකු නිදහසක් නැති වුණත් වැව දැක්කම නිතර එන අර අමුතු මෙව්වා එක මේ වෙලාවෙ තිශේන්‍යා උපරිමෙන්ම වින්දා.කවදත් එයාගෙ ජීවිතේ එන්න ආසම තැන් වලින් උඩින්ම තිබුණෙ වැව රවුම. එයාගෙ හිතේ තිබ්බ දුක,කේන්තිය හැමදේම නැති කරලා දාන්න මේ වැවට පුලුවන් වුණා.ඉතින් හැමදාම බැව රවුමට එන වාරයක් වාරයක් ගානෙ ගහන ෆොටෝ එකක් ගහගෙන එයා බැලුවෙ ෆොටෝස් කීයක් තිහෙනවද කියලා.හරියටම දෙළහක්.දොළොස් පාරක් එයා මේ බෙන්ච් එකේම ඉදන් ෆොටෝස් ගහලා තියෙනවා.

"ඔයා මෙහෙ?"

හුඩ් එකත් දාගෙන හිටියත් තිශේන්‍යා අඳුරගන්න පුලුවන් වුණ කෙනෙක් ඇවිත් එයාට එහාපත්තෙන් ඉදගත්තා. මේ තමයි එයා.තිශේන්‍යා නුවර එන හැමදාම එයත් එක්ක මේ බෙන්ච් එකේ ඉදන් ඉන්න කෙනා තමා අශිනිට පස්සෙ එයාගෙ ජීවිතේ හොදම යාළුවා කියලා කට ඇරලා කියන්න පුලුවන් අනිත් කෙනා...අවින්දි රාජනායක.එයාට මේඉන්නෙ තිශේන්‍යා කියලා අඳුරගන්න අමාරුවුණේ නෑ.

"දන්නවනෙ ඉතින්..."

"හිතාගන්න පුලුවන්...අශී කිව්වෙවත් නෑ ඔයා එනවා කියලා."

තිශේන්‍යා කරේ ලාවට හිනාවෙන එක.අවින්දි දන්නවා අවුරුදු දහතුනෙන් පස්සෙ ඒ ලස්සන හිනාව තිශේන්‍යාටත් නොදැනිම හොරු අරන් ගිහිල්ලා කියලා.

"එයා එන්ග්ලන්ඩ් ගියා.ෆ්ලයිට් එකේ ඇත්තෙ."

"ඒක තමා...මටත්..."

තිශේනාහා කන්න ගත්ත ඉට්ලියා එකෙන් බාගයකට විදපු අවින්දි තිශේනාහාගෙ මූණ දිහා බැලුවා.

"අවුලෙන් නේද?"

තිශේනාහා නෑ කියන්න ඔලුව වැනුවත් අවුරුදු දාහතක් ළග නොහිටියත් පුලුවන් හැම වෙලාවෙම හොයලා බලපු තිශේනාහා හැරෙද්දි අවින්දිට කියන පුලුවන් තිශේනාහා ඉන්නෙ අවුලෙන් කියලා.

"යමු...."

අවින්දි මේ එයාව ඇදන් යන්නෙ අවින්දිලාගෙ ගෙදර කියලා දන්න තිශේනාහා කට වහන් එයා පස්සෙන් ගියා.මොකද තිශේනාහා මෙහෙ

ඉද්දි හැමදාම නැවතුනේ අවින්දිගෙ ගෙදර. ඒත් අද හොටෙල් එකක් ඉන්නම් කියලා ආවත් අහම්බෙන් අවින්දිව හම්බුණ නිසා එයත් එක්ක යන්න තිශේනාහා අදිමදි කරේ නෑ.

"අම්මියි තාත්තියි ඇමරිකා ගියා.මායි අයියයි විතරයි ඉන්නෙ.එයත් මොකද්ද මන්දා ලොකු කේස් එකකට අත ගහලා.ඉතින් රෑ දවල් නැතුව වැඩ."

අවින්දිගෙ අයියා ආමි එකේ කර්නල් කෙනෙක්.නිකන් නෙවෙයි බුද්ධි අංශෙ.ඒ කොහොම වෙතත් අවින්දි ඉන්නවා කියන්නෙ
පාලුවක් නැතු ඉන්න පුලුවන් කියන එක.අවින්දි එයාගෙ ඩ්‍රයිවර් වාහනේ නවත්තලා තිබුණ බෝගම්බර පාක් එකට ඇවිත් කාර් එකට නගින ගමන් එයාගෙ අයියවත් මතක් කරා.

"මටනම් දැන් එපා වෙලා.එන්න රෑ වුණොත් කාගෙ හරි අතේ කෑම එකක් එවනවා.කොල හැමතැනම...මාර වදයක්.."

අවින්දි කියවන් යද්දි තිශේන්‍යා හිනාවුණා.

"ඒ ඉතින් අයියගෙ ජොබ් එකනෙ..."

තිශේන්‍යා කරේ උත්තර දීලා ෂටර් එකෙන් එළිය බලාගත්ත එක.ඒත් ඊළගට අවින්දි කිව්ව එක ඇහිලා ආපහු එයා අවින්දි දිහා බැලුවා.

"ජොබ් එක කියලා ඔහොම මැරිලා හරියනවද තිශූ...කනවද බොනවද කියලාවත් දන්නෙ නෑ.මාර පිස්සෙක්..."

තිශේන්‍යා දන්නවා අවින්දි එයාගෙ අයියට කොච්චර බැන්නත් එයාට ආදරෙයි කියලා.ඉතින් ඒකමයි මේ කියන ඒවට තිශේන්‍යාට හිනාගියේ.

"හා....හා....හා....ඔයාට හිනා..."

ඒ කිව්ව විදිහට තිශේන්‍යාට බකස් ගාලා හිනාවක් පැන්නා.හැබැයි එයා දන්නෙ නෑ අවින්දි එහෙම කරේ එයාගෙ මූණට හිනාවක් ගේන්න ඕනි නිසා කියලා. දෙන්නා කතා කරකරම අවින්දිගෙ ගෙදරට ආවා. කතා කරා කිව්වට කතා කරේ අවින්දි විතරයි,තිශේන්‍යා කරේ එක්කො ඔළුව වනන එක,නැත්තන් හූම්ටිතියන එක.ගෙදර ඇවිල්ලා අවින්දිගෙ රූම් එකත් එයාගෙ නමට  ලියාගෙන තිශේන්‍යා ඇදුමකුයි ටවල් එකකුයි අරන් බාතෲම් එකට ගියා.

"පැලවෙන්නෙ නැතුව එන්න හොදේ..."

අවින්දි තිශේන්‍යාට යන්න දීලා ෆෝන් එක අතට ගත්තෙ තව පැය බාගෙකටවත් තිශේන්‍යා එළියට එන්නෙ නෑ කියලා දන්න නිසා.හේතු හැම දෙයක්ම දන්න නිසාමයි අවින්දි ඇදෙන් නිදාගත්තෙ.

මේ අතරෙ අශේන් හිටපු ජනාධිපති විරේන් වික්‍රමනායකට කෝල් එකක් ගත්තා.අඳුරණ දෙන්නෙක් අවුරුදු ගාණකට පස්සෙ කතා කරනවා.

"හුග කාලෙකින්නෙ පුතා..."

"ඒකනෙ අංකල්...."

"මොකෝ පුතා හදිස්සියේ?"

"ආපහු අර කේස් එක රී ඕපන් කරන්න කාලෙ හරි."

"ආපහු?"

"ඔවු අංකල්...මට ඒකට අයිතියක් තියෙනවා.ඒ මගේ හොදම යාළුවා..."

"ඕකේ පුතා.මං ඒකගැන බලන්නම්."

"තැන්ක්ස් අංකල්..."

තිශේන්‍යා ගිහිල්ලා විනාඩි හතලිස් පහක් වුණත් තාම ආපු නැති නිසා කලබල වෙච්ච අවින්දි දොරට ගහගෙන ගහගෙන ගියා.

"තුශූ....තිශූ.....තිශූ......"

"ඕ......."

"ඉක්මනට එනවා ඕයි...."

හුස්මක් පාත දාල වෙනසක් නෙපෙනෙන්න අවින්දි ඇදෙන් ඉදගත්තා.තිශේන්‍යා එළියට ආවෙ ශෝට්කට කහපාට හූඩි එකක් ඇදලා. එයාට ඉතින් හූඩි වලින් තොර ලොවක් නෑ.

"සොරි....බය වුණා නේ..."

අවින්දි නෑ කියන්න ඔලුව වැනුවෙ ෆෝන් එකට එයාගෙ සම්පූර්ණ අවදානෙ දීලා.ඒත් තිශේන්‍යා කරේ අවින්දි ගාවින් ඉදගත්ත එක.

"වතුර ඇගට වැටෙද්දි වෙලාව යනවා තේරෙන්නෙ නෑ..."

"ඔවු ඔවු...වතුරෙ ඉදන් කල්පනා කරලා තමා ලෙඩ වුණෙත්...ආය පටන් ගත්තද?"

"ටික කාලයක් නැතුව තිබුණා.ඒත් ළගදි ඉදන් පැය දෙක තුනත් මන් වතුරෙ අවී.."

අවින්දිට දෙන්න උත්තරයක් තිබුණෙ නෑ.මොකද එයාට් ඒක නවත්තන්න බැනෙ.කොච්චර කිව්වත්,කොච්චර ට්‍රීට්මන්ට්ස් කරත් ඒක තාම නවත්තගන්න බැරි

වුණා.මුලින් මුලින් ගනන් ගන්නෙ නැතුව හිටියට ටික දවසක් යද්දි පැය පහ හය එක දිගට වතුරෙ ඉන්න ගත්තා.වතුරෙ ඉන්නවට වඩා බිම ඉදගෙන ඔහේ බලාගත්තු අත බලාගෙන කල්පනා කරනවා.ඊට පස්සෙ තමා ඩොක්ටර් කෙනෙක්ට පෙන්නුවේ. එතකොටයි කිව්වෙ අම්මා තාත්තගෙ ආදරේ නැතුව හැදෙන ළමයෙක් නිසා එයාට තියෙන ප්‍රශ්න වලට එයාම උත්තර හොයන්න හදනවා ඇති කියලා. ඒත් කතා කරලා බැලුවම තමා ඩොක්ටර් කිව්වෙ එයාම හිතෙන් ප්‍රශ්න හදාගෙන එයාම උත්තර හොයනවා කියලා.ඒ කාලෙ එයාට තිබුණ ලොකුම ප්‍රශ්නෙ අශේන්.වෙන තාත්තලා වගේ අශේන් නැති එක එයාට ලොකු ප්‍රශ්නයක් වුණා. තිශේන්‍යා එයා අතින් වෙච්ච වැරදි ගැන කල්පනා කරා,අශේන් ඉස්සරහා හොද ළමයෙක් වෙන්න උත්සහ කරා,හැමදාම පන්තියේ පළවෙනියා වුණා.පහේ පන්තියෙදි ප්‍රිෆෙක්ට් කෙනෙක් වුණා.නවය වසරෙදි මාෆියා ෆීල්ඩ් එකට පය ගැහුවා.එතනිනුත් හැමදාම හොදම කොලිෆිකේෂන්ස් පෙන්නුවා.ඉතින් එයාට තියෙන ස්ට්‍රෙස් එක වැඩි වුණා. ඒ හැම දේම නිසා එයා හැමදාම කල්පනා කරනවා කොයි වෙලාවෙ හරි එයා අතින් වරදක් වුණාද?නැත්තන් ඒ දවසෙ එයා ෆේල් වෙච්ච තැන් තියෙනවද කියලා එයා කල්පනා කරනවා.තැන්.එහෙම කල්පනා කරද්දි එයා හැමවෙලේම බලන්නෙ හැම දේම හොදම විදිහට,නීට් එකට කරන්න. ඒ වගේ දේවල් ගැන කල්පනා කරන්න හිගිල්ලා තමයි පැය ගනන් වතුරෙ ඉන්න පටන් ගත්තෙ.කොහොම නමුත් දැන් පොඩ්ඩක් හරි තිශේන්‍යා රිකවර් වෙලා තියෙන්නෙ යෂ් නිසා. මොකද යශ් එයාට පැහැදිලි කරලා දුන්නා අශේන් කියන්නෙ එයගෙ බාරකාරයා විතරයි කියලා.ඉතින් එයා ඒක තේරුම් ගත්තා.ඒත් දවාලෙ වෙච්ච දේ නිසා එයා දැනුත් බත්රූම් එකට වෙලා කල්පනා කරේ එයා ඒ කරපු වැරැද්ද ගැන.කොහොමත් අම්මයි තාත්තයි නැතුව වෙන කෙනෙක් ආදරේ කරයි කියලා අපිට බලාපොරොත්තු වෙන්න බෑ කියන එක තේරුම් ඇරන් තමයි දැන් තිශේන්‍යා එළියට ආවෙ.

"මාත් ඉක්මනට වොෂ් එකක් දාගෙන එන්නම්."

ඇඳේ ඉදගෙන බැල්කනි එක දිහා බලාගෙන කල්පනා කරන ගමන් හිටිය තිශේන්‍යාගෙ ඔලුවත් අත ගාගෙන අවින්දි බාත්රූම් එකට ගියා.අශිනිටයි යෂ්ටයි ආවා කියලා මැසේජ් එකක් දාලා කෝච්ගෙ වැට් එකට ගියාම දැක්ක මැසේජ් එක නිසා වෙලා තියෙන දේ තේරුම් ගත්ත තිශේන්‍යා බර හුස්මක් පිට කරලා ඇඳේ ඇලවුණා.

Sorry thishenya.Api me para tharage atharala damu.Elaga para man kohomahari try karala play karanna chance ekak aran denna.Sure...Oyata kohomath play karanna amaruyine thishenya.So,api ilaga para balamu.

අවින්දි එළියට ආවම තිශේනායා දිහා බැලුවෙ යන්න කලින් ටිකක් හොදට හිටිය මනුස්සයාට එයා බාත් රූම් එකට ගිහින් එද්දි වෙච්ච

විපර්යාසෙ මොකද්ද කියලා.

"මොකෝ මේ එකපාරටම?"

තිශේනායා ඇස් පියාගෙනම මොකුත් නෑ කියන්න ඔළුව වැනුවා.නැත්තෙ නෑ මොකක්ම හරි අව්ලක් කියලා අවින්දිට නොතේරුණා නෙවේ තේරුණා.ඒත් ඒ ගැන මේ වෙලාවෙ තිශේනායාට කතා කරන්න උවමනාවක් නැති නිසා අවින්දි ආපහු මොකුත්ම අහන්න ගියේ නෑ.ඇදුමත් මාරුකරගෙන ෆෝන් එක අතට ඇරන් තිශේනායා ළගින්ම ඉදගත්තා.

"හරිනේ....අයියා එන්නෙ නැලු...අපි මොනාහරි හදාගමුද?"

අවින්දිගෙ අයියටත් බැන බැන අවින්දි ඒක අහපු විදිහට ලාවට හිනාවුණ තිශේනායා කියන්න ඔලුව වනලා ඇදෙන් නිදාගත්තා.

"මැගී එකක්වත් හදාගමු........වෙන කරන්න දෙයක් නැනේ....මොකෝ උඹ උයන්න දන්නවා කියලා ඇයි?"

ඒකටත් තිශේනායාට ලා හිනාවක් ගියා.මොකද එයාට වගේම අවින්දිටත් උයන්න බෑ.වින්දිට උයන්න පුලුවන් කන්න පුලුවන් විදිහට.ඒත් තිශේනායාට එහෙමවත් බෑ.අතට පයට වැඩකරන්න කට්ටිය හිටියම එහෙම වෙනවා.කොහොමහරි දෙන්නා කිචන් එකට ගිහිල්ලා මැගී දෙකකුත් හදාගෙන ලිවින් රූම් එකේ සෝෆා එකට ආවෙ ටීවී එකත් ඔන් කරන ගමන්.වෙලාව හතයි නිසා නිවුස් වල හෙඩ්ලයින්ස් යන්න පටන් අරන්

තිබුණා.වතුර ටික බොන්න වීදුරුව අතට ගත්ත තිශේන්‍යාගෙ වතුරඑකත් පිට උගුරෙ ගියේ ඇහිච්ච හෙඩ්ලයින් එකක් නිසා.

***යෂිනි එමීෂා වික්‍රමනායක, හිටපු ජනපති දූවනිය මියයෑමට ඇත්තම හේතුව හදිසි රිය අනතුරක්ද?එහෙත් නැතිනම් සැලසුම් කළ ඝාතනයක්ද?***

ඒ හෙඩ් ලයින් එක ඇහිලා ෆෝක් එකෙන් කන්න කටට කරන් හිටපු කට අවින්දි එහෙම්මම නවත්තගෙන තිශේන්‍යා දිහා බැලුවා.තාමත් කහින ගමන් වුණත් ඒ නිවුස් එක දිහා බලන් හිටියෙ ආපු කැස්ස නිසා කඳුළුත් ඇවිල්ලා තියෙද්දි.

***හිටපු ජනපති විරේන් වික්‍රමනායකගේ එකම දූවනිය සහ ඔහුට සිටි එකම දරුවා හදිසියේ මියපරලොව ගියේ 2009/06/12 වන දිනයි.හදිසි අනතුරක් ලෙසින් එම මරණ පරීක්ෂණය වසා දැමුවත් නැවත එම පරීක්ෂනය වාර්තාව විවෘත්ත කර බැලීමේදී එය සැබැවින්ම හදිසි අනතුරක් නොව,එය සැලසුම් කල ඝාතනයක් බවට සැක පල කරනවා.***

***මේ පිළිබඳ පරීක්ෂණය භාරව සිටින බුද්ධිඅංශ කර්නල් රමේෂ් රාජනායක පවසන්නේ මේ පිලිබඳ අදාල ක්‍රියාමාර්ග ඉක්මනින්ම අරගන්නා බවයි...***නිවුස් එක මෙච්චර වෙලා අහන් හිටිය තිශේන්‍යා කෑම පිගාන පැත්තක දාලා සෝෆා එකට හේත්තු වෙලා මේ වෙන දේවල් ගැන කල්පනා කරා.මෙච්චර දවස් කා ඇක්සිඩන්ට් එකකින් නැතිවුණා කියලා හිතාගෙන හිටිය තමන්ගේ අම්මා මරලා කියලා දැනගනිද්දි අශේන් එක්ක තිශේන්‍යාට ආවෙ කේන්තියක්.මෙච්චර දේවල් එයාගෙන් හැංගුවා කියලා දැනෙද්දි තිශේන්‍යාට ආව ආවේගෙට තිශේන්‍යා කෙලින්ම අශේන්ට කෝල් එකක් ගත්තා.

"හෙලෝ..."

"............."

"හෙලෝ...ගත්තනම් ගත්ත හේතුව කියලා තියනවද මගේ කාලෙ නාස්තිකරන්නෙ නැතුව..."

"මගේ අම්මාට මොකද වුණේ?"

"ඕක අහන්න නම් කතා කරේ කරුණාකරලා ෆෝන් එක තියන්න..මොකද මන් කැමති නෑ එකම දේ දෙපාර දෙපාර කියන්න."

"මන් අහන්නෙ මගේ අම්මාට ඇත්තටම මොකද්ද වුණේ කියලා?කවුද මගේ අම්මාව මැරුවෙ?

"..............."

"ඇයි කතා නැත්තෙ? කතා කරන්න...කවුද මගේ අම්මාව මැරුවෙ...?"

"..............."

"අශේන් පලිහක්කාර....මන් තමුන්ට කතාකරන්නේ...මගේ අම්මාට මොකද වුණේ....?"

".............."

"ඇයි ඔයාලා මට මෙහෙම කරන්නෙ?ඇයි මගේ හැඟීම් එක්ක සෙල්ලම් කරන්නෙ?ඔයාලට මාව විහිලුවක්ද?"

"............."

"මන් දන්නවා ඔයාට ඇහෙනවා කියලා,ඔයා අහගෙන ඉන්නෙ කියලත් දන්නවා...ඇයි මෙහෙම කරන්නෙ?ඒකටවත් උත්තර දෙන්න..."

"ගත්ත දේ කිව්වානම් ෆෝන් එක තියන්න..."

"හරි...ඔයා කියන්නෙ නෑ නෙ මන් හොයාගන්නම්..."

"තමුන් මේ දැම්මම කොළඹ එන්න ඕනි..."

"ඒ මොකටද?"

"කිව්ව දේ ඇහුණානෙ...මන් වාහනයක් එවනවා...ඉන්න තැනකින් දැම්මම කොළඹ එන්න..."

"බෑ...."

"මගේ යකා අවුස්සන්න එපා තිශේනායා..."

"ඇවිස්සෙන්න තවත් යකෙක් ඉන්නවද?

"කිව්ව දේ කරනවා..."

"හෙලො....හෙලෝ....හෙලෝ....ෂිට්....."

ෆෝන් එක සෝෆා එකට විසික් කරපු තිශේනායා  තරහෙන් එයාගෙම කොණ්ඩෙ ඇදගත්තා. එයා නොගියොත් එයාව බලෙන් හරි කොළඹට ගෙන්න ගන්න අශේන් දෙපාරක් හිතන්නෙ නෑ.

"රූකඩයක් වෙලා මට දැන් ඇති වෙලා..."

ඒ කෑ ගහපු සද්දෙටයි ඒ වොයිස් එකටයි අවින්දි පවා ගැස්සිලා ගියා..

"පොඩ්ඩක් කාම් වෙන්න තිෂූ..."

තිශේනායා කරේ ඇවිදින එක කොණ්ඩෙ ඇදගන්න ගමන් තිශේනායා කල්පනා කරා ඊළගට මොකද කරන්නෙ කියලා.එයා දන්නෙ නෑ මේ දේවල් සිද්ද වෙලා තියෙන්නෙ කොළඹද නුවරද කියලා.ඒත් අශේන් මේ ගැන දන්නවා කියලා තිශේනායාට හොදටම විශ්වාසයි.නැත්තන් එයාව කොළඹ ගෙන්න ගන්න ඔච්චර දගලන්නෙ නෑ නේ.එයා මෙච්චර කාලයක් ඉදලා තියෙන්නෙ අශේන් මවපු කතාවක් ඇතුලෙ.ඉතින් ඒකට තිශේනායාට හොදටම තරහයි.

"අවී...මේ ගැන කාටවත් කියන්න එපා...මං මේ ගැන හොයාගන්නම්....."

"තිෂූ...."

ඔය නැට්ට පාගන් යන්න හදන්නෙ කොළඹ යන්න කියලා දන්න නිසාම අවින්දිත් එයා එක්කම කාමරේට ආවා.බෑග් එකෙන් ඩෙනිම් එකක් අරන් ඇදන් හිටිය ෂෝට්ටත් ගල්වලා දාලා ඇදගත්තේ කැබ් එකක් දාන්න කියලා අවින්දිට ෆෝන් එක දෙන ගමන්.

"හදිස්සි වෙන්න එපා තිෂූ..."

අවින්දි කැබ් එක දාන ගමන් වුණත් කලබල වෙන්න එපා කියලා කිව්වේ මේ තියන කලබලේටයි තරහාටයි මොනවා කරගනීද කියලා දන්නෙ නැති නිසා…

"මාත් එන්නද?"

කලබලේට මොනා කරගනියිද කියලා හිතාගන්න බැරි නිසාම එයත් එන්නද කියලා ඇහුවත් අවින්දි දන්නවා තිශේන්‍යා එන්න දෙන්නෙ නෑ කියලා.

"බයවෙන්න එපා..අවුරුදු දාහතක් තනියෙන් මාව බලාගත්ත මට මේ වෙලාවෙත් මාව බලා ගන්න පුලුවන්…ඔයා මට මන් කිව්ව උදව්ව කරන්නකො…"

අවින්දි හා කියන්න ඔළුව වැනුවා..විනාඩි පහකින් තිශේන්‍යා ලෑස්ති වෙලා ඉවර වුණා.

"කැබ් එක ආවා."

"මන් යන්නම් අවී…තැන්ක්ස් හැම දේකටම…"

අවින්දිවත් තදට හග් කරලා පහළ ගේට් එකෙන් එළියෙ නවත්තලා තිබ්බ කැබ් එක ළගට ඇවිල්ලා ආපහු අවින්දිටත් අත වනලා කැබ් එකේ පිටිපස්සෙන් නැග්ගා.

"කොහෙටද මැඩම්?"

"කලම්බෝ වලට…"

"ඕකේ මැඩම්..."

වාහනේ කොළඹ පාරට දාද්දි තිශේනායා කල්පනා කරේ මේ ගැන දැනගන්න ගන්නෙ කාටද කියලා.ඒත් එක්කම යෂ්ගෙන් ආව කෝල් එක කට් කරේ අශේන් එක්ක තිබ්බ තරහට.ඒත් එකදිගටම කෝල් පහ හයක් එද්දි කෝල් එක ආන්ස්වර් කරේ නැත්තන් දිගටම ගන්න නිසා අටවෙනි පාර කෝල් එක ආන්ස්වර් කරා.

"කොහෙද ශේන් ඉන්නෙ?"

"අදාල ප්‍රශ්නයක් අහන්න යෂ්..."

"දැන් ඔය නැට්ට පාගගෙන ඉන්නෙ මොකටද?"

"මේ යෂාන්...මගෙන් මොකුත් අහගන්නෙ නැතුව ෆෝන් එක තියනවා.."

"කොළඹ එන ගමන්ද?"

"ඇයි අහන්නෙ?"

"මාස්ටර් එක්ක තියෙන තරහා මගෙන් පිට කරලා හරියනවද තිශේනායා?"

"..............."

"තිශේනායා?"

"මාව අවුල් වෙලා ඉන්නෙ...පස්සෙ ගන්න..."

"දැන් කතා කරන්න ඕනි දේ වල් පස්සෙ කතා කරන්න බැනෙ?"

"සොරී..."

තිශේනායා කෝල් එක කට් කරලා ෆෝන් එක ෂීට් එක උඩට දාලා ඔළුව ෂටර් ඒකේ තියාගත්තා.මේ වෙලාවෙ ඔයාට ඕනි ටිකක් නිදහසේ ඉන්න වුණත් ඊට වඩා මේ ගැන හොයන්න තිශේනායාට උවමනාව තිබ්බා.එහෙම්මම මේ ගැන දැනගන්න කෙනෙක්ව මතක් වෙච්ච නිසා තිශේනායා ඉක්මනට එයාට කෝල් කරා.

"හෙලෝ අංකල් වික්‍රම?"

"කියන්න දුව..."

"අංකල් වැඩකද ඉන්නෙ?"

"වැඩ ගොඩක හිරවෙලා ඉන්නෙ කෙල්ලේ...කමක් නෑ කියන්නකෝ..."

"ඕකේ අංකල් මන් පස්සෙ ගන්නම්..."

"නෑ නෑ...කියන්න...."

"අංකල් නිවුස් දැක්කද?"

"දැක්කා…අනේ මන්දා…අශේන්ම තමා කේස් එක ආපහු ඕපන් කරලා තියෙන්නෙ…"

"මොකක්?"

"ඒකනේ…මටත් දියතලාවෙ ජෙනරල් කෝල් කරලා කිව්වෙ…අඩුම මටවත් කිව්වෙ නැනෙ?"

"අංකල්ට නොකියා එහෙම කේස් එකක් රී ඕපන් කරන්න පුලුවන්ද?"

"අගමැතිගෙ හරි ජනාධිපතිගෙ හරි ඕඩර් එකෙන් පුලුවන්."

"ඉතින් අංකල්ට නොකියා ඇයි ඒක රී ඕපන් කරේ?"

"මාත් මේ ඒක ගැන තමා කෙල්ලෙ කල්පනා කරේ…"

"අංකල්ට ෆ්‍රී වෙලාවක් කියන්නකො…මන් එන්නම් අංකල්ව හම්බ වෙන්න."

"ඒක හොදයි…."

"කොයි වෙලාවටද අංකල් හොද?"

"හෙට උදේ දහයට මගේ ඔෆිස් එකේදි?"

"ශුවර් අංකල්…තැන්ක්ස්…."

ලොකු හුස්මක් පාත දාපු තිශේන්‍යා දැක්කෙ අශේන්ගෙන් ඇවිත් තියෙන මිස්කෝල් පහ දිහා.ඒත් ඒවා කෝල් බැල් නොකරපු තිශේන්‍යා ෆෝන් එක ඕෆ් කරලා දැම්මෙ ටිකක් නිදහසේ ඉන්න.එයාගෙ අම්මාට ඇත්තටම මොකද වුණේ?එයා හිටපු ජනාධිපතිගෙ දුව කියලා එයා නොදන්නෙ කොහොමද? අශේන් මේකට පැටලුනේ කොහොමද? එතකොට එයාගෙ තාත්තා කවුද?දැන් එයා කොහෙද ඉන්නෙ?එයාතාම ජීවත් වෙනවද?කවුද මේ කේස් එක ක්ලෝස් කරන්න කියලා එදා ඕඩර් එකක් දෙන්න ඇත්තෙ?ඇයි අශේන් ආපහු මේ කේස් එක රී ඕපන් කරන්න කියලා තියෙන්නෙ?ඒකත් වික්‍රමවත් නොදැන.

අඳුරන නම්බර් එකකින් අඳුරන කටහඬක්...අශේන්ට තිබ්බ ප්‍රෙෂර් එක තවත් වැඩි වෙන්න එයාට ආපු කෝල් එකක්...

"කියන්න..."

"කොහොමද අශේන්?"

"හොඳයි කියන්නත් බෑ යුගාන්...ඔයාට කොහොමද?"

"ඇයි අශේන් උඹ මට නිදහසේ ඉන්න නොදෙන්නෙ?"

"මන් උඹේ නිදහසට මොකද්ද යුගාන් කරේ?"

"ඇයි උඹ ආපහු මේ කේස් එක ඇදලා ගන්නෙ? උඹට ඕනි තුවාල තවත් පාරගන්නද?"

"තුවාල පාරගන්නවට වඩා මට ඕනි මේක කරේ කවුද කියලා හොයාගන්න.ඒක උඹට ඕනි නැති වුණාට මට ඕනි යුගාන්..."

"උඹ හිතන්නෙ මට ඕනි නෑ කියලද? ඒ වුණාට මට බෑ තුවාල පාරගන්න.මං ඒකයි මේ හැමදේම දාලා ලංකාවෙන් ආවෙ."

"හරි...උඹ ඒ ගැන වද වෙන්න එපා.මන් ඒ ගැන බලාගන්නම්..."

"හ්ම්....ඕක අතෑරලා දාන්න අශේන්..."

"බලමු...උඹ පරිස්සමින් හිටපන්..."

"උඹත්............."

තිශේන්‍යා කරේ ආපු ගමන් කේජේට කෝල් කරපු එක.

"කියන්න පොඩි බොස්..."

"හිටපු ජනාධිපති විරේන් වික්‍රමනායකගෙ ප්‍රයිවට් නම්බර් එක හො   යාගෙන මට දාන්න."

"හදිස්සියේ?"

"කිව්ව දේ කරනවා අයිසේ...."

"ඔකේ...ඕකේ...පොඩි බොස්..."

තිශේන්‍යාට තරහා ගිහිල්ලා කියලා තේරුණ නිසාම කේජේ ආය වචනයක්වත් නොකියා කෝල් එක කට් කරා.ඉතින් ඇවිල්ලා ගමන් මහන්සියට වොෂ් එකකුත් දාගෙන තිෂේන්‍යා ඇදට ආවෙ හෙට දවසෙ ප්ලෑන් එක ඔළුවෙ ඇදගන්න ගමන්...

වෙනදාට වඩා නිදාගන්න පරක්කු වුණ නිසා තිශේන්‍යා ඇහැරුණේ දවල් අටට විතර.ඒ නැගිට්ද්දිත් එයා ඉස්සරහා තිබ්බ බීන් බෑග් එකේ ඉදන් හිටිය කෙනාව දැකලා තිශේන්‍යාගෙ ඇස් දෙක්ත් ලොකු වුණා.

"බය වෙන්න එපා...උඹට තනියෙන් ඔය මගුල කරන්න දෙන්නෙ නෑ තිෂූ...."

ඇවිත් හිටියෙ අවින්දි.තිශේනායා ගෙදරින් එළියට බැහැපු වෙලාවෙ ඉදන් ෆෝන් එක ඕෆ් වෙලා නිසා බයවෙච්ච අවින්දි පාන්දරම කොළඹ ආවෙ අයියටත් කොළඹ යනවා කියලා මැසේජ් එකක් දාලා.

"අංකල් වික්‍රමගෙ ඔෆිස් එකට යන්න ඕනි...යමුද?"

අවින්දි හා කියන්න ඔලුව වැනුවමම තිශේනායා වොෂ් එක්ක් දාගෙන ඇවිල්ලා ඩෙනිමකට නිල්පාට හුඩි එකක් ඇදලා වොච් එකත් බැදගෙන බූට් දෙකත් දාගෙන තිශේනායා අවින්දිත් එක්ක පහළට ආවා.අශේන් ඔෆිස් යන්න ලෑස්ති වෙලා හිටියත් අශේන්ව දැක්කෙ නෑ වගේ රංගනයක යෙදෙන්න හදපු තිශේනායාගෙ අතින් අශේන් අල්ලගත්තා.මේ වෙන දේවල්ගැන ගැන අශේන්ගෙන් අහන්න කියලා හිතුනත් අශේන් එක්ක තිබ්බ තරහා නිසා තිශේනායා ඒ ගැන අශේන්ගෙන් අහන්න ගියේ නෑ.

"කොහෙද යන්නෙ?"

තිශේනායා අශේන් දිහා බලලා අශේන් අල්ලන් ඉන්න එයාගෙ මැණික්කටුව ළගත් බැලුවෙ කින්ඩියට වගේ හිනාවෙන ගමන්.

"ඇයි අහන්නෙ?"

අශේන්ට දෙන්න උත්තරයක් නැති නිසා තිශේනායා අශේන්ගෙ අතත් ගසලා දාලා එළියට යන්න හැදුවා.

"පරිස්සමින්..."

ඒ වචනෙ ඇහෙද්දි යන්න ගියපු එකත් නවත්තලා ආපහු අශේන් පැත්තට හැරුණා.

"ඒක කියන්න ඕනි නෑ...."

ඒක ඇහුනම අශේන්ගෙ මූණ අඳුරු වෙච්ච විදිහ දැක්කෙ යෂ්ම විතරයි.ඉතින් අශේන් ඔෆිස් එකට ගියේ සති ගානකින් එයාගෙ බිස්නස් ගැන බලන්න වෙලාවක් නොතිබ්බ නිසා.මේ වෙච්ච සිද්දිය ගැන අවින්දි ආයෙත් කතා කරන්න ගියේ නෑ.තිශේනායා හිටියෙ තරහින්.එයා මෙච්චර කල් ජීවත් වෙලා තියෙන්නෙ අශේන්ලා මවපු

කතාවක් ඇතුලෙ කියලා දැනෙද්දි තිශේනායාට තවත් කරහා ගියා.ඒ වෙලාවෙ තිශේනායාගෙ ෆෝන් එකට ආපු වික්‍රමගෙ කෝල් එක නිසා එයා හිටිය ලෝකෙන් එළියට ඇවිත් තිශේනායා කෝල් එක ආන්ස්වර් කරා.

"එනවද දුව?"

"එනගමන් අංකල්.."

"ඕකේ දුව,කෙලින්ම ඇතුලට දාන්න කියන්න...."

"ඕකේ අංකල්..."

කාර් එකේ පිටිපස්සෙ හිටිය අවින්දිගෙ උරහිසේ තිශේනායා ඔලුව තියාගත්තම අවින්දි ඒ කොට කොණ්ඩෙ අස්සෙන් ඇඟිලි ගෙනිච්චා.දැනිච්ච සනීපෙට ඉබේටම තිශේනායාගෙ ඇස් වැහෙන්න ගියත් කැම්ප් එක කිට්ටු නිසා එයා පට්ට ගේමක් දීලා ඇස් ඇරන් හිටියා.

"වාහනේ කෙලින්ම ඇතුලට දාන්න..."

ඩ්‍රයිවර්ට වෙන්න ඕනි දේ කියලා තිශේන්‍යා කෙලින් ශීට් එකේ ඉදගත්තා.කාර් එක එක ඔෆිස් එකක් ඉස්සරහින් නැවැත්තුවාම

තිශේන්‍යා වගේම අවින්දිත් එතනින් බැහැලා ඩ්‍රයිවර්ට යන්න කියලා කිව්වා..

"ඒත් බේබි?"

"කිව්ව දේ කරනවා...."

ඩ්‍රයුවර්ටත් සද්දයක් දාලා තිශේන්‍යා අවින්දිවත් එක්කන් ඔෆිස් එක ඇතුලට ගියා.යුධ හමුදාපති හේරත් වික්‍රමබාහු එයාට නියමිත පුටුවෙ ඉදන් හිටියෙ මාර ගැම්මකින්.මේ දෙන්නා ඇතුලට ගියාම ඉස්සරහා තිබ්බ පුටුදෙක පෙන්නුවේ ඉදගන්න කියලා නොකියා කියන ගමන්.

"දැක් කියන්නකො මොකද්ද වෙන්න ඕනි කියලා."

වික්‍රම ඇහුවෙ මේ වෙලාවෙ තිශේන්‍යාට කරන්න පුලුවන් උපරිම උදව්වක් කරනවා කියලා හිතාගෙන.මොකද එයාටත් ඕනිකමක් තිබ්බා මේ කේස් එක ගැන හොයාගන්න.

"මුලින්ම මේ ගැන අශේන් පළිහක්කාර දැනගන්න බෑ...මට ඒ කේස් ෆයිල් එක බලන්න පුලුවන්ද?"

අශේන්ට අශේන් පලිහක්කාර කියලා කතාකරන්නනම් මොකක් හරි දරුණු දෙයක් වෙලා තියෙනවා කියලා වික්‍රමට තේරුණා.ඒනිසාමයි වික්‍රම ඒ ගැන අහන්න ගියේ නැත්තෙ.

"මං ළග කොපි එකක් තිබුණා...."

ඉදන් හිටිය පුටුවෙන් නැගිට්ට වික්‍රම එයාගෙ කබඩ් එකක් අදින ගමන් එක එක ෆයිල් එළියෙන් තිබ්බා.එක එක ක්ලෝස් වෙච්ච ෆයිල් බර ගාණක් මේසෙ උඩින් තිබ්බ වික්‍රමට හරි ෆයිල් එක හොයාගන්න විනාඩි දහයක් වගේ ගියා.

"තිබ්බා..."

මහලොකු වෙලාවක් නොගිහින් අන්තිමට නිල්පාට ෆයිල් එකක දාලා තිබුණ තව නිල්පාට ෆයිල් එකක් වික්‍රම මේසේ උඩින් තිබ්බා.

***යෂිනි එමීෂා වික්‍රමනායක ඝාතනය.***

"ඝාතනයක් කියලා ලියලා තියෙද්දිත් කොහොමද මේ කේස් එක ක්ලෝස් වුණේ?"

වික්‍රම කරේ දන්නෙ නෑ කියන ඔලුව වනපු එක.මොකද ඇත්තටම වික්‍රම මේකාලෙදි හමුදාපති තනතුරට ඇවිල්ලා හිටියෙ නෑ.මොකද මේ කේස් එක සිද්ධ වුණේ අවුරුදු දාහතකට කලින්.

"කවුද මේ කේස් එක බාරව හිටියෙ?"

"නලීන් කියලා සීඅයිඩී එකේ එක්කෙනෙක් බව් දැන් එයා මැරිලා.."

"What?//"

අවින්දිටයි තිශේනායාටයි දෙන්නටම එකට කියවෙද්දි වික්‍රම එකපාරටම ගැස්සිලා ගියා.මොකෝ ලේසි පහසු කටවල් දෙකක් නෙවෙයිනෙ තියෙන්නෙ.

"මොකද්ද අංකල් වුණේ?"

තිෂේනායා අහන්න හදපු ප්‍රශ්නෙ එයාට කලින් ඇහුවෙ අවින්දි.
වික්‍රම කරේදන්නෙ නෑ කියන්න උරහිස අකුලපු එක.එයාට මේ වෙලාවෙ දැනුනෙ ලැජ්ජාවක්.අවුරුදු දාහතේ පොඩි ළමයි දෙන්නෙක් අහන හැම ප්‍රශ්නෙකටම දන්නෙ නෑ කියලා කියන්න වෙච්ච එක ගැන වික්‍රම හිටියෙ තරහෙන්.

"මේක මාර වැඩක්නෙ?කේස් එක ක්ලෝස් කරන්න කිසිම රීසන් එකක් නැතුව ඒක ක්ලෝස් කරලා.ඒක් බාරව හිටපු කෙනා මැරිලා.දැන් ආපහු මේ කේස් එක රී ඕපන් කරන්න කියලා...මොන විකාරයක්ද මේ?"

තිශේනායා හිටියෙ හොදටම තරහා ගිහිල්ලා ඒකයි මේ ඉන්නෙ කොහෙද කියලාවත් බලන්නෙ නැතුව කෑ ගහන්නෙ.ඉන්නෙ ඔෆිස් එකක කියලා තේරිලා තිබ්බ අවින්දි තිශේනායාගෙ උරහිසෙන් අත තිබ්බෙ එයාව සන්සුන් කරන්න හිතාගෙන.

"මේ කේස් එක ඊටපස්සෙ බාරවුණේ මේජර් වීරසිංහට...ඕනෙනම් එයාව මීට් වෙන්න චාන්ස් එකක් හදලා දෙන්න පුළුවන්."

තිශේනායා ඔළුව වැනුවෙ හා කියන්න.මොකද මේ වෙලාවෙ ඒ මනුස්සයාව හම්බවෙන එක ලොකු දෙයක් කියලා තිශේනායාට හිතුණා.

"නලින්ගෙ එඩ්‍රස් එකත් හොයලා දෙන්න පුළුවන්නෙ අංකල්?"

අවින්දි තිශේනායා දිහා බැලුවෙ මැරිච්ච මනුස්සයෙක්ගෙ ගෙදරට ගිහින් මොනා කරන්නද කියලා හිතන ගමන්.මොකද අවින්දිට මේ ගැන කිසිම අදහසක් තිබ්බෙ නෑ.

"මට විනාඩිදහයක් දෙන්න..."

වික්‍රම ෆෝන් එකත් අරගෙන් ඔෆිස් එකෙන් එළියට ගියා.

"මැරිච්ච මනුස්සයෙක්ගෙ ගෙදරට යනවට වඩා අම්මා ගැන ටිකක් හොයලා බැලුවොත් නරකද?"

අවින්දි කියන කතාවත් ඇත්ත.මර්ඩර් එක කරේ කවුද කියලා හොයන්න කලින් එයාගෙ අම්මා ගැන,එහෙමත් නැත්තම් ඝාතනයට ලක්වෙලා ඉන්න කෙනා ගැන හෙව්වනම් හොදයිනේ.

"මන් කේජේට කිව්වා සීයගෙ නම්බර් එක හොයලා දෙන්න කියලා...තාම දැම්මෙ නෑ."

අවින්දි හිතුවට වඩා තිශේන්‍යා ස්පීඩ් වගේම හොද මොළයක් තෙයෙනවා.ඒක නිසාමයි එයා ඊයෙ නිදාගන්න කලින් එයාගෙ සීයගෙ නම්බර් එක හොයලා දෙන්න කියලා කේජේට කිව්වෙ.කොහොමහරි විනාඩි පහක් වගේ යද්දි වික්‍රම ආපහු ඔෆිස් එකට ආවා.

"හරි...මන් ඔයාට එඩ්‍රස් ක ආපු ගමන් දාන්නම්...දැන්ම දියතලාවෙ ගියොත් ඔයාට වීරසිංහව මේට් වෙන්න පුලුවන්..."

තිශේන්‍යා කරේ ඔළුව වනලා අවින්දිත් එක්ක කැම්ප් එකෙන් එළියට ආව එක.ඩ්‍රයිවටත් එන්න කියලා කෝල් එකක් දීලා අවින්දි එක්කම ඩ්‍රයිව එනකල් බලන් හිටියා.

"දියතලාවට...."

කාර් එක ආපු ගමන් ඩ්‍රයිවට කිව්වත් ඩ්‍රයිවට කාර් එක ගන්න අදහසක් තිබුණේ නෑ.

"සොරි බේබි...අශේන් සර් කිව්වා බේබිව කොහෙවත් එක්කන් යන්න එපා කියලා."

තිශේන්‍යාට පොඩි හිනාවක් ගියා.මොකද තිශේන්‍යා දන්නවා අශේන් මේ ගැන මොනාහරි දන්නවා කියලා.ඒකමයි මේ තිශේන්‍යාට කොහෙටවත් යන්න නොදෙන්නෙ කියලා තිශේන්‍යාට තේරුණා.

"එයාට ගිහින් කියන්න එයා කියන කියන පදේට නටන්න මං එයාගෙ කවුරුත් නෙවෙයි කියලා."

තිශේන්‍යා එහෙම්මම අවින්දිවත් ඇදගෙන කාර් එකෙන් බැස්සා.එහෙම්මම කේජේට කෝල් කරපු තිශේන්‍යා එයාගෙ බයික් එක ඇරන් එයාලා ඉන්න තැනට එන්න කිව්වෙ අශේන් එක්ක නැති නොවුණ තරහක් හිත ඇතුලෙ කැකෑරෙද්දි.

"තැන්ක්ස්..."

කියපු විදිහටම කේජේ හෙල්මට් දෙකක් ගෙනල්ලා තිබ්බ නිසා තිශේන්‍යා වගේම අවින්දි කෙලින්ම ගියේ දියතලාවෙ.සීතල දැනුනත් ගනන් නොගත්ත තිශේන්‍යා කෙලින්ම පැය තුනක් විතර යද්දි දියතලාව කෑම්ප් එකට ආවා.එළියෙ හිටිය සෝල්ජර් කෙනෙක්ටත් තමන් ආපු කාරණාව කියලා බයික් එක ඇතුලට දැම්මා.බයික් එක පස්සෙන් දුවන් ආව සෝල්ජර් කෙනෙක් අන්තිමට නැවතුනේ තිශේන්‍යා බයික් එක නවත්තපු තැනමයි.

"නලීන් සර් කිව්වා මැඩම්ලාව එක්කන් එන්න කියලා..."

බයිකෙකෙන් බැහැපු තිශේන්‍යා වගේම අවින්දි ඒ සෝල්ජර්ගෙ පස්සෙන් ගියේ මේජර් වීරසිංහව හම්බ වෙන්න.

"ඇතුලට යන්න මැඩම්...."

සෝල්ජර් තිශේන්‍යාලට ඇතුලට යන්න කියලා ගියාම තිශේන්‍යා අවින්දිවත් එක්කන් ඇතුලට ගියා.

"එන්න එන්න තිශේන්‍යා පලිහක්කාර...."

තිශේන්‍යා වීරසිංහ එක්ක හිනාවෙලා වීරසිංහට ඉස්සරහා තිබ්බ පුටුවෙන් වාඩිවුණා.

"මට වික්‍රම සර් කිව්වා..."

තිශේන්‍යා ඔවු කියන්න ඔළුව වැනුවා.

"ඒ මර්ඩර් එක වුණේ කොහෙද"

තිශේන්‍යා එයාට තිබ්බ ප්‍රශ්න වැලෙන් පළවෙනි ප්‍රශ්නෙ ඇහුවා.

"නාවින්නෙ....එමීෂා මැඩම්ගෙ ප්‍රයිවට් හවුස් එක ළග.විරේන් සර්ව මීට් වෙන්න ගිහිල්ලා එන ගමන් කියල තමයි කියන්නෙ.ට්‍රක් එකකින් තමයි ඇක්සිඩන්ට් කරලා තියෙන්නෙ.දරුවාව බේරගන්න බැරිවුණා."

ඒක ඇහුණ ගමන් තිශේන්‍යා වගේම අවින්දි මූණට මූණ බලාගත්තා.

"ඒ කිව්වෙ?"

තිශේන්‍යාගෙ හිතේ තිබ්බ ප්‍රශ්නෙ ඇහුවෙ අවින්දි.

"එමීෂා මැඩම්ව හොස්පිටල් ඇඩ්මිට් කරාට දරුවව බේරගන්න බැරිවෙලා."

තිශේන්‍යා හිටියෙ මේ කියපු කිසි දෙයක් හිතාගන්න බැරුව.සාධාරණයිනෙ ඉතින්. තමිගෙ අම්මාට ඉපදෙන්න හිටිය දරුවා මැරුණා කිව්වම ඉතින් කම්පියුස් වෙනවානෙ.

"ඕකේ....එතකොට ඒ ට්‍රක් ඩ්‍රයිවර්?"

"අපි තාම මේ කේස් එක ගැන ගැඹුරින් හොයන්න පටන් ගත්තෙ නැහැ.ඒ නිසා තිශේන්‍යා කලබල වෙන්න එපා....අපි ඉක්මනටම මේ ගැන හොයාගන්නම්...රමේෂ් මේ ගැන හොයන්න පටන් අරන් තියෙන්නෙ"

තිශේන්‍යා හා කියන්න ඔළුව වැනුවත් එයාට තේරුණා මෙයාලාට වඩා අඩියක් තිශේන්‍යාලා ඉස්සරහින් ඉන්නෙ කියලා.

"තැන්ක් යූ......අපි ගිහින් එන්නම්...."

තිශේන්‍යා වගේම අවින්දිත් නවීන්ට තැන්ක් කරලා කැම්ප් එකෙන් එළියට ආවා.මේ වෙලාවෙ තමා තිශේන්‍යා දැක්කෙ අශේන්ගෙන් කෝල් එකොළහක් ඇවිත් තියෙනවා කියලා.කෝල් බැක් කරන්න සාධාරණ හේතුවක් නැති නිසා තිශේන්‍යා ෆෝන් එක සාක්කුවට

දාගන්න ගියත් අශේන්ගෙන් ආපු දහතුන් වෙනි කෝල් එක තිශේන්‍යා ආන්ස්වර් කරා.

"කොහෙද අයිසෙ ඉන්නෙ?"

"ඇයි අහන්නේ?"

"කොහෙද ඉන්නෙ?"

"දියතලාවෙ......"

"මේ රෑ දියතලාවෙ මොකද කරන්නෙ?"

"මං හිතන්නෙ ඒක මිස්ටර් අශේන්ට වැඩක් නැහැ."

"දැන් කොළඹ එනවද?"

"ඔවු..."

"පරිස්සමින්...."

"මං ගැන බලාගන්න මට පුළුවන්..."

තිශේන්‍යා කෝල් එක කට් කරලා කෙලින්ම ආවෙ කොළඹට.ගෙදර ඇවිල්ලා අශේන්ටත් රවන්න පුළුවන් උපරිමෙන්ම රවලා තිශේන්‍යා අවින්දිටත් රූම් එකක් දීලා එයත් එයාගෙ රූම් එකට ආවා.ඇවිල්ලා බාත්ටබ් එකට බැහැලා නාගත්තා...පැයක් දෙකක්...තුනක්....ඔවු හරියටම පැය තුන හමාරක් තිශේන්‍යා වතුරෙ.එයාම හරි සිහියට ඇවිල්ලා බාත් ටබ් එකෙන් බහිද්දි මුළු ඇඟම සුදුමැලිවෙලා.ඒ ගැන ගනන් නොගත්ත තිශේන්‍යා එයාට බඩගිනි නැහැ ඔයා කන්න කියලා අවින්දිටත් මැසේජ් එකකුත් දාලා ඇඳට ආවෙ හොඳ නින්දක් ආන්න කියලා වුණත් ආපහු එයාට එයාගෙ කියලා අඳුරගන්න පුලුවන් වුණ සීයාගෙ නම්බරෙක ලැබුණෙ නැති නිසා ආපහු කේජේට කෝල් එකක් දැම්මා.

"කියන්න පොඩිබොස්..."

"නම්බර් එක හම්බුණේ නැද්ද?"

"තාම නැනෙ පොඩිබොස්...හෙට වගේ දාන්න පුලුවන් වෙයි."

"ඉක්මන් කරන්න කේජේ....."

"උපරිම ට්‍රයි එක දෙන්නම් පොඩි බොස්...."

"තැන්ක්ස්...."

කෝල් එකෙන් පස්සෙ තිශේනායාට හොඳටම නින්ද ගියා.නින්දෙන් වගේ තිශේනායාට අශේන්ගෙ වගේම් යෂ්ගෙ කටහඬ ඇහුණා.

"කැවද යෂ්?"

"නෑ මාස්ටර්....බඩගිනි නෑ කියලා අවින්දිට..."

"බඩගිනි නැතිකම නෙවෙයි යෂ්...මුරණ්ඩු කම..."

"ඒකනම් ඇත්ත...ඇග පුරාම මුර්ණ්ඩුකම....."

ටික වෙලාවක් යද්දි දොර වැහෙනවා තිශේන්‍යාට ඇහුණත් එයා හිතුවෙ ඒක හීනයක් කියලා.කොහොමහරි උදේ නැගිටලා තිශේන්‍යා උදේ කාම ගන්න මේසෙට යද්දිත් අශේන් අවින්දි වගේම යුෂුත් ඇවිල්ලා හිටියා.ඉතින් අශේන්ව දැක්ක ගමන් තිශේන්‍යා ආපහු හැරිලා යන්න හැදුවත් ඊට වඩා ඉස්සර වෙච්ච අශේන් එතනින් නැගිටලා ගියේ තිශේන්‍යාට බැල්මක් දෙන ගමන්...

"දැන් මොකද කරන්නෙ?"

අවින්දි ඇහුවෙ අවිශ්වාසෙන් වගේ.

"කේජේ සීයාගෙ නම්බර් එක දානකල් ඉමු...ඊටපස්සෙ බලමු මොකද්ද කරන්නෙ කියලා."

අවින්දි කරේ හා කියන්න ඔළුව වනපු එක.

ටිංංංං

ඒ ආපු මැසේජ් එක කාගෙන්ද ඉයලා නිකමට හිතුන තිශේන්‍යා පොඩ්ඩක් එළියට ගියේ සීයට කෝල් එකක් ගන්න කියලා

හිතාගෙන.මොකද මේ වෙලාවෙ මැසේජ් එකක් දානවානම් දාන්න ඉන්නෙ කේජේ විතරයි.

"හෙලෝ...කවුද මේ?"

"විරේන් වික්‍රමනායකද?"

"ඔවු...මේ කවුද කතාකරන්නෙ?"

"යෂිනි එමීෂා කියන්නෙ ඔයාගෙ දුව නේද?"

"ඔවු ඉතින්?"

"මන් නිවුස් රිපොටර් කෙනෙක්...මට සර්ගෙන් වොයිස් කට් එකක් ගන්න පුලුවන් වෙයිද?"

"මොකටද?"

"පත්තරේට ආටිකල් එකක් ලියන්න."

"සොරී...."

"අනේ සර්...ප්ලීස්...මට විනාඩි දහයක් තිබ්බොත් ඇති..."

"කියන දේ තේරෙනවා නේද?"

"අනේ ප්ලීස් සර්...විනාඩි දහයයි ඕනි.දැන් වුණත් මන් සර් ඉන්න තැනට එන්නම්."

"තව විනාඩි දහයකින් මන් එවන ඔෆිස් එකට එන්න."

"ශුවර් සර්..."

"හ්ම්ම්...."

එයාගෙ සීයට පතාර බොරුවකුත් අතැරලා ඉක්මනට ආපහු මැන්ෂන් එකට දිව්වෙ විනාඩි දහය පරක්කු වුණොත් හම්බ වෙන එකම චාන්ස් එකත් නැති වෙන නිසා.

"වැඩේ හරි ඉක්මනට එන්න....."

යන්නෙ කොහෙද කියලාවත් දන්නෙ නැතුව තිශේන්‍යා අවින්දිවත් ඇදගෙන පාරට ඇවිත් ටැක්සියක් අල්ලගෙන ඉක්මනට එයාගෙ සීයා දැම්ම් එඩ්‍රස් එකට ගියා.වෙන ඕනි දේකට මූණ දෙන්න හිතාගෙන තිශේන්‍යා අවින්දිත් එක්කම විරේන්ගෙ ඔෆිස් එකට ගියා.

"කාව හම්බ වෙන්නද?"

"විරේන් වික්‍රමනායක?"

එතන ඉන්න සෙකට්‍රි කෙනෙක් කියලා හිතන්න පුලුවන් ලේඩි කෙනෙක් තිශේන්‍යාදිහා බලලා ඇයි ආවෙ කියලා ඇහුවෙ මේ දෙන්නා කවුද කියලා හරියටම හිතාගන්න බැරිවුණ නිසා.කොහොම හරි ඒ ලේඩි එක ඔෆිස් එකක් ඇතුලට ගිහිල්ලා ඇවිල්ලා

තිශේන්‍යාලට ඇතුලට යන්න කියලා කිව්වා.තිශේන්‍යා වගේම අවින්දිත් ඇතුලට ගියේ හිතේ පොඩි චකිතයකින්.

"ඉදගන්න...උපරිම විනාඩි දහයයි..."

මේ ඇවිල්ලා ඉන්නෙ එයාට කතා කරපු කෙනා කියලා තේරුම් අරගෙන වුණත් විරේන් කිව්වෙ සැකෙන් වගේ.මොකද මේ දෙන්නා නිවුස් රිපෝටස්ලා වගේ පේන්නෙ නැති නිසා.අවින්දි ඇදලා හිටියෙත් ඩෙනිමට ටීෂට් එකක්නේ.අනික ඒ දෙන්නා මේ ආවෙ පැන් කොළ මොකුත්ම නැතුව.

"තමුන්ලා කවුද?"

මේ දෙන්නා නිවුස් රිපෝටස්ලා නෙවෙයි කියලා තේරුන් ගිය නිසා මේ කවුද කියලා ඇහුවෙ මෙහෙම බොරු කියලා තමන් ලගට එන්න තියෙන උවමනාව මොකද්ද කියලා හිතාගන්න බැරුව.අනික විරේන්ව එහෙම ලේසියෙන් මීට් වෙන්නත් බැනෙ.

"සොරි සර්...මන් මෙතෙන්ට එන්න පොඩි බොරුවක් කිව්වා.ඒත් ඇත්තටම මට ඕනි යෂිනි එමීෂා ගැන දැනගන්න."

විරේන් තිශේන්‍යා දිහා බැලුවෙ මේ මොන විකාරයක්ද කියලා වගේ බැල්මකින්.

"තමුන් මොකටද මගේ දුව ගැන දැනගන්න ඔච්චර උනන්දු?"

තිශේන්‍යා අවින්දි දිහා බැලුවෙ ඇත්ත කියනවද කියලා අහන්න.අවින්දිත් ඇස් වලින් විරේන්ව පෙන්නුවේ ඇත්ත කියන්න කියලා ඇස්වලින් කියන ගමන්.බොරු කියලා තවත් තේරුමක් නෑ කියලා තේරුම් ගත්ත තිශේන්‍යා ඇත්ත කියන්න කලින් ලොකු හුස්මක් ඇරන් හිටියා.

"මං දන්නෙ නෑ සර් සර් මේක විශ්වාස කරයිද කියලා.ඒත් යෂිනි එමීෂා කියන්නෙ මගෙ අම්මා."

ඇත්තටම විරේන් බොන්න ගත්ත වතුර වීදුරුව බිමට වැටිලා කැඩුණා.ආව තිබහට බොන්න ගත්ත වතුර වීදුරුව බිදිලා ගියා.

සලා◦◦◦◦◦◦...

එයා ඒතරමටම හිටියෙ ෂොක් වෙලා.

"ඒක වෙන්න බෑ.ඩොක්ටස්ලා කිව්වානෙ දරුවා නැතිවුණා කියලා...ඔයා..කවුද?ඇයි ඔයා බොරු කියන්නෙ?

"මන් බොරු කිව්වෙ නෑ සර්...මන් කියන්නෙ ඇත්ත.මං දන්න තරමින් මගේ අම්මා තමා එමීෂා කියලා කියන්නෙ..."

විරේන් හිටියෙ මේ මොනවත් තේරුම් ගන්න බැරුව.ඩොක්ටස්ලා පැහැදිලිවම කිව්වා දරුවා නැතිවුණා කියලා. නැතිවුන දරුවා කොහොමද දැන් ජීවත් වෙන්නෙ? ඒක තමයි විරේන්ගෙ ඔළුවට ඉස්සල්ලම ආපු ප්‍රශ්නෙ.

"ඔයා කාගෙ හරි ලොකු බොරුවකට අහුවෙලා තියෙනවා දරුවෝ..."

විරේන් හිනාවෙලා කිව්වත් ඒ කටහඬේ තිබ්බ පුදුමෙ තාම ගිහින් තිබ්බෙ නෑ.අනිත් අතට තිශේන්‍යා හිටියෙ එයා දන්න දේවල් ඇත්තද නැත්තන් බොරුද කියලා තේරුම් ගන්න බැරුව

"ප්ලීස්...මට කියන්න එමීෂා ගැන..."

"එහෙම කරන්න මට සාධාරණ හේතුවක් දෙන්න..."

"ප්ලීස් සර්...එයා මගෙ අම්මා නෙවෙයිනම් මන් මගෙ ඇත්ත අම්මාව හොයාගන්නම්...ප්ලීස්...එයා ගැන මට කියන්න.."

විරේන් කරේ ලොකු හුස්මක් පාත දාපු එක.එයාට තිශේන්‍යාව විශ්වාස කරන්නත් බෑ.නොකරත් බෑ.කිව්වා කියලා වැරැද්දක් වෙන්නෙත් නැති නිසා හිත ඇතුලෙ තියෙන ලොකු තුවාලයක් පාරගන්න විරේන් ලෑස්ති වුණා.

"යෂිනි එමීෂා වික්‍රමනායක.මගෙයි මගෙ වයිෆ්ගෙයි එකම දුව.එයා ඒලෙවල් පාස් වෙලා කැම්පස් ගියා.කැම්පස් එකේ කෙනෙක්ට එයා

කැමැත්තෙන් හිටියා කියලා අපි දැනගත්තා.ඒත් එයා කවුද කියලා හොයාගන්න අපිට අද වෙනකල් බැරිවුණා.කොහොම් වුණත් එයා කිව්ව විදිහට ඒ කොල්ලා කාත් කවුරුත් නැති අනාතයෙක්.අශේන් පළිහක්කාර තමා එයාගෙ හොදම යාළුවා.ඒත් එයා දැනන් හිටියෙත් නෑ ඒ කවුද කියලා.ඒ කාලෙ මන් අගමැති.ඉතින් මංවත් වයිෆ්වත් කැමති වුණේ නෑ අනාතයෙක්ට අපේ දුවව දෙන්න.ඉතින් අපි එයාට කෙනෙක්ව බැලුවා.යුගාන්‍ය අභිනව් කියලා ඒ කැම්පස් එකේම ඒ ෆැකල්ටි එකේම කෙනෙක්.ඉතින් යෂිනිගෙ අකමැත්තෙන්ම අපි යුගාන්‍යට එයාව බන්දලා දුන්නා.ඒත් දෙන්නා ජීවත් වුණේ ගෙවල් දෙකක.යෂිනි එයාගෙ ගෙදර.යුගාන්‍ය එයාගෙ ගෙදර.අපිටවත් යෂිනි ඒ ගෙදරට එන්න දුන්නෙ නෑ අපි එක්ක තියෙන තරහට.ඒත් යුගාන්‍ය හැමදාම වගේ එහෙ ගියා.ඒ කාලෙ යෂ්නි යාළුවෙලා හිටිය කෙනා ලංකාවෙ ගිහින් තිබ්බා.ඒගැන කිව්වෙත් අශේන්මයි.තාම අශේන්වත් එයා කවුද කියලා දන්නෙ නෑ..ඊට මාසෙකට විතර පස්සෙ යෂිනි ප්‍රෙග්නට් වුණා.ඒ කාලෙදි යුගාන්‍යයි යෂ්නියි හිටියෙ එක ගෙදර.ඒත් මාස නවයකට විතර පස්සෙ යෂිනි අපිව බලලා කාර් එක ඩ්‍රයිව් කරන් යද්දි ඇක්සිඩන්ට් එකකින් නැතිවුණා. එතකොට ඒ දරුවට මාස නවයයි.ඩොක්ටස්ලා අපිට කිව්වෙ දරුවා නතිවුණා කියලා.ඒත් යෂිනිට හම්බවෙන්න හිටියෙ ගෑනු දරුවෙක්."

විරේන් කතාව ඉවරකරද්දි එයාගෙ ඇස්වල කඳුරු පිරිලා.මේ එයාට දරාගන්න අමාරුම සීමාවෙ කියලා තේරුණ නිසා අවින්දි කතාව වෙනස් කරන්න හැදුවා.

"මොකද්ද අංකල් හොස්පිට්ල් එක?"

ලංකා...."

"ඕකේ තැන්ක් යූ සර්...අපිට යෂ්නි මැඩම්ගෙ එඩ්‍රස් එක දෙන්න පුලුවන්ද?"

"මන් එවන්නම්...."

"තැන්ක්ස් අංකල්...අපි ගිහින් එන්නම්..."

අවින්දි තිශේන්‍යාවත් ඇදගෙන ඔෆිස් එකෙන් එළියට ආවා.තිශේන්‍යා දැන් ඉන්නෙ ලොකු ප්‍රශ්නෙකට මැදිවෙලා.එයාගෙ අම්මා යෂිනි නෙවෙයි නම් කවුද? එතකොට අශේන් කියන්නෙ කවුද?තිශේන්‍යා කොහොමද මේ ප්‍රශ්න ගොඩ මැද්දට ආවෙ?ඉතින් අවින්දි කරේ තිශේන්‍යාගෙ අතින් අල්ලගත්ත.එක.ඒ අත සීතලවෙලා ගිහිල්ලා.ඊළගට මොකද්ද කරන්නෙ කියලා තිශේන්‍යාට හිතාගන්නවත් බැහැ.

"අපි හොස්පිට්ල් එකට ගිහින් බලමුද?"

"මන් මේ ඇත්තටම කරන්නෙ මහ තේරුමක් නැති වැඩක්ද අවී?"

"දන්නෙ නෑ සුදූ...වෙන දේකට මූණදෙන්න අපි මේ ගැන හොයලා බලමු...දැන් යමු..."

ඉතින් අදත් තිශේන්‍යා අවින්දිව විශ්වාස කරා.දෙන්නම ලංකා හොස්පිට්ල් එකට ඇවිත් අදාල කාරනාවත් කියලා ඒදෙන්නා ඩොක්ටගෙ ඔෆිස් එකට ආවා.මේ වෙලාවෙනම් හොස්පිට්ල් එකේ සෙනග ගොඩක් හිටියා.ඒත් තිශේන්‍යා වගේම අවින්දි කෙලින්ම ආවෙ අදාල ඩොක්ටගෙ ඔෆිස් එකට.

ඒ ඩොක්ට තිශේන්‍යා දිහා බැලුවෙ පිස්සෙක් දිහා බලනවා වගේ.තාම ලොකු වයසක් නෑ කියලා ජේන මේ මනුස්සයාට උපරිම පනහක් ඇති.

"මොකද්ද දැන් මේ ළමයින්ට වෙන්න ඕනි?"

"යෂිනි එමීෂාගෙ දරුවට මොකද වුණේ?"

වැල් වටාරම් නැතුව තිශේන්‍යා කෙලින්ම අදාල කාරණාවට ආවා.ඒත් ඩොක්ටර් තිශේන්‍යා දිහා තාම බලන් ඉන්නෙ විකාරයක් දිහා බලන් ඉන්නවා වගේ.මොකද අවුරුදු දාහතකර පස්සෙනෙ මේ යෂිනි එමීෂා ගැන අහන්නෙ.

"ඒ ගැන මොකටද ඔය ළමයි හොයන්නෙ?"

මේ ඩොක්ට ටිකක් වයසයි ඉතින් කණ්ණාඩිය උඩින් තිශේන්‍යා දිහා බලද්දි තරහා ගියෙ තිශේන්‍යාට නෙවෙයි අවින්දිට.

"අපි පත්තරේට ආටිකල් එකක් ලියනවා.ඩොක්ටර්ගෙ ෆොටෝ එකකුත් දාන්නම්...දැන් ඇහුව ප්‍රශ්නෙට උත්තර දෙනවද?"

ඩොක්ටර් අවින්දි දිහා බැලුවෙ රවලා.ඩොක්ටර්ටත් සැක හිතුනා ඒත් ඒක එයා ගනන් ගත්තෙ නෑ.

"එදා අපිට අම්මාවයි දරුවාවයි දෙන්නම බේරගන්න බැරි වුණා."

"ශුවර්ද ඩොක්ට?"



"ඔය ළමයද ඩොකටර්? එහෙමත් නැත්තම් මමද ඩොක්ටර්?"

අවින්දි ඩොක්ටටර්ට ඇද කරත් ඩොක්ටර් ඒක දැක්කෙ නෑ.මොකද ඩොක්ටර් බලාගෙන හිටියෙ තිශේනායා දිහා.

"ඕකේ...තැන්ක්ස් ඩොක්ටර්...."

තිශේනායා අවින්දිත් එක්ක හොස්පිටල් එකෙන් එළියට ආවා.ඒ කියන්නෙ අශේන් කිව්වෙ බොරුවක්.තිශේනායාගෙ අම්මා යශිනි එමීෂා නෙවෙයි.එතකොට ඇත්තටම එයා අනාතයෙක්.අම්මා තාත්තා කවුද කියලාවත් දන්නෙ නැති අනාතයෙක්.

"අයියා මට නුවර එන්නලු...."

විනාඩියකට විතර කලින් අවින්දිට ආපු කෝල් එක නිසා මූණ නරක් කරගෙන තිශේනායා ළඟට අවින්දි ඇවිත් කිව්වෙ එයාගෙ අයියාගෙන් හොද බැනුමක් අහගත්තා කියලා කියන්නෙ නැතුව.

"ඔයා යන්න...දැන් කොහොමත් මේක හොයලා වැඩක් නෑ...බායි...පරිස්සමින් යන්න..."

අවින්දිට වචනයක්වත් කියන්න නොදී තිෂේනායා පාර දිගේ ඔහේ ඇවිදගෙන ඉයා.අවින්දිත් කැබ් එකක් දාගෙන නුවර එන්න පිටත් වුණා.ඒත් තිශේනායා?එයා ඔහේ පාර දිගේ ඇවිදන් ගියා.යන්නෙ කොහෙද කියලාවත් දන්නෙ නැතුව ඇවිදන් ගියා.එයාගෙ අම්මා තාත්තා ඇත්තටම කවුද?ඒ දෙන්නා ජීවත් වෙනවද කියලා කල්පනා කරකර ඔලුව හැරුණ අතේ ගියා.හවස 4.00 විතර ඉදන් රෑ වෙනකල් එයා ඇවිද්දා.ඉන්නෙ කොහෙද යන්නෙ කොහෙද කියලා නොදැන එයා ඇවිද්දා.අන්තිමට නතරවුණේ බීච් එකේ.හැමදාම එයාගෙ හිත නිවුන තැන.එයාගෙ කකුල් එයාටත් නොදැනිම බීච් එකට ඇවිත්.එයාගෙ හිත නිවලා දාන්න ඕනි නිසා වෙන්න ඇති තිශේනායාව බීච් එකට එක්කන් එන්න ඇත්තෙ.බූට් දෙක ගලවලා දාලා,ඩෙනිම් එකත්

නවාගෙන එයා රැල්ල පැගුවා.පැයක් දෙකක්,තුනක්,එයා බීච් එකට වෙලා කොච්චර වෙලා හිටියද කියලාවත් එයා දන්නෙ නෑ.එයා පැය ගානක් රැල්ල පැගුවා.අන්තිමට බූට් දෙක ගලවපු තැනට ඇවිල්ලා වැල්ලෙ ඉඳගත්තමයි එයා දැක්කෙ යෂ්ගෙන් වගේම අශේන්ගෙන ඇවිත් තියෙන මිස්කෝල්ස් ගොඩ.යෂ්ගෙන් 24 යි, අශේන්ගෙන් 34 යි.ආපහු කෝල් බැක් නොකරම් ටැක්සි එකක තිශේන්‍යා මැන්ෂන් එකට ආවා.ඒ එද්දිත් යෂ් වගේම අශේන් එක්ක ගාඩ්ලා හෙන ගොඩක් මැන්ෂන් එක ඉස්සරහා වගේම පස් හය දෙනෙක් මැන්ෂ එක ඇතුලෙත් හිටියා.ඒ හැමෝම තිෂේන්‍යා දිහා බලලා සැනසුම් සුසුම් හෙලනවා තිශේන්‍යා දැක්කා.ඒත් ඒ ඇයි කියලා එයාට හිතාගන්න බැරි වුණා.මැන්ෂන් එකට ඇතුල් වෙද්දිම අශේන් ඇවිත් තිශේන්‍යාට ගහපු කම්මුල් පාරෙ සැර කොච්චරද කිව්වොත් තිශේන්‍යා විසික් වෙලා ගිහිල්ලා ළග හිටිය ගාඩ් කෙනෙක්ගෙ ඇගට වැටුණා.එහෙම්මම තිශේන්‍යා ළගට ආව අශේන් තිශේන්‍යා ඇඳන් ගිටියහුඩි එකෙන් අල්ලගෙන එයාගෙ මූණට සමාන්තරව අරන් ආවා.

"කෝල් එකක් ගත්තම ආන්ස්වර් නොකර ඉන්න තරම් තමුන් මුරණ්ඩුයිද?"

පන නැතුව හිටිය තිශේන්‍යාට අශේන් එක්ක රණ්ඩු කරගන්න ඕනි වුණත් මේ වෙලාවෙ ඒක කරන්න එයාට පනක් තිබ්බෙ නෑ.

"මන් දැක්කෙ නෑ....බීච් එකේ හිටියෙ....ඔලුව පැලෙන්න වගේ රිදෙනවා...අතාරින්න පුලුවන්ද?"

තිශේන්‍යා එක්ක මොනතරම් කේන්තියෙන් හිටියත් ඒ වචන වලට පුලුවන් වුණා අශේන්ගෙ තරහා හෝදලා යවන්න.කවදාවත්

අමාරුවක් කියලා නැති ළමයා ඔළුව පැලෙන්න වගේ රිදෙනවා කියද්දි අශේන්ගෙ වගේම යෂ්ගෙත් හිත් වලට මහ ගිල්ටි ෆීලින් එකක් දැනුනා.

"ඉන්නෙ කොහෙද කියලාවත් දන්නෙ නැතුවුණාම,කෝල්ස් ආන්ස්වර් කරේ නැති වුණාම බය වුණා."

ඒක තිශේන්ට ඇහුණා කියලා කියන්න බෑ.මොකද ඒ වෙද්දිත් තිනා එතනින් ගිහින් ඉවරයි..ඉතින් යෂ්ට එන්න කියාගෙන අශේන් එයාගෙ ඔෆිස් රූම් එකට ආවා.

"යුගාන් මොකද කියන්නෙ?"

යෂ් ඇහුවෙ එතන තිබ්බ නිහැඩියාව බිදල දාන්න ඕනි නිසා.මොකද අශේන්ට ඒකට උවමනාවක් තිබුණේ නෑ.අශේන් හිටියෙ වෙනම ලෝකෙක කල්පනා කරන ගමන්.

"මට දැන් ඌ ගැනත් සැකයි."

"ඇයි මාස්ටර්?..."

ඒක විශ්වාස කරන්න යෂ් කැමති වුණේ නැහැ.මොකද එයා යුගාන්ව විශ්වාස කරා.ඔව්...යෂ් යුගාන්ව විශ්වාස කරා.

"ඌ කැමති නෑ මේ කේස් එක රී ඕපන් කරාට."

යෂ් අහනවද නැද්ද කියලා දෙපාරක් තුන්පාරක් හිතලා අශේන්ගෙන් එක ප්‍රශ්නයක් අහන්න තීරණේකරා.

"මාස්ටර් ඇයි ඇත්තටම එයාව හදාගන්න ගත්තෙ?මන් අහන්නෙ යුගාන් එයාව ළමනිවාසෙ දාලා ගියාට පස්සෙ ඇයි මාස්ටර් එයාව මාස්ටර් ළගට ගත්තෙ?"

අශේන් හිනාවුණේ ඒකට හේතුව මතක් වෙලා.හිනාවෙන්න තරම් ඒක සුන්දර හේතුවක් වුණා.

"දන්නවද අශේන් එමී මගෙන් අන්තිමට කතා කරලා ඉල්ලුවේ මං නැති දවසක යුගාන් කවදාහරි දරුවව යුගාන්ගෙන් ඈත් කරොත් මට දරුවව මං ළගට ගන්න කියලා.ඉතින් මගේ හොදම යාළුවාගෙ අන්තිම කැමැත්ත විදිහට මන් එයාව මං ළගට ගත්තා."

යෂ් එතනින් එහාට මොකුත් අහන්න ගියේ නෑ.අශේන් එතනින් එළියට ගිහින් තිශේනායාගෙ කාමරේට ගියේ කෑම එකකුත් අරගෙන.මොක්ද අශේන්ට නිකමට හිතුනා එයා කාලා එන්න නැතුව ඇති කියලා.ඉතින් තිශේනායා නාන සද්දෙ ඇහෙන නිසා ඇදෙන් ඉදගත්ත අශේන්ට නොදැනිම නින්ද ගියා.ඒත් ටික වෙලාවක් යද්දි අශේන් ගැස්සිලා ඇහැරුනේ හීනයක් දැකලා.ඊටපස්සෙ තමා අශේන් බැලුවෙ වෙලාව කීයද කියලා.පාන්දර තුනයි.එයා මෙතනට ආවෙ දොළහට තාම එයාට වතුරවැටෙන සද්දෙ ඇහෙන නිසා හොදටම බයවෙච්ච අශේන් ඉක්මනට දොර ළගට ගියා..

"තිශේනායා.....තිශේනායා .......තිශේනායා ....මේ දොර අරින්න.....මාව ඇහෙනවද....තිශේනායා....."

"ඉන්න....."

එහාපත්තෙන් තිශේනායාගෙ කටහඩ ඇහුනමයි අශේන් ඉහළට ගත්ත හුස්ම පහළට දැම්මෙ.පැය තුනක් වතුරෙ හිටපු නිසාද කොහෙද ඒ ඇගම සුදුමැලි වෙලා.අත් රැලි වැටිලා.රෝසපාට හුඩි එකකට ජීන්ස් එකක් ඇදන් එළියට ආපු තිශේනායා අශේන්ව දැකලා පුදුම වුණා.මොකද එයා හිතුවෙ කතා කරේ යෂ් කියලා.කොහොම හරි කෑම එක ටිකක් නිමිලා තිබ්බත් අශේන් අත හෝදන් ඇවිල්ලා තිශේනායාව ඇදෙන් ඉන්දවගෙන කවන්න ගද්දි තිශේනායා හිටියෙ ඇස් දෙකත් කටේ දාගෙන.මොකද එයාට අශේන්ගෙ මේ වෙනස් වීම ගැන හිතාගන්න බැරි වුණා.

"කට අරින්න...."

අශේන්ගේ එක වචනෙට තිශේනායා කට ඇරියෙ ඒ බත් කටක් හරි පරිස්සමට අශේන් තිශේනායාගෙ කටින් තියද්දි.මේ වෙලාවෙ තිශේනායා හිතුවෙ ඇත්තටම එයාගෙ අම්මා ගැන අශේන්ගෙන්

අහනවද කියල.ඕනි දෙයක් වෙන්න කියලා හිතාගෙන තිශේනායා අශේන්ගෙ ඇස් දිහා බැලුවා.

"ඇත්තටම මගේ අම්මා කවුද?"

අශේන් මොකක් හරි ප්‍රශ්නයක් බලාපොරොත්තු වුණත් මේ ප්‍රශ්නෙනන් ජීවිතේට බලාපොරොත්තු වුණේ නෑ.

"ඒකිව්වෙ?

ප්‍රශ්නෙ තමන්ට තේරුණේ නැද්ද නැත්තන් තමන් තේරුම් ගත්තෙ වැරදියටද කියලා හිතාගන්න බැරුව අශේන් ඒ කිව්වෙ කියලා ඇහුවම තිශේනායා ඔලුවෙ අත ගහගත්තා.

"ඇත්තටම මගේ අම්මා කවුද?"

අශේන් බැලුවෙ මේ මොන ලෝකෙකින් බැහැපු ජීවියෙක්ද කියලා.මොකද අශේන් දවාලෙ තිශේනායා දැනගත්ත දේවල් දන්නෙ නැනෙ.

"යෂිනි එමීෂා වික්‍රමනායක"

අශේන් තුන්වෙනි බත් කටත් තිශේනායාගෙ කටට ලංකරා.

"එතකොට එයාට ලැබෙන්න හිටිය දැරුවා මැරුණා කියන කතාව?"

තිශේනායා බත් කට හපන ගමන් අහද්දි අශේන්ට පොඩි හිනාවකුත් ගියානෙ,මේ මනසින් පොඩි එකාගෙ කතා විලාසෙට.

"ඒක යුගානාගෙ වැඩක්.ඔයාට අනතුරක් නොවෙන්න ඔයා මැරුණා කියලා ලෝකෙට කියලා ඔයාව හදාගන්න මට දුන්නා."

කිසිම ගානක් නැතුව ඒක හේන් කියලා දාපු විදිහට තිශේනාාට පුදුම හිතුනා.

"යුගානා ඔයාට මාව බාරදීලා ගියානම් ඇයි ඔයා මාව ළමා නිවාසෙකින් හදාගන්න ගත්තෙ?"

තිශේනාා මේ කතා කරන්නෙ හැමදේම දැනගෙන කියලා තේරුණ අශේන් තිශේනාාට කවන එක දිගටම කරන් ගියේ එයාට මෙතනින් යාගන්න ලේසි වෙන්න.

"ඇයි කතා නැත්තෙ?"

අශේන් කතා කරේ නැති වුණත් තිශේනාා කන එක නැවැත්තුවෙත් නෑ අශේන් කවන එක නැවැත්තුවෙත් නෑ.දෙන්නා දෙන්නාගෙ රාජකාරි කරන් ගියත් අශේන් නෙවෙයි ඒ ප්‍රශ්නෙට උත්තර දුන්නෙ.

"තව ටික කාලයක් ඉවසන්න...හැමදේටම උත්තර ලැබෙයි."

අශේන් අන්තිමට තිශේනාාගෙ ඔළුවත් අතගාලා එතනින් එළියට ආවා.තිශේනාා ලයිට් එකත් ඕෆ් කරලා ඇදට ඇවිත් නිදාගන්න හැදුවත් වික්‍රමගෙන් ආපු කෝල් එක නිසා එයාගෙ නින්දට බාදා වුණා.මොකද එයාට මේ වෙලාවෙ ඕනි වුණේ හොද නින්දක්.

"දුව...."

"කියන්න අංකල්..."

"අර ලොරි ඩ්‍රයිවර්ගෙ කට උත්තරයක් ගත්තා..එයා කියනවා එකවුන්ට් එකට සල්ලි දාලා එමීෂාව මරන්න කිව්වලු.ඊට පස්සෙ තමා ඇක්සිඩන්ට් එක කරලා තියෙන්නෙ"

"ඒ මනුස්සයාට කතා කරපු නම්බර් එක ගැන මොකද අංකල්?"

"වැඩක් නෑ දුව..ඒකෙ අයිතිකාරයා මැරිලා අකවුරුදු ගානක්...ඒ සිම් එක උස්සපු එකක්."

"හොයා ගන්න කිසිම ක්‍රමයක් නැද්ද අංකල්?"

"අනේ මන්දා දුව...දැන් ඒ ඩ්‍රයිවර්ත් ඇප අරන් ඉන්නෙ.ආය එයාව ඇරස්ට් කරලත් වැඩක් නෑ..."

"අනේ මන්දා අංකල්...පුලුවන් දෙයක් කරන්නකො...."

"ඛන් බලන්නම් දුව...ඇයි දුව එහෙම කියන්නෙ?"

"අනේ මන්දා අංකල්...මං මේ කරන්නෙ මටම රිද්දගන්නවා වගේ වැඩක්ද කියලා..."

"එහෙම කියන්න එපා.ඔයාගෙ අම්මාට සාධාරණයක් හරි ඉෂ්ට කරන්න පුලුවන්නෙ මේකෙන්..."

"ඒක තාමයි මං මෙච්චර දවස් හරි මේක ගැන බැලුවෙ...ඒත් අංකල්ලා මෙතනින් පස්සෙ ඒ ගැන බලන්නකො..."

"ඒක කරන්න පුලුවන් දුව...රමේෂුත් දුව වගේම ඒ හෝඩුවාවල් පස්සෙන්මයි යන්නෙ...අනික රමේෂ් නලින් ගෙ ගෙදර ගිහිල්ලා.එයාගෙ වයිෆ් කියලා තියෙන්නෙ කිසිම දෙයක් දන්නෙ නැහැ කියලා.එයාගෙ දුවටත් වෙච්ච කිසි දෙයක් මතක නැල්ලු."

"අනේ මන්දා අංකල්...මට තේරෙන්නෙ නෑ...කොහෙට ගියත් අපි ආපහු එන්නෙ කලින් තැනටමයි....නිකන් පිස්සු වගේ."

"හරි හරි.....අපි මේ ගැන බලාගන්නම්....

"ඒක නෙවෙයි අංකල්...යුගාන්‍ය අභිනව් කියන කෙනා ගැනත් හොයලා බලන්න..."

"ඔයා ඔයාගෙ තාත්තවම සැක කරනවද?"

"අංකල් දැනන් හිටියා නේද?"

"ඒක දැන් වැඩක් නෑනේ....ඔවුද නැද්ද?"

"ටිකක් සැකයි.එයා අම්මාව මැරි කරලා තියෙන්නෙ කමැත්තෙන් නෙවෙයිනෙ..."

"බලමුකො...මන් බලලා කියන්නම්..."

"තැන්ක්ස් අංකල්..."

තිශේන්‍යා කෝල් එක කට් කරලා ඇස් පියාගත්ත ගමන්ම එයාට නින්ද ගියා.මොකද මේ වෙලාවෙ එයාට ඕනි වෙලා තිබ්බෙ හොද නින්දක්.ඉතින් එයාගෙ වටේ තියෙන හැම ප්‍රශ්නයක්ම අමතක කරලා දාලා තිශේන්‍යා හොද නින්දක් දැම්මා.

තිශේන්‍යා හිටියෙ අශේන්ගෙ ඔෆිස් එකේ,එයාට අදාල සීර්ඕගෙ රූම් එකේ.මේ සිද්දි නිසා මගැරිච්ච බිස්නස් වැඩ ටිකක් පොඩ්ඩක් සෙට්ල් කරලා දාන්න කියලා හිතාගෙන තිශේන්‍යා අද ඔෆිස් ආවෙ අශේන්ගෙ තද විරුද්දත්වය මැද.මොකද හදිස්සියේම උණ හැදිලා හොද හොද නාඩගම් ටිකක් නටලා එකපාරටම උණ හොදවුණ ගමන් ඔෆිස් එන එමට අශේන් කැමති වුණේ නෑ.ඒත් ඉතින් තිශේන්‍යා ආවා.ඇරෙස්ට් කරපු ට්‍රක් ඩ්‍රයිවගෙනුත් වැඩක් නොවෙද්දි මැරිච්ච නලින් ඒකනායකගෙ ගෙදර ගියත් වික්‍රම කිව්වා වගේම එයාගෙ වයිෆ් මොකුත්ම නොකියා තිශේන්‍යාව එලවගත්තෙ මේ හැමදේම විසදන්න තිබ්බ එකම සාක්ෂියත් නැති කරලා දාලා.ඉතින් වික්‍රමගෙ අය මේ කේස් එක ගැන හොයන ගමන් හිටියත් ඒකෙනුත් කිසිම වැඩක් වෙන්නෙ නෑ කියලා තේරුණ නිසා තිශේන්‍යා හිටියෙ මේ කේස් එක ගැන බලාපොරොත්තු අතැරලා දාලා.අසේන් මේ ගැන මොනාද හිතන්නෙ කියලා ඇහුවත් අශේන් එහෙම සැක කෙනෙක් ගැනවත්,වෙන දෙයක් ගැනවත් කියන්නෙ නෑ.

"මැඩම්...ගර්ල් කෙනෙක් මැඩම්ව මීට් වෙන්න ඇවිත්..."

සෙකට්‍රි ඇවිත් කියද්දි තිශේන්‍යා බැලුවෙ මේ වෙලාවෙ එයාව මීට් වෙන්න එන්නෙ කවුද කියලා.මොකද අද දවසෙ දාගත්ත මීටින් එකකුත් නැනෙ.

"එන්න කියන්නකො බලන්න..."

සෙකට්‍රි ගිහින් විනාඩි දෙකක් වගේ යද්දි සාමාන්‍ය ගවුමකට ස්ලිපස් දෙකක් දාලා හිටිය වාම් ගැනු ළමයෙක් ඇවිත් තිශේන්‍යාගෙ ඉස්සරහා තිබ්බ පුටුවෙන් වාඩි වුණා.

"මේ....?"

මේ ඇවිල්ලා ඉන්න කෙනා කවුද කියලා දැනගන්න උවමනාවක් තිශේන්‍යාට ඇතිවෙලා තිබ්බා.

"මන් නලින් ඒකනායකගෙ දුව,රශිනි ඒකනායක.මගේ තාත්තා තමයි මිස්ගෙ අම්මාගෙ මර්ඩර් කේස් එක බාරව හිටියෙ… "

අන්න එතකොට නම් තිශේන්‍යා එයා කරකව කරකව හිටිය පෑන බිම දැම්මා.දැම්මා නෙවෙයි වැටුණා.

"කියාගෙන යන්න රෂිනි…"

මේ ගැන දැනගන්න තිශේන්‍යාට තිබුණෙ ලොකු උනන්දුවක් කියලා තේරුණ රශිනිත් දිගටම එයාගෙ කතාව කියාගෙන යන්න පටන් ගත්තා.

"මීට අවුරුදු දහයකට කලින් මගේ තාත්තව මගේ ඇස් ඉස්සරහම මරලා දැම්මා.ඒ ගැන කාටහරි කිව්වොත් අම්මාවත් මරනවා කියලා මට තර්ජනේ කරා.බයට මං මෙච්චර කල් ඒක කිව්වෙ නෑ.ඒත් මට මගේ තාත්තගෙ මරණෙට සාධාරණයක් ඉෂ්ට වෙන්න ඕනි."

තිශේන්‍යා හිටියෙ මේ දැන් පුටුවෙන් උඩ පැනලා කෑගහන්න තිබුණ උවමනාව පුලුවන් තරම් පාලනේ කරගෙන.ඉතින් තිශේන්‍යා කරේ මෙච්චර වෙලා බල බල හිටිය ෆයිල් එක පැත්තකට දාලා රෂිනි දිහා බලපු එක.මොකද එයා හීනෙන්වත් හිතුවෙ නෑ මෙහෙම දෙයක් වෙයි කියලා.

"ඒ එක්කෙනෙක්ගෙ හරි මූණ මතකද?"

ටිඇහුවෙ සැකෙ වගේ.මොකද එයාට විශ්වාසයක් තිබුණෙ නෑ මීට අවුරුදු දහයකට කලින් වෙච්ච සිද්ධියක් රශිනිට පැහැදිලිවම මතක තියෙයි කියලා.

"මිස් හිතනවද මගේ තාත්තගෙ මිණීමරුවන්ගෙ මූණ මට කවදාවත් අමතක වෙයි කියලා?"

තිශේනායා කරේ කට කොනට හිනාවෙන එක.එයාගෙ ලොකුම ලොකු බලාපොරොත්තුවක් තිබ්බා මේපාර හැමදේම ලිහාගන්න පුලුවන් වෙයි කියලා.

"එන්නකො යන්න...."

තිශේනායා රශිනිවත් එක්කන් ඔෆිස් එකෙන් එළියට ආවා.

"ඉතුරු ෆයිල් ටික ඔක්කොම අංකල් අශේන්ට දාන්න...."

එහෙම්මම සෙකට්‍රිටත් වෙන්න ඕනි එක කියලා තිශේනායා කෝල් එකක් හත්තෙ වික්‍රමට.

"හෙලෝ අංකල්...අපිට පොටක් පෑදුනා..."

"මොකද්ද?"

"ආටිස්ට් කෙනෙක් හොයාගන්නකො...මන් අංකල්ගෙ ඔෆිස් එකට එන්න යන්නෙ..."

"ආ....හරි හරි...පරිස්සමින් එන්න..."

"හරි..."

*නවවෙනි පරිච්ඡේදය*

තිශේන්‍යා කෝල් එක කට්කරලා ෆෝන් එක සාක්කුවට දාගත්තෙ ඇදන් හිටිය ෂර්ට් එකේ අත් වැලමිට ළගට නවන ගමන්.

"ඔයාට ප්‍රශ්නයක් වෙන්නෙ නෑ…බය වෙන්න එපා…"

ඒක තිශේන්‍යා ස්ථිර කරේ රශිනිට කරදරයක් නොවෙන්න ගාඩ් එකක් වුණත් එයාට දෙන්න පුලුවන් කියන විශ්වාසෙ නිසා.

"ඒකට කමක් නෑ…දැන් මොනා වුණත් එකයි…"

රශිනිත් තිශේන්‍යා එක්ක හිනාවුනෙ ලොකු බලාපොරොත්තුවක් එක්ක.

"අක්කා මොනාද කරන්නෙ?"

ඒ ප්‍රශ්නෙ නම් තිශේන්‍යා ඇහුවෙ කාර් එකට නැගලා වාහනේ පාරට දාන ගමන්.

"මං කැම්පස්…මෙඩිකල් ෆැකල්ටි….නංගියෙ වයස කීයද ?"

මේ දෙන්නා මේ සතුටු සාමීචියේ යෙදෙන්නෙ වික්‍රමගෙ ඔෆිස් එකට යන අතරමගනෙ.

"තාමනම් දාහනමයයි..බය වෙන්න එපා ටෙම්පරි ලයිසන් එකක් තියෙනවා…"

තිශේනායාට තේරුණා ඊළඟට අහන්නයන්නෙ ලයිසන් තියෙනවද කියලා කියලා.ඉතින් එයා ඒකට ඊට කලින්ම උත්තරදුන්නා.අශේන්ගෙන් ආපු කෝල් එක ආන්ස්වර් කරපු තිශේනායා ස්පීකර් දැම්මා.

"ඔක්කොම ෆයිල්ස් ටික මටදීලා ගියාම හරියනවද අයිසෙ?"

"සොරි....පොඩි වැඩක් තියෙනවා....ඒක ඉවර කරගෙන ඇවිල්ලා ඔයටික කම්ප්ලීට් කරලා දෙන්නම්.."

"ඒපාර මොකද්ද තමුන් කරන්න යන්නෙ?"

"ඇවිල්ලා කියන්නම්...සමහරවිට මේක අදම ඉවරයක් කරගන්න පුලුවන් වෙයි...."

"මොකක් හරි මගුලක් කරගෙන වරෙන්කො....මන් ඇහැක්වත් ඇරලා බලන්නෙ නෑ..."

"ඇහැක් ඇරලා බලන්නඑපා අනේ ඇස් දෙකම ඇරලා බලන්නකො...."

"මන් කිව්වා කියලා හිතාගන්නවා තිශේනායා...."

මෙච්චර කල් අශේන් එක්ක හරියට වචනයක්වත් කතා කරපු නැති තිශේනායා දැන් අශේන් එක්ක විහිලු එහෙමත් කරනවා.පැහැදිලි වෙනසක්.හේතුව තමාතේරුම් ගැනීම.අශේන් තිශේනායාව තේරුම් ගද්දි තිශේනායා අශේන්ව තේරුම් ගත්තා.දවස් පහක් විතර යද්දි ඉස්සර හිටියට වඩා හොදට අශේන් එක්ක තිශේනායා කතාබහ කරලා හිටියා.අශේන් එයාගෙ හොදම යාළුවා එමීෂා ගැන හැමදේම
වගේ තිශේනායාට කිව්වා.ඒත් යුගාන් ගැන අශේන් කතා කරේ අඩුවෙන්.අඩුවෙන් කියන්නෙ කතා කරේම නැති තරම්.

"මේකද තැන?"

රශිනි ඇහුවෙ තිශේන්‍යා දිහා සැකෙන් වගේ බලන ගමන්.මොකද මේ රශිනි කැම්ප් එකක් ඇතුලට යන පළවෙනි වතාව.තිශේන්‍යා කරේ ඔවු කියන්න ඔලුව වනපු එක.එයාලා මේ වෙද්දි හිටියෙ වික්‍රමගෙ ඔෆිස් එක ඉස්සරහා.ඉතින් තිශේන්‍යාව අනුගමනය කරලා රශිනිත් කාර් එකෙන් බැහැලා තිශේන්‍යා පස්සෙන් ගියා.

"ආටිස්ට් ආවද අංකල්?"

වික්‍රම පුරුදු විදිහටම ඉදගෙන ඉද්දි රශිනිටත් ඉදගන්න කියලා තිශේන්‍යාත් ඉදගත්තා.

"එනගමන්...තව ටිකකින් මෙතන ඉදියි..."

වික්‍රම බල බල හිටිය ෆයිල් එකට ආපහු අවදානෙ දුන්නා.

"අංකල්ගෙ ටීම් එකෙන් මොකුත් අප්ඩේට්ස් නැද්ද අංකල්..?"

"නෑ දුව...එයාලා ඒක කරන්නෙ කරනවා කියලා පේන්න විතරයි.ඇත්තටම ඕක ගැන හොයන්න එයාලට උවමනාවක් නෑ."

තිශේන්‍යා කරේ අතින් නලල මිරිකගත්ත එක.ඒත් එක්කම සාමාන්‍ය ඩෙනිම් එකකට ටීෂර් එකක් ඇදලා ලොකු බඩු බෑග්දෙකකුත් එක්ක ලේඩි කෙනෙක් ඔෆිස් එක ඇතුලට ආවම වික්‍රම එයාට ඉදගන්න කිව්වෙ තිශේන්‍යාගෙ එහාපැත්තෙ පුටුවෙන්.

"තිශේන්‍යා?"

වික්‍රමට වඩා මේ ගැන දන්න තිශේනායාටම ඒ ලේඩිත් එක්ක කතා කරන්න බාරදීපු වික්‍රම බලන් හිටියෙ තිශේනායා දිහා.වෙනදට හිනාපොදක් නැති මූණෙ මේ දවස් ටිකේ සාමාන්‍ය හිනාවක් තිබුණා.වික්‍රමට තේරුණා අශේන් එක්ක සාමදානෙන් ඉන්නවා ඇති කියලා.ඉතින් ඇත්තටම වික්‍රමට සතුටු හිතුණා.මොකද යුග්ම නැතත් දැන් තිශේනායා අශේන් එක්ක හරි සතුටින් ඉන්නවනේ...

"මෙයා ඔයාට හැඩ රුව කියයි...ඔයාට තියෙන්නෙ ඒවිදිහට අදින්න...පුලුවන්නෙ?"

ආටිස්ට් කරේ ඔවු කියන්න ඔළුව වනපු එක.

"පුලුවන් මැඩම්..."

"රශිනී...."

රශිනි එක්ක ආටිස්ට් එහා පැත්තෙ රූම් එකට ගියා.ඉතින් මේ තිශේනායාගෙ වෙනසට හේතුව එයා උපකල්පනය කරපු එකමද කියලා වික්‍රමට දැනගන්න ඕනි වුණා.

"කෙල්ල මේ දවස් ටිකේ වෙනස් වෙලා?"

තිශේනායා වික්‍රම දිහා බැලුවෙ ඒලියන් කෙනෙක් දිහා බලනවා වගේ.

"ඒ කිව්වෙ?"

වික්‍රම ඔලුවෙ අත ගහගත්තෙ මේ වගේ මෝඩයෙක් කියලා කියන ගමන්.ඇත්ත ටිකක් මෝඩයි තමයි.ඒත් අවතක්සේරු කරන්න හොද නෑ.

"ඉස්සර හිනා පොදක්වත් නැති මූණෙ දැන් පොඩි හිනාවක් එහෙම තියෙනවා නේද?"

ඒකට තිශේනායා කරේ ලාවට හිනාවෙන එක.තාම වික්‍රමවත් එයාගෙ සම්පූර්ණ හිනාව දැකලා නැහැ.සමහර විට ඒ හිනාව කවුරුත්ම තාම දැකලා නැතුව ඇති.හැබැයි සමහරවිට.

"ඒකට හේතුව අහන්න ඕනි ඔයාගෙ යාළුවාගෙන්..."

වික්‍රම තිශේනායා දිහා බැලුවෙ මේ මොන හරුපයක්ද කියලා අහන්න වගේ.

"ඒ කිව්වෙ?තේරුණේ නෑ..."

තිශේනායා හරිබරි ගැහිලා වාඩි වුණේ දිග පැහැදිලි කිරීමක් කරන්න වෙන්න ඇති කියලා වික්‍රමට හිතුණා.

"ඔයාගෙයාළුවත් වෙනස් වෙලා,මමත් වෙනස් වෙලා...ඒක තමා හේතුව"

දිග පැහැදිලි කිරීමක් බලාපොරොත්තු වෙච්ච වික්‍රමගෙ බලාපොරොත්තු බිදිලා සුනු විසුනු වෙලා ගියා..ඇත්ත මෙච්චර කල් අශේන් හිටියෙ එයාට ඕනි විදිහට,තිශේනායා හිටියෙ එයාට ඕනි විදිහට.අශේන්ට තිශේනායා එක්ක කතාබහ කරලා ඉන්න ඕනිකම තිබ්බත් අශේන්ගෙ ජොබ් එක වගේම ඒ ෆීල්ඩ් එක ඒකට හරස් කැපුවා.අශේන්ගෙ වීක් පොයින්ට් එක තිශේනායා කියලා කට්ටිය දැනගත්තොත් ඒක තිශේනායාට ලොකු අවදානමක් වෙනවා.අන්න ඒකමයි අශේන් තිශේනායා එක්ක බිස්නස් වලදි විතරක් එකට වැඩ කරේ.ඒක මෙච්චර කල් තිශේනායා තේරුම් ගත්තෙ නැති එක තමයි මේ දෙන්නා අතර තිබ්බ ලොකුම ප්‍රශ්නෙ.ඒත් දැන් තිශේනායා ඒක තේරුම් ගත්තා.ඉතින් දැන් වෙන්න තියෙන දේවල් වගේම අවදානමත් අමතක කරලා දාලා අශේන් තිශේනායා එක්ක ටිකක් කතා කරන්න එහෙම පටන් ගත්තා.

"කෝල්...."

වෙන කල්පනාවක හිටිය තිශේන්‍යා මේ ලෝකෙට ආවෙ වික්‍රමගෙ කටහඬට.ඉතින් කෝල් එක ඩොක්ටර්ගෙන් කියලා දැක්ක නිසා තිශේන්‍යා ෆෝන් එකත් ඇරන් එළියට ආවා.

"කියන්න අංකල්..."

"රිපෝට් එක ආවා දුව..."

"මොකද්ද තත්වෙ අංකල්...."

"කලබල වෙන්නෙ නැතුව මගේ ඔෆිස් එකට එන්නකෝ... තත්වෙ ටිකක් බරපතලයි..."

"හරි අංකල් මන් එන්නම්..."

"ඕකේ...."

තිශේන්‍යා ඩොක්ටර්ත් එක්කත් කතා කරලා ආපහු වික්‍රමගෙ ඔෆිස් එක ඇතුලට ආවා.ඒ ආවෙ මූණටිකක් අවුල්කරගෙන.

"අර වැඩේට කොච්චර වෙලාවක් යයිද අංකල්?"

වික්‍රම තිශේන්‍යා දිහා බැලුවේ එකපාරටම මොකද්ද වුණේ වගේ ලුක් එකකින්.

"තව පැයකීපයක් යයි...ඇයි?"

තිශේනායා මේ වෙලාවෙ ක්ෂනිකව කල්පනා කරේ බොරුවක්.ඇත්ත හංගන්න ඕනි නිසා කියන්න හොද බොරුවක්.

"අවින්දිගෙ රිපෝට් එකක් ඇවිල්ලා...ඒක ගන්න ගිහින් එන්නම්..."

වික්‍රමට එක වචනයක්වත් කියන්න නොදී තිශේනායා අවින්දිවත් පාවලාදීලා එතනින් චුත වුණා.

රශිනිගෙ උදව් එක්ක වික්‍රමට පුලුවන් වුණා නලීන්ගෙ මිණීමරුවන්ව හොයාගන්න.මේ වෙද්දිත් හැම ආමි කෑම්ප් එකකටම වගේම පොලිස් ස්ථානයකටම එයාලගෙ ෆොටෝස් යවලා තියෙනවා.ඒත් පැය දෙකක් ගිහිල්ලත් තිශේනායා ආපු නැති නිසා වික්‍රම කෝල් දෙක තුනක්ම ගත්තත් ඒ එකක්වත් තිශේනායා ආන්ස්වර් කරේ නෑ.ඉතින් ටිකක් විතර කලබල වෙච්ච වික්‍රම අශේන්ට කෝල් එකක් ගත්තා.

"කියන්න වික්‍රම..."

"අශ්....ශේන් ඉන්නවද?"

"නෑ...මොකද්ද මන්දා හොයාගන්න පුලුවන් කියලා ගියා..."

"දැන් පැය දෙකකට දෙක හමාරකට විතර කලින් හොස්පිටල් එකට ගිහින් එන්නම් කියලා ගියා...තාම ආවෙ නැනෙ?"

"හොස්පිටල්?"

"ඔවු...ආ....ආවා ආවා....."

"හරි මන් පස්සෙ ගන්නම්..."

පුටුවෙන් ඉදගත්තට වඩාපුටුවට වැටුණා කිව්වොත් ගොඩක්ම හරි.

"කොහෙද මනුස්සයෝ ගිහින් හිටියෙ?"

"අර දොස්තරයගෙ උපදෙස් ටික අහන් ඉදලා මහන්සියි අප්පා...ඉන්න දෙන්නකෝ...."

තිශේන්‍යා එහෙම කියලා තිශේන්‍යා මේසෙන් ඔළුව තියාගත්තම එතන වැරැද්දක් තියෙනවා කියලා තේරුණත් එයා ඒ ගැන වැඩිය හිතන්න ගියේ නෑ.කොහොමහරි දැන් මේ තුන්දෙනාට සිද්ද වෙලා තියෙන්නෙ එයාලා යවපු අය ගැන මොකක්ම හරි තොරතුරක් එනකල් බලන් ඉන්න.ඉතින් වික්‍රම තිශේන්‍යාට එහෙම ඉන්න ඇරලා එයාගෙ වැඩකරගෙන ගියා.

මේ අතරෙ අශේන් හිටියෙ එයාගෙ ඔෆිස් එකේ.ඒ වෙලාවෙ තමයි යෂ් කලබලෙන් අශේන් හිටිය ඔෆිස් රූම් එකට ආවෙ.ආවට වඩා කඩාගෙන පාත්වුණා කියලා කිව්වොත් හරි.

"මොකද යෂ් මේ?"

අශේන් හිනාවෙලා ඇහුවත් යෂ්ගෙ කලබලේ හැටියට මොකක්ම හරි වෙන්න හොඳනැති දෙයක් වෙලා තියෙනවා කියලා අශේන්ට තේරෙන්න වැඩි වෙලාවක් ගියේ නෑ.මොකද ලේසියෙන් කලබල වෙන්නෙ නැති යෂ් මේ වෙලාවෙ හිටියෙ දුවපු වේගෙටද කොහෙද හතිදාන ගමන්.

"යුගාන්....යුගාන්..."

ඇස් දෙකත් රෝල් කරගත්ත අශේන් යෂ්ට රැව්වෙ,යුගාන්ගෙ නම කියනවා ඇරෙන්න වෙන එක වචනයක්වත් යෂ් කිව්වෙ නැති නිසා.

"කියන දෙයක් පැහැදිලිව කියනවා යෂ්..."

"යුගාන් ලංකාවට ඇවිත්....සර්ව හම්බ වෙන්න ඕනිලු..."

අශේන් ඉදන් හිටිය තැනින් නැගිට්ටා..නැගිට්ටා නෙවෙයි නැගිට්ටුණා.මෙච්චර කල් ආපහු ලංකාවට එන්න එපා කියලා ප්‍රාර්ථනා කරපු කෙනා අද එයාව හම්බ වෙන්න ඇවිල්ලාලු ඉතින් පුදුම නොවී තියෙයිද?

"හායි අශේන්....තවත් ලස්සන වෙලාදත් මන්දා?"

යෂ් එතනින් යන්න කලින්ම යුගාන් කියන කෙනා අශේන්ගෙ ඔෆිස් එක ඇතුලට ආවා.ඒ ගානට තිබුණ ඇග,දිග ඇහිපිහාටු,සනකම් ඇහිබැම,මේ තමයි යුගාන්‍ය අභිනව්...

"එන්න යුගාන්....ඉදගන්න..."

හිනාවක් එක්ක කිව්වත් ඒ හිනාව බොරු හිනාවක් කියලා බලන ඕනි කෙනෙක්ට තේරෙනවා.ඒ වගේමයි යුගාන්ගෙ මූණෙ තිබ්බ හිනාවත්.ඒකත් ලොකු මවා පෑමක්..

"මන් එන්නම් මාස්ටර්..."

යෂ් එතනින් ගියේ එතන තවත් රැදෙන්නෙ නැති එක ඇගට ගුණ නිසා.

මේ අතරෙ බාගෙට නින්ද ගිහිල්ලා හිටිය අභිංසක තිශේන්‍යා ගැස්සිලා ඇහැරුණේ වික්‍රමගෙ ෆෝන් එක රින්ග් වෙච්ච නිසා.

"ඔවු......"

"සර් අර එවපු පින්තූරෙ ඉන්න හතර දෙනාගෙන් එක්කෙනෙක් දැන් ඇරෙස්ට් එකේ ඉන්නවා සර්..."

"කොහෙද කොල්ලො?"

"මිරිහානෙ පොලිස් ඔෆිස් එකේ..."

"මේ කවුද කතා කරන්නෙ?"

"මන් මිරිහානෙ ඩීඅයිජී...."

"හරි කොල්ලො අපි මේ දැන් ටීම් එකක් එක්ක එනවා...."

"ඕකේ සර්...."

වික්‍රම තිශේන්‍යා දිහා බැලුවෙ පට්ටම සතුටෙන්...ඔවු එයාලාගෙ හැම ප්‍රශ්නෙකටම උත්තර තව ටිකකින් ලැබෙන්නයි යන්නෙ...

"රමේෂ්ට කෝල් කරලා පණිවිඩේ කියන්න තිශේන්‍යා...යමු..."

වික්‍රම තිශේන්‍යාවත් ඇදගෙන කෙලින්ම එන්න ලෑස්ති වුණේ මිරිහානට.

"හෙලෝ අංකල් රමේෂ්...."

"කියන්න ශේන්...මොකක් හරි ප්‍රශ්නයක්ද?"

"නෑ අංකල්...පොටක් පෑදුනා...මිරිහාන පොලිස් ස්ටේෂන් එකට එන්නකො...."

"ටිම් එකක් එක්කනෙ?"

"ඕ....."

"අපිට විනාඩි පහක් දෙන්න..."

"ශුවර් අංකල්...."

වික්‍රම විනාඩි පහළවක් විතර යද්දි මිරිහාන පොලිස් ස්ටේශන් එකට ආවා.ඒ එද්දිත් රමේෂ් අදාල මනුස්සයාගෙන් ප්‍රශ්න කිරීම් පටන් ඇරන් තිබුණා.මිරිහානෙ ඩීඅයිජී රමේශ්ට විස්තරේ කිව්ව නිසා රමේෂ් ඉක්මනටම එයාගෙ රාජකාරිය ඉෂ්ට කරා.

"කියනවා අයිසේ...."

අදාල මිනිහා පොලිස් කූඩුවේ අයිනක ඉදන් ඉද්දි රමේෂ් ඊට ඉස්සරහා හිටගෙන මනුස්සයාගෙන් ප්‍රශන අහන ගමන් හිටියා.

"කවුද නලින් ඒකනායකව මරන්න ඕඩරෙක දුන්නෙ?"

කීවෙනි වතාවටදෝ රමේෂ් අහපු ප්‍රශ්නෙට ඒ මනුස්සයා දුන්නෙ එකම උත්තරේ.

"මං දන්නෙ නෑ..."

"යෂ්නි එමීෂාව මරපු එකටත් තමුන් සම්බන්ධයි නේද?"

"නෑ...මන් දන්නෙ නෑ..."

රමේෂ් ඒ මනුස්සයාට ලං වුණේ ටිකක් බය කරලා හරි ඇත්ත දැනගන්න.

"තමුන් කියන්නෙ බොරු...ඒක තමුන්ගෙ මූණෙන් පේනවා...ඒ නිසා ඇත්ත කියනවා..."

රමේෂ් අහන හැම ප්‍රශ්නයක් නිසාම හරහා ගිහිල්ලා හිටිය ඒ මනුස්සයා තමන්ට බේරුමක් නෑ කියලා තේරුම් ඇරන්ද කොහෙද ලොකු හුස්මක්පාත දැම්මා.

"ඔවු..නලින් ඒකනායකව මැරුවෙ මම...යෂිනි එමීෂාවත් මරන්න ට්‍රක් ඩ්‍රයිවට ඕඩර් එක දුන්නෙ මම....

තරහා ගිහින් හිටිය රමේෂ්ට වඩා ඉස්සර වුණේ තිශේන්‍යා ඒ මනුස්සයාව ඇදලා අරන් ගහගෙන ගහගෙන ගියේ මේ මනුස්සයා පන්චින් බෑග් එකක් කියලා හිතාගෙන.මොකද තිශේන්‍යා හිටියෙ ලොකු ප්‍රෙෂරෙකක.ඉතින් එයා ඒ ප්‍රෙෂර් එක මේ මනුස්සයාගෙන් පිට කරා..

"ශේන්....ඕක නවත්තන්න...."

වික්‍රම තිශේන්‍යාව ඒ මනුස්සයාගෙන් ඇදලා ගන්නකල් තිශේන්‍යා ඒ මනුස්සයාට ගැහුවා.

"කවුද තමුන්ට ඕඩර් එක දුන්නෙ?....ආ....කියනවා අයිසේ....කවුද තමුන්ට ඕඩර් එක දුන්නෙ?"

මේ අතරෙ යුගාන් වගේම අශේන් හිටියෙ සුහද නොවන සුහද සාකච්ඡාවක.

"ඉතින්...මොකද මේ හදිස්සියේම ලංකාවට ආවෙ?"

අශේන් කොෆී එකක් ගේන්න කියලා පණිවිඩෙත් යවන ගමන් යුගාන්ගෙන් ඇහුවෙ ඒ හිනාව නැතිකරගන්නෙ නැතුව.

"මං ලංකාවට එන්නම් අශේන්ගෙන් අවසර ගන්න ඕනි නැනෙ?"

එක්තරා විදිහක අනතුරු ඇඟවීමක් මිස්‍ර වෙච්ච කටහඬකින් යුගාන් අශේන් එක්ක කතා කරත් අශේන් නම් කිසිම කලබලයක් නැතුව එයාගෙ මේසෙ උඩ තිබුණ පෑනක් කරකවන ගමන් හිටියා.

"එහෙම එකක් නෑ...."

"මට තිශේන්‍යාව බලන්න ඕනි....කවුද දන්නෙ මගේ දරුවා කියලා වෙන එකෙක්ව හදාගන්න ඇරන්ද කියලා?"

ඒකටනම් අශේන්ටමල පැන්නා.තමන්ගෙම දරුවව ළමා නිවාසෙක දාලා ගියා මදිවට තව කියවන්නත් එද්දි අශේන්ගෙ අතින් ඒ පෑන දෙකට කැඩිලා ගියා.ඒ අතරෙ යෂ් ඉක්මනට තිශේන්‍යාට කෝල් එකක් ගත්තෙ එයාට මේ වෙලාවෙ වෙන කරන්න දෙයක් නැති නිසා.එයා කියලා මොනා කරන්නද?මේ දෙන්නාගෙ මැදට පැනලා යෂ්ටත් එක්කම ගුටි ක්න්න සිද්ධ වුණොත්?

"හෙලෝ?"

"කියන්න යෂ්?"

"කොහෙද ඉන්නෙ?"

"පොඩි වැඩකට මිරිහානට ආවා..."

"එයා ආවා..."

"කවුද?"

"යුගානා...."

"මොකක්?ලංකාවට ඇවිල්ලා තියෙන්නෙ කවද්ද?"

"අද....ආපු ගමන්...මාස්ටර්ව හම්බ වෙන්න ඇවිල්ලා.."

"දැන් ඔෆිස් එකේද?"

"ඔවු..."

"එයාව ඔතනම තියාගන්න...මන් තව විනාඩි දහයකින් එනවා.."

"ඔයා මොනාද කරන්න හදන්නෙ?"

"මගේ අම්මාට යුක්තිය ඉෂ්ට කරන්න."

"මොනාද මේ කියන්නෙ?"

"අපි ඇත්තම මිණී මරුවව හොයාගත්තා…අශේන් පලිහක්කාරටත් කොහෙවත් යන්න දෙන්න එපා...."

"මාස්ටර් මොනාද කරේ?"

ඕනිද?"

"මන් හිතන දේ නෙවෙයිනෙ?"

"මාත් හිතනවා ඔයා හිතනදේ වෙන්න එපා කියලා…"

"දැන් මොකද කරන්නෙ?"

"කිව්ව දේ කරන්නකො…අපි එන ගමන්...."

"අපි කියන්නෙ?"

"අංකල් වික්‍රමගෙ ටීම් එකක් එක්ක මමත් එනවා…"

"හරි...."

යෂ් ආපහු කෝල් එක් කට් කරලා ඔෆිස් එක ළග දොර ගාව හිටියා..එයාට ඇහෙනවා ඇතුලෙ ඒ දෙන්නා කතා කරන

සද්දෙ.යෂ්ට තිබ්බ ප්‍රශ්නෙ ඇයි තිශේනායා අශේන්ව තියාගන්න කිව්වෙ කියලා.

"තමුන්ට කිසිම හැගීමක් නැද්ද මිනිහෝ?"

අශේන් තරහෙන් කැගහද්දි යුගාන් කරේ ලාවට හිනාවෙන එක.දැන් අශේන් ගිහියෙ හිටගෙන එයාගෙම මේසෙට බරවෙලා.

"මන් කිව්වා මේ කේස් එක ඇදලා අරගෙන රිද්ද ගන්න එපා කියලා...ඒ දරුවගෙ තාත්තා මන් නෙවෙයි...."

යුගානා හයියෙන් කැහගද්ද එළියෙ හිටිය යෂ්ගෙ අතේ තිබ්බ ෆෝන් එක පවා බිම වැටුණා.ඒ ඇහිච්ච දේ ඇත්තද?මොකද්ද මේ වෙන්නෙ කියලා හිතාගන්න බැරුව යෂ් ගල් ගැනුණා.

"ඔවු මිනිහෝ...මන් දන්නවා..."

අශේන් කැගහගෙන යුගාන්ගෙ පැත්තට පැන්නෙයි,තිශේනායා එතනට ඇවිල්ලා ඉක්මනට දොර ඇරන් ඔෆිස් එක ඇතුලට ගියෙයි,ආමි එකේ කට්ටිය එළියෙන් නැවතුනෙයි එකම

වෙලාවෙ.වෙන්නෙ මොකද්ද කියලා හිතාගන්න බැරිවුණ අශේන් වගේම යුගාන් ෆුල් කම්ෆියුස් වෙලා තිශේනායා දිහා බලන් හිටියා..

"මන් තිශේනායා දිනර්ව් පලිහක්කාර...."

තිශේන්‍යා යුගාන් දිහාට අත දික්කරාම තාම කම්පියුස් වෙලා හිටියත් යුගාන් තිශේන්‍යාට අතට අත දුන්නා.අශේන් යුගාන්ගෙ පත්තට එන්නෙ නැතුව හිටිය තැනම නැවතුනේ මේ වෙන්නෙ මොකද්ද කියලා මොළේට තේරුම් කරලා දෙන ගමන්.

"මම-"

"-යුගාන්‍ය අභිනව් වීරසිංහ,යශිනි එමීෂා වික්‍රමනායකගෙ **හස්බන්** වගේම ***මිණීමරුවා***...."

තිශේන්‍යා කියද්දිම අශේන් තිශේන්‍යා දිහා බැලුවෙ පුදුම වෙලා.අශේන් විතරක් නෙවෙයි මේ වෙලාවෙ යෂ් යුගාන් පවා හිටියෙ පුදුම වෙලා.

"අංකල් රමේෂ්...."

තිශේන්‍යා රමේෂ්ට කතා කරාම ආමි එකේ කැප්ටන් කෙනෙක් ඇවිත් යුගාන්ව එක්කන් ගියේ යුගාන් කෑගගහා එතනින් පැනලා යන්න ට්‍රයි කරද්දි.ඒත් ඊට වඩා පවර්ෆුල් වෙච්ච ආමි එක යුගාන්ව අරන් ගියේ ඉදිරි ප්‍රශ්න කිරීම් වලට.ඔවු ඒක තමා අන්තිමට තිශේන්‍යාගෙන් ගුටිකාපු ඒ මනුස්සයා කිව්වෙ.

**"යුගාන්‍ය අභිනව්...යෂිනි එමීෂාගෙ හස්බන්...එයා තමයි මේකට ඕඩර් එක දුන්නෙ..."**

"තිශේන්‍යා?"

"අපි පස්සෙ කතා කරමු..."

එච්චරයි එයා කිව්වෙ.යන්නෙ කොහෙදවත් නොකියා තිශේන්‍යා එතනින් යන්න ගියා.එයාට ඇහුණා යුගාන් කියන්නෙ එයාගෙ තාත්තා නෙවෙයි කිව්ව එක.එතකොට එයාගෙ තාත්තා කවුද?අශේන් ඒ ගැන දන්නවා නම් ඇයි කියන්නෙ නැත්තෙ?

ඇත්තටම එමීෂාව මැරුවෙ යුගාන්‍යමයිකියලා තිශේන්‍යාට මුලඉදන්ම පොඩි සැකයක් තිබුණා.ඒක එළිවුණේ රශිනිගෙ උදව්වෙන් ඇදගත්ත එක ෆොටෝ එකක හිටිය කෙනෙක් මේ වෙද්දිත් වෙපන් සීන් එක්කට ඇරෙස්ට් එකේ හිටිය නිසා.ඒ මනුස්සයාට දෙකක් අනිද්දිම හැම ඇත්තක්ම එයා එළියට දැම්මා.ඒ කාලෙ එමීෂාගෙ හස්බන්ම  තමා එයාව මරන්න කියලා ඕඩර් එක

දීලා තියෙන්නෙ වගේම,එයාම තමා නලින්වත් මරලා දාන්න ඕඩර් එක දුන්නෙ කියලා එයා කිව්වා.ඉතින් ඒ සාක්ෂියට අනුව යුගාන්ව ඇරෙස්ට් කරා.

මේ වෙලාවෙ තිශේන්‍යා හිටියෙ ඔලුව ගිනි ඇරන්.අම්මා මැරිලා,තාත්තා කවුද කියලා දන්නෙ නෑ,එයා දැන් තනිවෙලා නේද කියන ප්‍රශ්නෙ එයාගෙන්ම අහගන්නතරම් එයා අතේ තියෙන අන්තිම ඉත්තත් ඉස්සරහට අදින්න හිත හදාගත්ත තිශේන්‍යා කරේ විරේන් එයාට කලින් දවසක දාලා තිබුණ එඩ්‍රස් එකට ගිහින් බලපු එක.මොකද මෙච්චරවෙලා එයාට ඒක අමතක වෙලා තිබ්බෙ.ඔවු එයා ගියා එයාගෙ අම්මාගෙ ප්‍රයිවට් හවුස් එකට.

*දහවන පරිච්චේදය*

අශේන් හිටියෙ වික්‍රමගෙ ඔෆිස් එකේ.මේ වෙද්දිත් එයා කරපු හැම වැරැද්දක්ම යුගාන් පිලිගත්තා.ඒ වගේම එමීෂාගෙ ෆැක්ට්‍රි එකත් බලෙන්ම එයාගෙ නමට ලියාගත්තා කියලා යුගාන් පිලිගත්තා.මොකද එයා තේරුම් ගත්තා දැන් බොරු කරලා වැඩක් නහැ කියලා.ඉතින් අශේන් මේ වෙද්දි හිටියෙ හරිම සතුටෙන්.

"සතුටුද?"

වික්‍රම ඇහුවෙ යුගාන්ව පොලීසියට බාරදීලා ඉතිරි වැඩටික පොලීසියටම බාරදීලා ඇවිලා එයාගෙ ඉස්සරහා ඉදන් ඉන්න අශේන්ගෙන්.

"සතුටු නැද්ද වික්‍රම?"

වික්‍රම කරේ හිනාවෙච්ච එක.එයා දැකලා තිබ්බෙ නෑ අශේන් මෙහෙම සැහැල්ලුවෙන් ඉන්නවා.මොකද එයාගෙ හිතේ හැමදාම වැඩකරේ මේ කේස් එක විසදන්න ඕනි කියන එක විතරයි.ඒකට හරි වෙලාවක් එනකල් අශේන් හිටියෙ ඇගිලි ගනන් කර කර.ඉතින්

හරිවෙලාව ආපු ගමන් අශේන් කරේ කේස් එක ඕපන් කරන්න කියලා ඕඩර් එක දීපු එක.

"තිශේන්‍ය හිටියෙ නැත්තන් මේක හරියන්නෙ නෑ...අපේ උනුත් මේක කරේ කරන්න ඕනාවටනෙ..."

අශේන් ඔවු කියන්න ඔලුව වනද්දි එයාට යෂ්ගෙන් කෝල් එකක් ආවා.

"කියන්න යෂ්?"

"මාස්ටර්...තිශේනායා ගෙදර ආවා..."

"කොහෙද යෂ් ගිහින් තියෙන්නෙ?"

"අශිනිලාගෙ ගෙදර ගිහින්..."

"ඉතින් ඕක කියලා යන්න බැරිවුණාද අහන්න එපෙයි."

"ඇහුවා....උත්තර දුන්නෙ නෑ...මන් හිතන්නෙ මොකක් හරි අවුලකින් ඉන්නෙ?"

"ඒකිව්වෙ?"

"දන්නෙ නෑ මාස්ටර්...."

"හරිමන් ඇවිත් බලන්නම්..."

අශේන් කල්පනා කරේ අවුලෙන් ඉන්න හේතුව මොකක් වෙන්න පුලුවන්ද කියලා?මොකද දැන් එයාගෙ ප්‍රශ්න හැම එකකටම වගේ උත්තර ලැබුණා.ඒත් එක ප්‍රශ්නයක් තාම තිශේනායාගෙ හිත ඇතුලෙ වැඩකරනවා කියලා අශේන්ට අමතක වුණා.

"ඇයි?"

අශේන් ඉන්නෙ වෙන ලෝකෙක කියලා තේරුණ වික්‍රම ඇහුවෙ උත්තරයක් බලාපොරොත්තුවෙන්ම වෙනෙවයි.

"අවුලෙන්ලු..."

අශේන්ට හිතාගන්න බැරිවුණාට වික්‍රමටනම් හිතාගන්න පුලුවන් වුණා හේතුව මොකක් වෙන්න ඇතිද කියලා.

"තාත්තා කවුද කියලා කලපනා කරනවා ඇති.ඇත්තටම කවුද තාත්තා?උඹ දන්නවානෙ?"

අශේන් කරේ ලාවට වික්‍රම එක්ක හිනාවෙන එක.මොකද වික්‍රමවත් තාම දැනන් හිටියෙ නෑ තිශේන්‍යාගෙ තාත්තා කවුද කියලා.අශේන් ඒක දන්නෙ නෑ කියලා මොන රට බයිලා ගැහුවත් වික්‍රමට හොදටම විශ්වාසයි අශේන් ඒක දන්නවා කියලා.

"මන් නොදැන ඉන්න හේතුවක් නැනෙ වික්‍රම?"

ඒකටනම් වික්‍රමටත් හිනා ගියා.මොකද එමීෂාගෙ හොදම යාළුවා ඒක නොදැන ඉන්න විදිහක් නැනෙ.

"එයාගෙ තාත්තා ජීවත් වෙනවද?"

ඒක තමා වික්‍රමට ආපු ඊළග ප්‍රශ්නෙ.අශේන් කරේ ලාවට හිනාවෙලා ඔවු කියන්න ඔළුව වනපු එක.

"හෙට බර්ත් ඩේ එක නේද?"

"හ්ම්......හෙට උදේම කියනවා...මන් ගිහින් එන්නම්..."

"හරි....මාත් උදේම එන්නම්කෝ..."

වික්‍රමට බායි කියාගෙන අශේ කෙලින්ම ගියේ මැන්ෂන් එකට.වෙනදා වගේ ගාඩ්ලා නැති නිසා අශේන් කෙලින්ම ලිෆ්ට් රූම් එකට ගියා.ඒ යද්දිත් තිශේන්‍යා සෝෆා එකට වෙලා ෆෝන් එක ඔබන ගමන් හිටියා.

"කොහෙද ළමයො ඊයෙ රෑ හිටියෙ?"

"අශීගෙ ගෙදර ගිහිල්ලා අචීව හම්බ වෙන්න නුවර ගියා"

තිශේන්‍යා කිව්වෙ බොරුවක් කියලා අශේන්ට තේරුණාට අශේන් ඒක කියන්න ගියේ නෑ.එයා තිශේන්‍යා ළඟින් ඉඳගත්තා.ඔවු ඒක කොහොමත් බොරුවක්නෙ.වෙනදාට හරි තාත්විකව බොරු කියන තිශේන්‍යා අද කිව්ව බොරුව පොඩ්ඩක්වත් විස්ජ්වාස කරන්න බැරි වුණා.මොකද නුවර ගිහිල්ලා එන්න තරම් තිශේන්‍යාට වෙලාවක් තිබුණේ නෑ.ඒක තිශේන්‍යාට අමතක වුණා.

"බොරු කියද්දි තේරෙනවා..."

"එහෙම පවර් එකකුත් ඔයාටතියෙනවද?"

අශේන් කරේහිනාවෙච්ච එක.තිශේන්‍යා මේ වෙලාවෙ හිටියෙ හරි සැහැල්ලුවෙන්.ඒක අශේන්ට දැනුනා.වෙනදා වගේ එයා අශේන් ඉස්සරහා වෙනස් වෙන්න ගියේ නෑ..එයා හිටියෙ එයා විදිහටමයි.තිශේන්‍යා කියන කෙනයි අශේන් ළඟ වෙනදට ඉන්න තිශේන්‍යා කියන්නෙයි දෙන්නෙක්.ඉතින් අශේන් ඒ දෙන්නාගෙ වෙනස මේ සති කීපයට තේරුම් අරන් හිටියා.

"හවස වැඩක් තියෙනවද?"

තිශේන්‍යා අශේන් දිහා බැලුවෙ සැකෙන් වගේ.මොකෝ වෙනදට ඔහොම අහන්නෙ නැනෙ කියන්න තියෙන දේ එකපාර කියලා දානවා මිසක්.පැහැදිලි වෙනසක්...

"නෑ.....ඇයි?....."

තිශේනායා අශේන් දිහාට මූණ විතරක් හැරෙව්වා.

"බීච් යමු?"

එ ඇහුවමනම් තිශේනායාට හිනා ගියා.අශේන් එයාට රැව්වම තිශේනායා හිනාවෙන එක නවත්තගත්තා.කවදා අහපු කතාද මේවා.ඒක විතරයි තිශේනායාට හිතුනෙ

"ඇයි?"

අශේන් ඇහුවෙ බොරු තරහක් ඇරන්.

"මේ ඔයා? බීච්?"

තිශේනායා අහන්නෙ කින්ඩියටවගේ.බීච් එකට කලින් ගිහිල්ලා නෑ වගේ තමා තිශේනායා අශේන් දිහා බැලුවේ.

"ඇයි අපි බීච් ගියොත් යැවෙන්නෙ නැද්ද?"

අශේන් තාමත් අර තරහින්ම ඇහුවත් තිශේනායා කරේ හිනාවෙන එක.

"ලෝක පුදුමයක්...යනවානම් යමු...මන් එන්නම්...ඉන්න..."

තිශේනායා සතුටෙන් එයාගෙ රූම් එකට යන්න යද්දි අශේන් තනියෙන්ම සතුටු වුණා.මොකද එයා හීන මැව්වා තිශේනායා එක්ක මේ වගේ සතුටෙන් ඉන්න පුලුවන් දවසක් එයි කියලා.ඉතින් දැන් ඒ වගේ දවස් ඉස්සරහට තියෙනවා නේද කියලා අශේන්

සතුටු වුණා.දැන් හවස් වෙලා තිබුණ නිසා අශේන් හිතුවා තිශේන්‍යා එක්ක යන්න හොදම තැන බීච් එක කියලා.විනාඩි පහළවකින් විතර සුදු හුඩි එකක් එක්ක ට්‍රවුසර් එකක් ඇදපු තිශේන්‍යා ස්ලිපස් දෙකකුත් දාගෙන පහළට ආවා.

"යමු...."

තිශේන්‍යාගෙ ඔලුවත් අතගාලා අශේන්ම කාරෙක අරන් දෙන්නම බීච් එකට ආවා.වැඩි සෙනගක් නැති පැත්තකට ඇවිල්ලා අශේන් වගේම තිශේන්‍යා වැල්ලෙන් වාඩි වුණා.හරි ලස්සන දර්ෂනයක්.

"රැල්ල පාගමු?"

ක්ෂනිකව ආපු අදහසක් නිසා තිශේන්‍යා ට්‍රවුසර් එකේ කකුල් දෙක නවා ගත්තා.ඔවු මේ මනුස්සයාට අදහස් එන්නෙ එක ක්ෂනිකයෙන්.

"ඔයා පාගලා එන්න තිෂු...."

"එන්න අනේ....."

තිශේන්‍යා බලෙන්ම අශේන්ව රැල්ල පාගන්න ඇදන් ගිආ.මුලින් අකමැති වුණත් පස්සෙ පස්සෙ අශේන් තිශේන්‍යාගෙ අතත් අල්ලගෙන රැල්ල පෑගුවා.දෙන්නාම හිනාවෙවී කතා කරකර රැල්ලපෑගුවා.ඔවු සමහර විට මේ අශේන් බලාපොරොත්තු ව්ච්ච්ච දවස් වෙන්න ඇති.

"පුලුවන්නම් අල්ලන්න...."

තිෂේන්‍යා අශේන්ගෙ අතට තට්ටුවක් දාලා වැල්ල දිගේ දුවන්න පටන් ගත්තා.

"හෙමින් දුවනවා තිෂූ....මට දුවන්න බෑ....දැන් මං නාකියි ළමයො..."

තිශේන්‍යාව අල්ලන්න දුවන ගමන් අශේන් කෑගහද්දි තිශේන්‍යා තප්පර කීපටක් නැවතිලා අශේන් ටිකක් එයාට ලං වෙනකල් හිටියා.

"හතලිහක් කියන්නෙ නාකි නෑනෙ?"

අශේන් ටිකක් ලං වෙනකල් ඉදලා තිශේන්‍යා ආපහු දිව්වා.තිශේන්‍යාගෙ වේගෙත් එක්ක අශේන්ට හැරෙන්නවත් බෑ.පැය බාගයක් විතර ගියත් අශේන්ට තිශේන්‍යාව අල්ලගන්න බැරි වුණා.ඉතින් අශේන් එයාලා ඉදන් හිටිය තැනටම ගිහින් ඉදගත්තා.

"මහන්සිද?"

"ඔයාට තාම දාහතක් වුණාට මට හතලිහක්"

තිශේන්‍යා කරේ අශේන් ළගින් ඉදගත්ත එක.ලස්සනයි ඉර බහිනවා.ඉතිං තිශේන්‍යාට වෙන මොනවද ඕනි.අවුරුදු ගානක් වුණත් එයා මේක දිහා බලන් ඉදියි.ඒතරම් මේ දර්ශනේට එයා කැමතියි.අශේන් මේ පොඩි එකෙක් වගේ කෙනා දිහා බලන් හිටියෙ දිලිසෙන ඇස් වලින්.

"අම්මත් ඔහොමයි...."

"දන්නවා...."

"ආ?"

තිශේන්‍යා නොදැනුවත්ව එයාගෙ කටෙන් පිටවුණ වචනෙ නිසා අශේන් පුදුම වුණා.පුදුම වෙන්න එපෙයි.තමන්ගෙ අම්මාව ඇත්තටම දැකල නැති කෙනා අම්මා මුහුද දිහා බලන් ඉන්න ආසයි කියන එක දන්නෙ කොහොමද?කොහොමහරි දන්නවා ඇති ඉතින්...

"අහ්....එහෙම වෙන්න ඇති?"

තිශේන්‍යා ගානට කතාව වෙනස් කරා.අශේන් ටික වෙලාවක් කලපනා කරලා ඕනි දෙයක් කියලාඑයා ඒක අමතක කරලා දැම්මා.

"මොනා හරි කනවද?"

තිශේන්‍යා හා කියන්න ඕලුව වැනුවම අශේන් එතනින් ගියා.අශේන් ඉදන් හිටියතැන තියෙනවා දැක්ක අශේන්ගෙ ෆෝන් එක දැකලා ආව අදහසක් නිසා ඒකෙ බැක් කවර් එක අයින් කරලා එයා මෙච්චර වෙලා සාක්කුවේ දාගෙන හිටිය කොලේ ඒකෙ ඇතුලෙන් දාලා ආපහු ෆෝන් එක තිබ්බ විදිහටම තිබ්බා.

"ආ...."

අශේන් ගෙනාව බර්ගර් එකයි කූල් ඩ්‍රින්ක් එකයි අතට ගත්ත තිශේන්‍යා අශේන් දිහා බලලා හිනාවුණා.

"හෙට ඔෆිස් එනවද?"

තිශේන්‍යා මේ වෙද්දි වැඩ ගොඩක් මගැරලා තිබ්බ නිසාම අශේන් ඇහුවත් තිශේන්‍යා කරේ නෑ කියන්න ඔලුව වනප් එක.

"ඇයි?"

"කලින් දාගත්ත ගමනක් යන්න තියෙනවා..."

අශේන් හා කියන්න ඔලුව වනලා එයාගෙ බර්ගර් එක කන්න පටන් ගත්තා.

"A/L කරන්න අදහසක් නැද්ද?"

තිශේන්‍යා නෑ කියන්න ඔලුව වනලා කූල් ඩ්‍රින්ක් එකත් ඉවර කරා.

"ඕනි වෙන එකක් නෑ..."

"ඒ කිව්වෙ?"

"නෑ ඉතින්...දැනටම මං ජොබ් දෙකක් කරනවානෙ...."

අශේන්ට ඒ කතාබහේ අමුත්තත් දැනුනත් එයා ඒක වැඩිය ගනන් ගත්තෙ නෑ.අමුත්තක් ඇත්තෙත් නෑ නැත්තෙත් නෑ වගේතමයි අශේන්ටනම් තේරුණේ.

"හ්ම්ම්ම්...."

"ඇයි ඔයා මැරි කලේ නැත්තෙ?"

අශේන් කලේ හිනාවෙලා තිශේන්‍යාව ලංකරගත්ත එක.තිශේන්‍යාත් කරේ අශේන්ට තව ටිකක් ලංවෙච්ච එක.

"දැනගන්නම ඕනිද?"

"ඔවු...."

ඒක තිශේනායා කිව්වෙ ස්තීර හඬකින්.සමහර විට තිශේනායා ඒක දන්නවත් ඇති.ඒත් තිශේනායාට ඒක අශේන්ගෙ කටින්ම දැනගන්න ඕනි වුණා.

"එයා වෙන කෙනෙක්ව මැරි කළා..."

"දැන් එයා කොහෙද?"

"දන්නෙ නෑ....කොහෙහරි සතුටින් ඇති...."

අශේන් කරේ මුහුද දිහා බලන් හිටිය එක.තිශේනායා එයාට බාදා නොකර අශේන්ගෙ උරහිසෙන් ඔලුව තියාගත්තා.ඔවු.මේ තමයි තිශේනායා අශේන්ගෙ උරහිසෙන් ඔළුව තියාගත්ත පලවෙනි වතාව.දැනුවත්ව තිශේනායා පලවෙනි පාරට තමයි අශේන්ට මෙච්චර ලං වෙලා ඉන්නෙ.හැබැයි දැනුවත්ව...

"ඇයි ඉස්සර මාත් එක්ක තරහෙන් හැසිරුණේ?"

අශේන් තව ටිකක් තිශේනායාව එයා ගාවට ඇදලා ගත්තෙ හරියට එයා අශේන්ව දාලා යයි වගේ.

"අහලා තියෙනවද මාෆියා කින්ග් කෙනෙක්ගෙ වීක් පොයින්ට් එකක් ගැන?"

තිශේනායා කරේ නෑ කියන්න ඔලුව වනපු එක.මොකද එයා ඒ තාක් හිටිය එක මාෆියා කින්ග් කෙනෙක්ගේවත් වීක් පොයින්ට් එකක් ගැන අහලා නෑ.එයාලාව ට්‍රේන් කරන්න හැඟීම් දැනීම් නැති කරන්න.ඉතින් එහෙම එකේ වීක් පොයින්ට් තියෙන්න බැනෙ?

"හැබැයි මට වීක් පොයින්ට් එකක් තියෙනවා කිව්වොත් විශ්වාස කරනවද?"

තිශේන්‍යා අශේන් දිහා බැලුවෙ පුදුමෙන්.මොකද අවුරුදු දාහතක් අශේන් එක්ක ඉදලත් එයාට වීක් පොයින්ට් එකක් ඇති කියලා තිශේන්‍යා හිතලා තිබුණෙ නහැ.හිතලාතිබුණෙ නෑ නෙවෙයි හිතන්න ඕනි කමක් තිබුණෙ නෑ.

"ඒතමයි **ඔයා...**ඔයාව ඒ ළමා නිවාසෙට දාන්න කලින්,යුගාන්ටත් කලින් මමයි ඔයාව ඉස්සල්ලම අතට ගත්තෙ.ඒ නිල්පාට පැනල් එකෙන් ඔතලා හිටිය පුලුන් බෝලෙ මට බිමින් තියන්න

බැරිවුණා.ඔයා මගේ අත අල්ලගෙනම හිටියා ගලවගන්න බැරි වෙන්න.ඒත් මට ඔයාව අකමැත්තෙන් වුණත් ඒ වෙලාවෙ යුගාන්ට දෙන්න වුණා. ඒත් මන් දැනන් හිටියෙ නෑ ඔයා ගිහින් තියෙන්නෙ මගේ හිතත් අරන් කියලා.මන් මොන වැඩේ කරන්න ගියත් ඔයාව මතක් වෙනවා.ඔයා මගේ අත අල්ලන් ඉන්නවා වගේ දැනෙනවා.ඉතින් මටඒ වෙලාවෙ ඒක දරාගන්න බැරිවුණා. ඉතින් මන් කරේ යෂ් එක්ක ගිහිල්ලා ඔයාව හදාගන්න ගත්තඑක.යුගාන් වුණත් ඒකට මොකුත් කිව්වෙ නෑ.ඉතින් මං ඔයා එක්ක සෙල්ලම් කරා,සින්දු කිව්වා,ඔයාව නිදි කරා,කැව්වා කරන්න පුලුවන් ඔක්කොම කරා.ඒත් ටිකක් ලොකුවෙද්දි මට තේරුණා ඔයාව මන් ළගට ගන්නවා කියන්නෙ ඔයාගෙ ජීවිතේට අනතුරක්කියලා.මට ඔයා ලගට ගන්න ඕනි වුණත් මේ මාෆියා එක ඒකට හරස් කැපුවා.මට වෙන කරන්න දෙයක් තිබුණෙ නෑ.ඔයාට තේරෙන කාලෙ ඉදන්ම මන් ඔයාව මගෙන් ඈත් කරන හැදුවා.ඒකට ඔයාව රිද්දුවා.ඔයාගැන ගානක් නෑ කියලා පෙන්නුවා.ඒත් මං හැම දාමහිතෙන් විදෙව්වා.ඔයාව මං ළගට ගන්න බැරුව මන් විදෙව්වා තිෂූ...මං දන්නෙ නෑ මං ඔයාගෙන් සමාව ගන්න ඕනි කොහොමද කියලා.මං දන්නවා මං ඔයාව රිද්දුවා කියලා.මං දන්නවා මං නිසා ඔයා දුක් වුණා කියලා.ඔයාට මං ගැන ලොකු තරහක් ඇති...මට සමා වෙන්න...මට සමාවෙන්න පුතේ...හැමදාම මං ඔයා ළගින්ම හිටියා.ඔයා නොදන්නවා වුණාට මං හැමදාම ඔයාගෙ හැම ඉවෙන්ට් එකකටම ආවා.පේන්න හිටියෙ නැති වුණත් මං කොහේ හරි ඉදන් ඔයා පෆෝම් කරනවා බලාගෙන හිටියා තිෂූ...ඔයාගෙ ෆොටෝස් වලින් මගේ හයිඩ් කරලා තියෙන ෆෝල්ඩර් එකක්ම පිරිලා තියෙන්නෙ පුතේ..මට සමාවෙන්න...පුලුවන්නම් මට සමාව දෙන්න...."

තිශේන්‍යා වචනයක්වත් කිව්වෙ නෑ.ඒ වෙනුවට එයා කරේ අශේන්ට තුරුල් වෙච්ච එක විතරයි.අශේන්ට දැනුණා එයාගෙ ෂර්ට් එක තෙත් වෙනවා කියලා.ඒත් කිසිම සද්දයක්

නැහැ.අඩුම ඉකි ගහන සද්දයක්වත් ඇහුනෙ නෑ.ඒත් අශේන්ට දැනුනා තිශේන්‍යා ඉකිය හිරකරගෙන අඩනවා.

"ඒත් ඔයාට තිබ්බා මගේ පැත්තෙනුත් ටිකක් හිතන්න... හැමදාම පන්තියේ පලවෙනියා වෙද්දි,ඔයා මට අවදානෙ දෙයි කියලා හිතාගෙන මන් හැමදේම කරා.ඔයාට ඕනි හැමදේම මං කරා.ඒත් ඔයා හැමදාම ඒ කිසි දෙයක් දැක්කෙ නෑ වගේ හිටියානේ?ඇයි එහෙම....ඇයි එහෙම කරේ?ඔයා හිතන්නෙ ඔයාට විතරක් හිතක් තියෙනවා කියලද?"

අශේන් තිශේන්‍යාගෙ කට වැහුවා.අශෙන්ට ඇඩෙනවා.තිශේන්‍යා කවදාවත් නැතුව හොඳටම අඩනවා.ඉකි ගගහා අඩනවා.සමහරවිට මේ අඩන්නෙ අවුරුදු දාහතක් හිර කරන් හිටිය කඳුලු වලින් වෙන්න ඇති.එයාගෙ බාරකාරයාට ඕනි හැමදේම කරන්න වෙච්ච ඒ දුක,වේදනාව,තරහ, කේන්තිය, මේ හැමදේම නැතිවෙනකල් තිශේන්‍යා ඇඩුවා.පැයක්ද දෙකක්ද කොච්චර වෙලාවක්ද කියලා දන්නෙ නැතුව දෙන්නම ඇඩුවා.මෙච්චර කල් තිබ්බ පීඩනේ නැති වෙනකල් ඇඩුවා.

"මං එක ප්‍රශ්නයක් අහන්නද?"

තිශේන්‍යා ඇහුවෙ අශේන්ගෙන් ඈත් වෙන්නෙ නැතුවමයි.එයාට ඕනි වුණේ නෑ අශේන්ගෙන් එක තප්පරේකටවත් ඈත් වෙන්න.අශේන්ටත් එහෙමමයි.

"අහන්න බලන්න..."

"මං මේ ප්‍රශ්නෙ ඇහුවම ආය කවදාවත් මං ඔයාගෙන් මේ ප්‍රශ්නෙ අහන්නෙ නෑ."

"අහන්නකො ඉතින්..."

"මට ආදරෙයිද?"

"මගේ පණටත් වඩා..."

අශේන් තවත් තදින් තිශේන්‍යාව බදාගත්තා.පොඩි එක්ක් වගේ තාමත් තිශේන්‍යා අඩන එක නවත්තලා තිබුණෙ නෑ.පැය හතරකට වඩා ඇඩුව තිශේන්‍යා එයාවත් නොදැන අශේන්ගේ තුරුලුම නින්ද ගිහින් තිබ්බා.

"හෙලෝ මාස්ටර්..."

"ශේන්‍යාට නින්ද ගියා....එන්න...බීච් එකේ ඉන්නෙ..."

"ඕකේ මාස්ටර්..."

තව විනාඩි පහළවක් විතරයද්දි අශේන් කාර් එකත් අරන් අශේන් ළඟට ආවා.තව් බොඩිගාඩ් කෙනෙක් අශේන්ගේ කාර් එක ගනිද්දි අශේන් තිශේන්‍යාවත් ඇරන් යෂ්ගෙ කාර් එකට නැග්ගා.යෂ් බලන් හිටියෙ තිශේන්‍යාගෙ ඔළුව අතගාන අශේන් දිහා.අන්තිමට එයාගෙ ලොක්කා මේ විදිහට සතුටින් ඉද්දි යෂ්ට පවා මාරම විදිහට සතුටු හිතුණා.මැන්ෂන් එකට ඇවිල්ලා තිශේන්‍යාව එයාගෙ රූම් එකෙන් තියලා තිශේන්‍යාගෙ නලල මැද්දෙන් බරම බර හාදුවක් තිබ්බ අශේන් එයාගෙ ඔෆිස් රූම් එකට ආවා.

"මට මාර සතුටුයි මාස්ටර්..."

යෂ් හිනාවෙලා කියද්දි අශේනුත් කාලෙකට පස්සෙ හිනාවුණා.

"ඇයි යෂ්ට විතරක්...මටත් සතුටුයි...හෙටින් පස්සෙ හැමදේම හරියයි යෂ්...මන් එයාගෙ තාත්තා කවුද කියලා එයාට කියනවා...මන් හිතනවා එයාගෙ හොදම බර්ත් ඩේ ප්‍රසන්ට් එක ඒක වෙයි කියලා."

"බලාපොරොත්තු නොවිච්ච විදිහට වුණත් හැමදේම ඉවර වුණානෙ මාස්ටර්.."

"හ්ම්ම්ම්...මට හරි සැහැල්ලුවක් දැනෙනවා යෂ්...."

"හෙට ඉඳන් අපි අලුත් ජීවිතයක් පටන් ගමු මාස්ටර්..."

"හ්ම්ම්...."

*එකොළොස්වන පරිච්ඡේදය*

අශේන් උදේම නැගිට්ටෙ අලුත් බලාපොරිත්තු ගොඩක් එක්ක.ඉතින් වෙනදා වගේම ට්‍රවුසර් එකකට සුදුපාට ෂර්ට්වෙකක් ඇදලා පහළට ආවෙ කලින්ම තිශේනායාට හදවපු බ්‍රේස්ලට් එකත් ඇරගෙන.

"ගුඩ් මෝනින් මාස්ටර්..."

යෂ් පවා හිටියෙ වෙනදා නැති උද්‍යෝගෙකින්.එහෙම වෙන්න එපෙයි මොකද මේ පටන් ගන්නයන්නෙ අලුත්ම ජීවිතයක්.සතුටින් පිරිච්ච ජීවිතරක්.

"ගුඩ් මෝනින් යෂ්...."

අශේන් යෂ් එක්කම ගියේ තිශේනායාගෙ රූම් එකට.මොකද අශේන්ටඕනි වුණා උදේම තිශේනායාගෙ බර්ත් ඩේ ප්‍රසන්ටෙක දෙන්න.

"තිෂූ.....මේ දොර අරින්න...තාම නිදිද ඔයා....තිෂූ....තිෂූ.....තුෂූ...."

මේ වෙලාවෙනම් අශේන් ටිකක් කලබල වුණා දොර ලොක් කරලා නොතිබ්බ නිසා දොර ඇරන් ඇතුලට ගියත් තිශේනායා හිටියෙ තද නින්දක.වෙච්ච දේවල් වල හැටියට නින්ද නොගියොත්නෙ ප්‍රශ්නෙ.

"තිෂූ....නැගිටි-"

අශේන් තිශේනායාව ඇහැරවන්න හැදුවත් තිශේනායාගෙ අත පණ නැතුව ඇදෙන් බිමට වැටෙද්දි අශේන් කියන්න ගිය එක පවා නතර කරගත්තා.එයා එක පාරටම තිෂේනායාගෙ අත අල්ලලා උඩට කරලා ඇතැරියා.ඔවු ඒ අත පණ නැතුව කඩා

හැලුණා.ඒත් එක්කම අශේන් පිටිපස්සට විසික් වුණා ඒ ඇස් වල තිබ්බෙ බයක් එක්ක කම්පනයක්.අශේන්ට පුලුවන් වුණේ තිශේන්‍යා දිහාට ඇඟිල්ල දික්කරනඑක විතරයි...

"එ-එයා?"

අශේන්ගෙ කටහඬ පවා නැතිවෙලායද්දි යෂ් කරේ ඉක්මනට තිෂේන්‍යා ළඟට ආව එක.

"තිශේන්‍යා?...."

යෂ් පවා කලබල වෙලා.යෂ්ගෙ ආමන්ත්‍රණය පවා තිශේන්‍යාගෙ කනට ගියේ නෑ.මේ වෙද්දිත් වෙව්ල වෙව්ල හිටිය අශේන් තවත් තප්පරයක්වත් නාස්ති කරන්නෙ නැතුව තිශේන්‍යාව ඇරන් කාර් එකට නැග්ගෙ යෂ් ඉක්මනට ඇවිත් ඩ්‍රයිවින් ෂීට්වෙකට නැග්ගා.

"ඉක්මන් කරනවා යෂ්.....තිෂූ...අනේ මැණික කතාකරන්නකො....අනේ අම්මා වගේ මාව දාලා යන්න එපා රත්තරන්....අනේ මැණික....කතා කරන්නකො...ඇස් අරින්න මැණික..."

අශේන් තිශේන්‍යාගෙ සිහිය ගන්න ට්‍රයි කරත් ඒක වැඩක් වුණේ නෑ.ළඟම තිබ්බ ප්‍රයිවට් හොස්පිට්ල් එකට ආපු ගමන් තිශේන්‍යාව අයිසීයූ දැම්මා.අශේන් ඒ මුළු වෙලාවෙම කරේ අයිසීයූ එක ඉස්සරහා එහාට මෙහාට ඇවිදපු එක.ඔවුඑයා මේ වෙලාවෙ හිටියෙ බය වෙලා.කම්පනයකින්.මොකද එමී වගේම තිශේන්‍යාත් එයාව දාලා ගියොත් කියන බය අශේන්ට තිබුණා.මේ වෙලාවෙ අශේන්ගෙ හිතට ආවෙම නෙගටිව් අයිඩියාස් විතරයි.

"මේ ඇඩ්මිට් කරපු පේෂන්ගෙ කවුද?"

එකපාරටම අයිසීයූ එක ඇතුලෙන් ආව ඩොක්ට අශේන්ගෙන් අහද්දි අශේන් කරේ ඉක්මනට ඩොක්ට ළඟට ආපු එක.මොකද මේ වෙලාවෙ අශේන්ගෙහිතේ තිබ්බෙ ලොකු බයක්.

"අප්පච්චි...."

අශේන් කිසිම පැකිලීමක් නැතුව උත්තර දීපු දිහා යෂ් ඇත්තටම බලන් හිටියෙ කට ඇරගෙන.

"සොරි මිස්ටර් අපිටදරුවව බේරගන්න බැරි වුණා....."

ඒ වචනත් එක්කම අශේන් ළඟම තිබ්බ පුටුවට කඩාගෙන වැටුණා.ඒවචන හැම එකක්ම ආය ආය අශේන්ගෙ හිත ඇතුලෙ දෝංකාර දුන්නා.

**අපිට දරුවාව බේරගන්න බැරි වුණා.....**

**අපිට දරුවව බේරගන්න බැරි වුණා.....**

**අපිට දරුවව බේරගන්න බැරි වුණා.....**

"ස්ලීපින් ටැබ්ලට්ස් ඇරන්...අපි ට්‍රීට්මන්ට්ස් කරන්නත් කලින්ම නැතිවෙලා හිටියෙ....සොරි...."

අශේන් කරේ ළඟට ආව යෂ්ගෙ උරහිසේ ඔළුව තියාගත්ත එක.ඔවු එයාට මේ වෙච්ච හැම දේම එකපිට එක මැවිලා පේන පටන් ගත්තා.

"ගිහින් බලන්න..."

ඩොක්ට එතනින් යන්න ගියත් අශේන්වත් යෂ්වත් ඉදන් හිටිය තැනින් නැගිට්ටෙ නෑ.එයාලා තාම හිටියෙ ෂොක් වෙලා.අශේන් විතරක් නෙවෙයි,යෂ් පවා හිටියෙ ෂොක් වෙලා.

"මන් කොහොමද බං මගේම දරුවා එහෙම ඉන්නවා බලන්නෙ?ඉස්සල්ලම එමී මාව දාලා ගියා,දැන් තිෂූ මාව දාලා  ගියා.-"

"-මාස්ටර්? මාස්ටර්ගෙ දරුවා?"

ඔවු ඒකතමයි යෂ්ගෙ හිතට ඉස්සල්ලම ආව ප්‍රශ්නෙ.

"ඔවු යෂ් ඒ මගෙයි, මම ආදරේ කරපු එමීගෙයි දරුවා...."

යෂ් වචනයක්වත් කිව්වෙ නෑ..කොහොමහරි යෂ් අශේන්වත් එක්කන් හොස්පිටල් එකේ රූම් එකට ගියා.අශේන් තිශේනායාගෙ

බොඩි එක ළඟින් දණගහගත්තා.තිශේනායාගෙ බැන්ඩේජ් කරලා තිබුණ අතක් අල්ලගත්ත අශේන්ගෙ ඇස් වලින් කඳුලු වැල් කඩාගෙන වැටුණා.

"ඇයි මැණික මාව දාලා ගියේ? ඔයා එක්ක අලුත් ජීවිතයක් පටන් ගන්න ගියා විතරයි ඇයි මැනික මාව දාලා ගියේ? මං ඔයාගෙ අප්පච්චි කියලාවත් කියාගන්න බැරිවුණා නෙ රත්තරන්....අනේ මැනික මාව දාලා යන්න එපා...ඇස් අරින්නකො මැනික...අප්පච්චි දිහා බලලා එකපාරක් හිනාවෙන්න රත්තරන්...අනේ මැනික මාව දාලායන්න එපා මැණික...අප්පච්චිව තනි කරන්න එපා...එක පාරක් නැගිටලා අප්පච්චි කියලා කියන්නකො මැණික...අනේ යෂ් මෙයාට නැගිටින්න කියන්නකො යෂ්...මාවතනි කරන්න එපා කියන්න....."

අශේන් තිශේනායාගෙ ඒ මලසිරුර බදාගෙන කෑගහලා ඇඬුවා. මේ ඉන්නෙ එයාව තාත්තෙක් කරපු දරුවා.ඉතින් එයත් අශේන්ව දාලා

අශේන් කොහොමද ඒක දරාගන්නෙ.අශේන් දන් හිටියෙ වෙනම ලෝකෙක. මහා රුස්ස ගසුත් ආදරේ ඉස්සරහා හරි අපූරුවට කඩා වැටෙනවලු.මේ තමයි ඒකට සාක්ෂිය.එමීෂා එයාව දාලා ගියාමත් ආශේන් අමාරුවෙන් දරාගත්තෙ එයාගෙ දුව ඉන්නවනෙ කියලා.ඒත් ඉතින් එයටි අශේන්ව දාලා ගියාම අශේන් කියලා මොනා කරන්නද තිශේන්‍යා පවා එයාව ඇහ්හෙන මානෙන් ඈතට ගිහින් ඉද්දි?.

"මාස්ටර්..."

අශේන් යෂ් දිහා බැලුවා.

අශේන් හිටියෙ සෙමෙට්‍රි එකේ.එයාගෙම දුවගෙ ශරීරය පිච්චිලා ඉහළට නගින දුම දිහා බලාගෙන.හැමදාම වගේ අශේන් ළග මේ වෙලාවෙත් හිටියෙ යෂ් එක්ක වික්‍රම.අවින්දි අශිනි දෙන්නම ඇවිත් ගියා.ඒ විතරක් නෙවෙයි ඉස්කෝලෙ ළමයි ඔක්කොම වගේ ආවා.බිස්නස් ෆීල්ඩ් එකේ ලොකු ලොක්කො ගොඩක් එකතු වුණා.ඉතින් අශේන් හිටියෙ හොදටම වැටිලා.අඩුම කෑමක් බීමක්වත් දවස් තුනක ඉදන් ඇරන් නෑ.ඒකට තමා යෂ් වගේම වික්‍රම බයවුණේ.

"මචං...අපි ගෙදර යමු නේද?"

වික්‍රම අශේන්ගෙ උරහිස උඩ අත තියලා ගෙදර යමු කිව්වත් අශේන්ට ඒක ඇහුනෙ නෑ.එයා හිටියෙ තිශේන්‍යාගෙ මතක එක්ක තනිවෙලා.

**"කලින් දාගත්ත ගමනක් තියෙනවා යන්න..."**

**"ඕනි වෙන එකක් නෑ..."**

**"මට ආදරෙයිද?"**

**"ඇයි මට මෙහෙම කරන්නෙ?"**

**"ඔයාට මගේ ජීවිතේට අත දාන්න අයිතියන් නෑ...."**

**"ඔයා මගෙ කවුරුත් නෙවෙයිනේ?"**

"මාස්ටර්...?"

යෂ්ගෙ කටහඬට මේ ලෝකෙට ආව අශේන් වික්‍රම එක්ක වගේම යෂ් එක්ක මැන්ෂන් එකට ආවෙ තිශේනායාගෙ අවසන් කටයුතු ඉවර කරලා.එයාටවත් තේරුණේ නැහැ මෙච්චර දෙයක් වුණේ කොහොමද කියලා.

"ශේන් එදා රිපෝට් එකක් ගන්න ගියා..."

වික්‍රම කිව්වෙ මේඩ් කෙනෙක් ගෙනාව කොෆී එක ගන්න ගමන්.

"රිපෝට් එකක්?"

වික්‍රම ඔවු කියන්න ඔලුව වැනුවා.එදා වික්‍රමව හම්බවෙන්න රශිනිවත් එක්කන් ආපු දවසෙ කලබලෙන් ගියේ අවින්දිගෙ රිපෝට් එකක් ගන්න නෙවෙයි කියලා වික්‍රමට පොඩි සැකයක් තිබ්බත් ඊට පස්සෙ වෙච්ච හැමදේම එක දිගට වුණ නිසා එයාට ඒ ගැන අශේන් එක්කවත් කතා කරන්න බැරිවුණා.

"එදා යුගාන්ව ඇරෙස්ට් කරපු දවසෙ එයා කලබලෙන් ගියා අවින්දිගෙ රිපෝට් එකක් ගන්න තියෙනවා කියලා.මාත් වැඩිය

හිතුවෙ නෑ.ඒත් මන් හිතන්නෙ එදා ගියේ එයාගෙ මොකක් හරි රිපෝට් එකක් ගන්න."

"එයා එදා ඉදන් තමයි ගොඩක් කල්පනා කල්පනා කරන්න ගත්තෙ.අර එක දවසක් රෑ එයා අතුරුදහන් වුණේ?"

වික්‍රම කිව්ව කතාව යෂුත් තහවුරු කරා.මෙතන මොකක් හරි වෙලා තියෙනවා කියලා තේරුණ අශේන් කල්පනා කරේ එයාට කොතනදිද තිශේන්‍යාව මගැරුණේ කියලා.

"මං බලලා එන්නම්...."

අශේන් අතට ගත්ත කොෆී එකත් තියලා ඉක්මනට ගියේ තිශේන්‍යාගෙ රූම් එකට.තිශේන්‍යාගෙ මුලු රූම් එකම පීරලා බැලුවත් මොකුත් හම්බ වුණේ නැති අශේන් රූම් එකෙන් එළියට

එන්න හදද්දි ස්ටඩී ටේබල් එක උඩ තිබ්බ රිපොට් එකක් දැකලා ආපහු නැවතුනා.

රිපෝට් එකත් ඇරන් අශේන් ලෑස්ති වුණේ ඒ ඩොක්ටව හොයන් යන්න.මොකද ඒකෙ තිබ්බ කිසිම දෙයක් අශේන්ට තේරුණේ නෑ.

"ඉන්න මාස්ටර්...."

අශේන්ගෙ තනියට යෂුත් අශේන් පස්සෙන් ආවා.අදාල ඩොක්ටර්ව හම්බ වෙන්න විනාඩි පහළවක් විතර බලන් ඉදලා අන්තිමට මේ දෙන්නා ඒ ඩොක්ටර්ගෙ ඔෆිස් එකට ආවා.

"මේ කවුද?"

ඩොක්ටර් ටිකක් පුදුම වෙලා වගේ බලන් හිටියෙ හදිස්සියේම තමන්ව හම්බ වෙන්න මේ ආවෙ කවුද කියලා.

"මං අශේන් පලිහක්කාර.තිශේන්‍යා දිනර්වි පලිහක්කාරගෙ අප්පච්චි"

ඩොක්ටර් පුදුමෙන් බලන් හිටියෙ අශේන් දිහා.මොකද එයා කල්පනා කරා මෙච්චර කල් අම්මායි තාත්තයි නැතුව හිටිය තිශේන්‍යාට කොහොමද එකපාරටම අප්පච්චී කෙනෙක් ආවෙ කියලා

"ඒක දිග කතාවක් ඩොක්ටර්...මගේ දුවට මොකක් හරි අසනීපයක් තිබ්බද?"

ඩොක්ටර් අහන්න යන ප්‍රශ්නෙ ඉවෙන් වගේ තේරිලා අශේන් උත්තර දුන්නත් අශේන්ට ඕනි වුණේ හදිස්සියේම එයාගෙ ජීවිතේ නැතිකරගන්න තරම් තිශේන්‍යාට මොකද වුණේ කියලා.

"එයාට අවුරුද්දකට කලින් වගේ ඉඳන් කැන්සර් එකක් තිබ්බා.ඒත් මීට සතියකට වගේ කලින් තමා දැනගත්තෙ ඒක එයාගෙ ඇග හැමතැනම පැතිරිලා කියලා.එයා ඒ ගැන දුක් වුණේ නෑ.එයා මට කිව්වෙ 'අන්තිමට මැරෙන්නවා නම් මැරෙන්න ඕනි හැමදේම ඉවර කරලා අංකල් 'කියලා.ඉතින් මං කිව්වා ට්‍රීට්මන්ට්ස් කරමු කියලා.ඒත් එයා එපා කියලා මේ ගැන කාටවත් නොකියන්න පොරොන්දු කරවගත්තා.ඒත් මං එයාගෙ අම්මා තාත්තා ගැන හොයලා බැලුවත් මට ඒ දෙන්නම ගැන හොයාගන්න බැරිවුණා.අන්තිමේට ඔයාගෙ සෙකට්‍රි කියාලා කෙනෙක්ගෙ නම්බර් එකටත් කෝල් කළා.ඒත් ආන්ස්වර් කරේ නැහැ."

යෂ්ට වගේම අශේන්ටත් දැනුනෙ නිකන් එයාලා ගැනම කලකිරීමක්.මොකද එයාලට හොඳටම අවස්ථාව තිබිලා තිශේන්‍යාව බේරගන්න.ඒත් එයාලගෙම නොසැලකිලිමත්කම නිසා තිශේන්‍යා එයාගෙ ජීවිතේ නැතිවෙලා තියෙන්නෙ.ඉතින් එයාලා ගැනම කලකිරීමක් දැනෙන එක සාධාරණයි.

" අපි ඒ දවස්වල ප්‍රශ්න ගොඩක හිරවෙලා හිටියෙ."

යෂ් එයාගෙම හෘද සාක්ෂියෙන් බේරෙන්න හේතු දැක්වුවත් ඩොක්ටර් කරේ ලාවට හිනාවෙන එක.

"ප්‍රශ්න වල හිටියා කියන එක දරුවගෙ ජීවිතේට බලපාන්න විදිහක් නෑනෙ මිස්ටර්...අනික දරුවා ගැන හොයලා බලන එක ඔයාලගෙ වගකීම."

අශේන් කරේ ඒක පිලිගන්න ඔළුව වනපු එක.

"තැන්ක්ස් ඩොක්ටර්..."

අශේන් ඩොක්ටර්ටත් තැන්ක්ස් කරලා යෂ් එක්ක බීච් එකට ආවෙ ටිකක් හිත නිදහස් කරගන්න කියලා හිතාගෙන.

"මං මෙච්චර කල් එයාගෙ අප්පච්චි කියලා කියාගන්න බැරුව විදෙව්වා යෂ්...දැන් ඒක කියලා මගේ දරුවත් එක්ක සතුටෙන්

ඉන්න හදද්දි එයා මාව දාලා ගිහිල්ලා...මන් මොකද කරන්නෙ යෂ්..."

වෙනදා වගේම යෂ්ගෙන් දැන් මොකද්ද කරන්නෙ කියලා ඇහුවත් මේ වෙලාවෙ යෂ්ටවත් කරන්න ඕනි මොනාද කරන්නෙ කියලා හිතාගන්න බැරිවුණා.ඉතින් යෂුත් අශේන් ඉදන් හිටිය තැනම වැල්ලෙ ඉදගත්තා.

"අනේ මන්දා මාස්ටර්...මං කිව්ව දේ හරි නේද මාස්ටර්..?"

යෂ් මේ අහන්නෙ එදා තිශේනායාව හොස්පිට්ල් ඇඩ්මිට් කරපු දවසෙයෂ් අනාගතේ ගැන කිව්ව දේ ගැන.

"හ්ම්ම්....මට තේරෙන්නෙ නෑ යෂ්...අවුරුදු දාහතක් එයාටත් නොතේරෙන්න එයාව බලාගත්ත මට එයා ගැන හොයලා බලන්න බැරිවුණ සති දෙකට මෙච්චර දෙයක්

වුණාද?එමී නම් සතුටින් ඇති...තිශූත් එයා ළග නිසා.ඒත් අන්තිමට මන් මෙහෙ තනියෙන්. එයාට ගැහුවෙ බැන්නෙ එයාගෙම හොදට කියලා එයා තේරුම් ගන්න ඇති කියලා මං හිතනවා.අන්තිමට හරි එයාව මගේ තුරුලට ගන්න පුලුවන් වුණානෙ යෂ්. මට ඒ ඇති...ඔයා කොහෙහරි ඉදන් අහන් ඉන්නවානම්...මං ඔයාට ආදරෙයි...."

අශේන් සෙනග නැති මුහුදු වෙරළේ ඉදගෙන හයියෙන් කෑ ගැහුවා.මෙච්චර කාලෙකට එයාට තිශේන්‍යාට කියාගන්න බැරි වෙච්චදෙයක් එයා කෑ ගහලා කිව්වෙ හිත නිදහස් කරගන්න.

***මේක තමා තාත්තා කෙනෙක්ගෙ ජීවිතේ තියෙන අප්‍රකාශිත වචන පේළිය.මං ඔයාට ආදරෙයි....***

ඉතින් මෙච්චර වෙලා ෆෝන් එක අතේ තියාගෙන හිටියත් දැන් තමා ඒකෙ වෙනසක් තියෙනවා  කියලා අශේන්ට තේරුණේ.ෆෝන් කවර් එක ගැලෙව්වම තමා අශේන්ගෙ කට ඇරුණේ.ඒකෙ ඇතුලෙ තිබ්බෙ කොළයක්.හරියටම කිව්වොත් ලිවුමක්.

***අප්පච්චීට,***

***කොහොමද ඉතින්?මං දන්නවා ඔයාට මේක හම්බ වෙද්දි මං ගොඩක් දුර ගිහින් ඉදියි කියලා.ඒත් මට ඒකට දුකක් නෑ.ඔයා ඇහුවා නේද මන් එදා රෑ කොහෙද හිටියෙ කියලා.මං එදා අවීව මීට් වෙන්න නෙවෙයි ගියේ.සොරි,බොරුවක් කිව්වට.මං ගියා අම්මි කලින් හිටිය ගෙදරට.එතනනම් ගන්න දෙයක් නෑ.පුලුවන්නම් එතන පොඩ්ඩක් සුද්ද කරලා ගන්න හොදේ.සීයා එතන නිකම් ඔහේ වහලා තියෙනවානෙ.අපරාදෙ.පුලුවන්නම් එතන කැෆේ එකක් දාන්න.ඒක පොඩි ඉල්ලීමක්.කරනවද නැද්ද කියල එක ඔයාගෙ තීරණයක්.කොහොම හරි මට එතන තිබිලා අම්මිගෙ ඩයිරි එක හම්බ වුණා.ඔය දෙන්නගෙ ස්ටෝරි එක ගැන කියන්න ඕනි නැනෙ.ඒත් මන් එතනදි දැනගත්තා ඔයා මෙච්චර කල් හංගපු කෙනා ගැන.ඉතින් මං අහන්නෙ නෑ ඇයි ඒක හැංගුවේ කියලා.මොකද මට ඒක හිතාගන්න පුලුවන්.ඔයා***

හිතනවානම් මට ඔයත් එක්ක තරහක් තියෙනවා කියලා,නෑ...එහෙම එකක් නෑ. ඉස්සර එහෙම තරහක් තිබ්බා.ඒත් දැන් එහෙම එකක් නෑ.ඒ ගැන හිතන්න එපා.අම්මි ඔයාව දාලා ගියාට මං ඔයා ළඟ ඉන්නවා කියලා ඔයා හිත හදාගෙන හිටියනම් ඔයාගෙ හිත ආපහු කඩන්න වෙනවට සොරි.මට තීරණේ කරන්න වුණා විදවලා මැරෙනවද,නැත්තම් ඊට කලින්ම මැරෙනවද කියලා.මන් තීරණේ කරා විදවන්නෙ නැතුව මැරෙන්න.කැන්සර් එක ගැන දන්නවා ඇති කියලා හිතනවා.ඒක ගැන දැන් හිතන්න එපා.මං ඔයා ළඟ හැමදාම ඉන්නවා.හරියට ඔයා හිටියා වගේ.ඔයා නෙපොනෙන්න හැමතැනම කියලා මං ටිකක් ටිකක් දන්නවා.ඔයාට සින්දු කියන්නත් පුලුවන්ලු.හැබැයි මං අහලානම් නෑ.ඒක වැඩක් නෑ දැන්...මං කියන්න හැදුවෙ අම්මිගෙ හොඳම යාළුවා විදිහට හරි මාව ළඟට ඇරන් මේ තරම් කාලයක් බලා ගත්තට තැන්ක් යූ...මං ඉස්සර ඔයා එක්ක තරහින් හිටියා..ඒත් මට ටික ටික තේරුණා මං වැරදියි කියලා...ඉතින්,මං ආදරෙයි අප්පච්චී...ඔයා නොදන්නවා වුණාට ඔයා මට නොදැනෙන්න කරන සමහර දේවල් නිසා මං මාරම විදිහට සතුටු වුණා.නෑ මං දැක්කා ඔයා කොහෙ හරි කොනක ඉදන් මං දිහා බලන් ඉන්නවා.මාට පනිෂ් කරපු දවස් වල රෑට ඇවිල්ලා ඔළුව අතගාලා යද්දි මන් හේතුවක් නැතුව සතුටු වුණා.ඔවු,මන් ගොඩක් වෙලාවට නිදි වගේ හිටියෙ බොරුවට.මොකද මන් බයවුණා මන් ඇහැරුණොත් ඔයා මාව දාලා යයි කියලා.එදා ඔයා මගෙ අප්පච්චි කියලා මං දැනන් හිටියානම් කවදාවත් මට ඔයා ගැන තරහක් ඇති නොවෙන්න තිබුණා.සොරි මගෙ අතින් ඔයාගෙ හිත රිදුනානම්...මාව අම්මිගෙ හොඳම යාළුවා විදිහට හරි ළඟට ගත්ත එකට තැන්ක් යූ....දන්නවද දෙයක්?මං හැමදාම ට්‍රයි කරේ ඔයාගෙ අවදානෙ ගන්න.ඒත් හැමදාම ඔයාගෙ අවදානෙ තිබිලා තියෙන්නෙ මං ළඟ කියන එක මට මගෑරිලා...ඉතින් මෙච්චර කල් මාව බලාගත්තට තැන්ක් යූ අප්පච්චී...හැමදාමත් සතුටින් ඉන්න.(මං නැතුව සතුටෙන් ඉන්න කියන එක ගැන හිතන්න එපා.යෂ්ටත් තැන්ක් යූ කියන්න හොදේ.නැත්තන් පවුනෙ එයා.ඒයා හිටියෙ නැත්තන් මං මේ වෙද්දි මානසික ලෙඩෙක්.ඉතින් මාව මේතරම් කාලයක් බලාගත්ත එයාටත් තැන්ක් යූ කියන්න.මං මතක් කරලාවත් නෑ කියලා හිතයි...හැබැයි වැඩිපුර ආදරේ ඔයාට...ඔය දෙන්නාටම මං ආදරෙයි.)ආපහු,මට අම්මාගෙවත් අප්පච්චිගෙවත් අඩුව නොදැනෙන්න හැමදේම දීලා මාව අවුරුදු දාහතක් බලාගත්තට තැන්ක් යූ...තව දෙයක්,මගේ රූම් එකේ ලාච්චුවක ඇති ඔයාට ගත්ත බර්ත් ඩේ ප්‍රසනට් එක.ඒක අම්මිගෙනුයි මගෙනුයි. අම්මිගෙ වෙඩින් එක දවසෙ ඔයාට දෙන්න කියලා හිතාගෙන තමා අම්මි ඒක හදවලා තියෙන්නෙ.ඒ ඔයාට අම්මිව හැමදාම මතක තියාගන්න කියලා වෙන්න ඇති.ඒත් ඒක අම්මිට ඔයාට දෙන්න බැරිවෙලා.ඒක ගන්න...ලස්සන රින්ග් එකක්..මගෙනුයි අම්මිගෙනුයි කියලා හිතාගන්න.ආපහු,ආදරෙයි....

ඔයාගෙ තිෂු

කොහෙදෝ තිබ්බ ඩයිරි එකකින් වැටිච්ච කොල දෙකක් අශේන් ඇහිදගත්තෙ හිත ඇතුලෙන් අඩන ගමන්.අවුරුදු ගානක්ම අඩලා හෙම්බත් වෙලා හිටිය අශේන් මේ වෙද්දි හැම රෑකම බෙහෙත් අහුරක් කටට දාගන්න ලෙඩෙක් වෙලා.කොහොම නමුත් අශේන් ඒ ඇහිදගත්ත කොළ දෙකෙන් එකක් එයාගෙ තිෂූගෙ ලියුම වෙද්දි අනිත් එකක තිෂූට නොලැබෙන බව දැන දැනත් තිෂූට ලිව්ව ලියුම වුණා.අවුරුදු ගාණකට පස්සෙ අශේන් ඒ ලියුම ඇරලා බැලුවා.ඒ ලියුමෙ තිබ්බෙ එයාගෙම අත් අකුරු වෙද්දි,අශේන්ගෙ ඇස්වල කඳුලු පිරුනෙ ඉබේටමයි.

*මගේ පුංචි රෝස මලට,*

*මං හිතනවා ඔයා අම්මි එක්ක සතුටින් ඇති කියලා.මන් හැමදේම ඇතාරියා.දැන් යෂ් තමයි මන් හදපු මාපියාව ඉස්සරහට ඇරන් යන්නෙ.කොහොම නමුත් ඔයාට නොලැබෙන බව දැන දැනත් මන් මේ ලියුම ලියන්න්නෙ මගේ හිත නිදහස් කරගන්න කිව්වොත් ගොඩක්ම හරි.මතකද ඔයා යෂ්ට කියලා තිබ්බා නුවරඑළියේ ඉන්න ආසයි කියලා.මං නුවරඑළියෙන් බන්ග්ලෝ එකක් ගත්තා.ඒක ලස්සනයි.ඒත් ඒ බන්ග්ලෝ එක හිස් වගේ දැනෙනවා.ඔයා නැතුව පාලුයි.කවදාවත් කියලා නෑනෙ.ඒත් ඔයාව පේන්න නැති හැම තප්පරයකම ඔයාව හොයන මාව අද ඔයා තනිකරලාම දාලා ගිහිල්ලා.ඒත් ඇත්තටම මට හරි පාලුයි.වෙනදට මාත් එක්ක රණ්ඩු කරලා හරි මගෙන් බැනුම් අහලා හරි මාත් එක්ක ඉන්න කෙනා අද මං ළග නෑ කියලා දැනෙද්දි හිතට මාර බරක් දැනෙනවා.යුගාන්‍ය ඔයාව ළමානිවාසෙට දැම්මමත් මට දැනුනෙ පාලුවක්.ඒ වගේම පාලුවක් මට දැනුත් දැනෙනවා.ඉස්සර අම්මි විහිලුවට කියනවා මායි දුවයි දෙන්නම නැති වුණොත් ඔයා මොකද කරන්නෙ කියලා.මන් ඒ හැමදවසකම කරේ ඒ ප්‍රශ්නෙ මගෑරපු එක.ඒත් මං කවදාවත් හිතුවෙ නැහැ ඒ වගේ දවසක් එයි කියලා.අද එහෙම දවසක් ඇවිල්ලා.මං හැමදාම එන්න එපා කියලා ප්‍රාර්ථනා කරපු දවස අද ඇවිල්ලා.එහෙම දවස් වල මං තනියෙන් ජීවත් වෙන්නෙ කොහොමද කියන එක මට තාම ලොකු ප්‍රශ්නයක්. අම්මිට අනාගතේ දකින්න පුලුවන්ද කොහෙද නේද තිෂූ? නැත්තන් අම්මි කොහොමද හරියම එහෙම මගෙන් ඇහුවෙ.ඔයා*

*පොඩිකාලෙ හරි දගයි.දැන් කියලත් වෙනසක් තිබ්බෙ නැනෙ ඉතින්.මාත් එක්ක සෙල්ලමමයි.මාෆියා ෆීල්ඩ් එකට මන් වෛර කරන්න ගත්තා.ඒක නිසා තමයි මට ඔයාව මන් ළඟ තියාගන්න බැරිවුණේ.නැත්තන් මන් ඔයා එක්ක අදටත් සතුටෙන් ඉන්නවානෙ තිෂූ.ඔයා දන්නවද මන් සතුටුවෙනවා එදා බීච් එකේදි හරි මගේ හිතේ තිබ්බ දේවල් කියන්න පුලුවන් වුණ එකට.මොකද බැරි වෙලාවත් මට ඔයාට ආදරෙයි කියාගන්න බැරි වුණානම් මට පිස්සු හැදෙයි.ඔයා දන්නවා ඇතිනෙ මං ඔයාට ආදරෙයි*

*කියලා.කතාවකුත් තියෙනවනෙ ආදරෙයි කියලා කියන්නම ඕනි නැහැ ආදරේ දැනුනානම් ඇති කියලා.මං පුලුවන් විදිහට ඔයාට ඇගෙව්වා. මං ඇත්තටම ඔයාට ආදරෙයි මැණික.ඔයා සතුටින් ඉන්න.තව දෙයක් මතක් කරන්නම්,ඔයා වෙනුවෙන් තාමත් මාෆියා ක්වීන් පෝස්ට් එක තියෙනවා.කවදම හරි ඔයාට ඒක ඕනි වුණොත් ඒක තාම ඔයාගෙම තමයි.ආදරෙයි මැණික....*

*මීට,*

*අප්පච්චී....*

ඒ ලියුම් දෙකම ආපහු එමීෂාගෙ ඩයිරි එකට දාලා වහපු අශේන් ආවෙ එයාගෙ තිෂූගෙ ඉල්ලීමට ඕපන් කරපු කැෆේ එකේ වැඩටික බලලා යන්න.ඔවු එයා ඒක ඉෂ්ට කරා.ලොකු ආදායමක් නැතැත් අශේන් හැමදාම වගේ මේ කැෆේ එකට ආවා.ඒකට ලොකුම හේතුව මේක එමීෂාගෙ ගෙදර වෙච්ච එක වගේම මේක තිශේන්‍යාගෙ අදහසක් වෙච්ච එක.පැයක් දෙකක් කැෆේ එකේ ගෙවලා අශේන් යන්න කියලා ඉදන් හිටියටේබල් එකෙන් නැගිට්ටා

**"යමුද මාස්ටර්?"**

**ඔවුජ් යෂ්.එදා කිව්වා වගේම යෂ් තාම අශේන් ළඟ.අශේන් කරේ ඔළුව වනලා යෂ්**

දුවෙක්ගෙයි කතාවක්.දුවගෙ කොණ්ඩෙ කොටයි උරහිස් ළගට.දුව දන්නෙ නැහැ මේ එයාගෙ තාත්තා කියලා.මට ලස්සන කවර් එකක් හදලා දෙන්න මේ කතාවට.කතාව ලිව්වෙ තීක්ෂණා වෙලේගෙදර

කැෆේ එකෙන් එළියට ආවා.

"යමු..."

අශේන් ලෑස්ති වුණේ කැෆේ එකටත් ඇවිත් සෙමෙට්‍රි එකටත් ගිහින් යන්න.ඉතින් දෙන්නම කාර් එකට නැගලා මේන් රෝඩ් එකට වාහනේ දාද්දිම,

බ්‍රාස්.....දඩස්....

"යෂ්...."

යෂ් බ්‍රේක් ගහද්දිම අශේන් යෂ්ගෙ නම කියලා කෑගැහුවා.කෙලින්ම බයික් එකක් ඇවිල්ලා කාර් එකේ හැප්පෙන්න ගියත් යෂ් නූලෙන් බ්‍රේක් ගහලා වෙන්න ගියපු විනාසෙ නවත්ත ගත්තා.හැබැයි වැරැද්ද යෂ්ගෙ.මොකද එයා දැක්කෙ නෑ වේගෙන් ආපු බයික් එක.ඒත් බයික් එකට ටිකක් හානියි වගේ.කාර් එකටනම් ලොකු ප්‍රශ්නයක් නෑ.පොඩ්ඩක් හීරුණා විතරයි.ඒත් බයික් එකේ සයිඩ් කණ්ණාඩියක් කැඩිලා.

ටක්...ටක්...ටක්...ටක්...

බයික් එකේ අයිතිකාරයා යෂ්ගෙ ෂටර් එකට තට්ටු කරද්දි යෂ් වගේම අශේනුත් කාර් එකෙන් බැස්සා.ඒත් බයික් අයිතිකාරයා ෆුල් ෆේස් හෙල්මට් එකක් දාලා හිටිය නිසා මේ කවුද කියලා අශේන්වත් යෂ්වත් දැක්කෙ නෑ.

"සොරි...මං දැක්කෙ නෑ....ඇත්ත-"

"-සොරි කිව්වම ඔක්කොම හරියනවානෙ නේද?.අනික මේ?"

හෙල්මට් එක ගැලෙව්වම අශේන් වගේම යෂ්ට පුලුවන් වුණේ ඇසුත් ලොකු කරගෙන එයා දිහා බලන් ඉන්න එක විතරයි.ඒ කොට කොණ්ඩෙ,කෝපිපාට ඇස්,සුදුත් නැති තකෙලුත් නැති හම,ගානට මේන්ටේන් කරපු ඒ ඇග,කොට ඇහිබැම,සනකම් ඇහි

පිහාටු ඒ ඔක්කොම සමානයි.සරලවම කිව්වොත් මේ ඉන්නෙ තිශේනායාගෙ පුරරුත්පත්තියක්.කිසිම වෙනසක් නැතුව ඒ විදිහටම,කටහඬ වගේම හැමදෙයක්ම සමානයි.හැබැයිඒ ඇස්,කෝපි පාටයි.ඒක විතරමයි වෙනසකට කියලා තිබ්බෙ.

"හෙලෝ....?"

අශේන් වගේම යෂ් තමන් දිහා කන්න වගේ බලන් ඉන්නවා කියලා තේරුණ නිසා වෙන්නෙ මොකද්ද කියලා කල්පනා කරන ගමන් එයා අශේන්ගෙ මූණ ඉස්රහින් හෙල්මට් එක වනලා අශේන් හිටිය ලෝකෙන් එයාව එළියට ගත්තා.

"ඔයා කවුද-"

"සුදූ?මොකද්ද මෙතන වුණේ?"

මැදිවයසෙ පිරිමි කෙනෙක් කාර් එකකින් බැහැලා අශේන්ලා හිටිය තැනට ආවා.අශේන් ඒ ගෑණු ළමයා කවුද කියලා ඇහුවත් එතනට ආපු කෙනා නිසා ඒකට උත්තරේ අශේන්ට දැනගන්න බැරිවුණා.

"නෑ අප්පච්චී...පොඩි ඇක්සිඩන්ට් එකක්...ලොකු අවුලක් නෑ,මගේ බයික් එකේ සයිඩ් මිරර් එක කැඩිලා.එච්චරයි..."

ගැණු ළමයා එයාගෙ අප්පච්චී කියලා අශේන් වගේම යෂ් අඳුරගත්ත කෙනාට පැමිණිලි කරා.

"සොරි මිස්ටර්...."

පිරිමි කෙනා සමාව ගන්න හැදුවත් ගැණු ළමයා ඒකට ඉඩ දුන්නෙ නෑ.

"එයානෙ බලන්නෙ නැතුව කාර් එක දැම්මෙ?ඇයි අප්පච්චි සොරි කියන්නෙ?"

ගැණු ළමයා කියන්නෙ ඇත්ත වුණත් පිරිමියා ගැණු ළමයගෙ අතින් අල්ලගත්තා.

"කාම් ඩවුන් සුදූ...ඔයාගෙ කාර් එකේ රින්ග් එකට යන්නකො... මං ආවෙ ඔයාගෙ එකේ...නුවන්ට කියන්න මගේ කාර් එක එවන්න කියලා...පරිස්සමින් ඉන්න...ඔහොම කේන්තියෙන් එහෙම රින්ග් එකට බහින්න එපා...ඊටපස්සෙ මට පොලීසි ගානෙත් එන්න වෙයි... මතකනෙ එක සැරයක් එක්කෙනෙක් එක්ක ෆයිට් කරන්න ගිහිල්ලා වෙච්ච දේ...දැන් යන්න..."

පිරිමියා ගැනු ළමයට උපදෙස් ටිකක් දුන්නාම ගැණු ළමයා යෂ්ට වගේම අශේන්ටත් රවලා එයාගෙ අප්පච්චිටත් රවලා එතනින් ගියේ බයික් එකේ හෙල්මට් එක තරහෙන් බිම ගහලා.

'ගතිගුණත් එහෙමමයි.'

අශේන්ගෙ හිතේ වැඩකරේ මේ ඉන්නෙ තිශේනාා කියලා.ඒත් ඒක එහෙම වෙන්න බෑ කියලා දැනන් හිටියත් අශේන්ට ඒක පිළිගන්න උවමනාවක් තිබ්බෙ නෑ.

"සොරි...මේ මිස්ටර්?"

"අශේන් පළිහක්කාර."

"*ආදේශ් ශාක්‍යසිංහ..*"

අශේන් වගේම ගෑනු ළමයාගෙ අප්පච්චි වෙච්ච ආදේශ් අතට අත දුන්නෙ දැන් ටිකකට කලින් පොඩි හරි ඇක්සිඩන්ට් එකක් වුණේ නෑ වගේ.

"මං දන්නෙ නෑ කාගෙද වැරැද්ද කියලා.ඒත් සොරි මිස්ටර් අශේන්.එයාට ඉක්මනට තරහා යනවා.අනිත් එක එයාට...."

අශේන් ඒක දන්නවා කියන්න වගේ ඔලුව වැනුවා.සමහරවිට අශේන් දන්නවත් ඇති.

"ඉට්ස් ඕකේ...අපි කොෆී එකක් බොමුද?මිස්ටර් ආදේශ්ගෙ කාර් එක එන්න ටිකක් වෙලා යයිනෙ?"

ආදේශ් හා කියන්න ඔලුව වැනුවම යෂ් එයාලගෙ කාර් එක ගරාජ් එකකට දාලා එන්නම් කියලා ගියපු නිසා අශේන් වගේම ආදේශ් කැෆේ එකට ආවා.

"අයිස් කොෆී?"

"ශුවර්..."

ඉතින් අයිස් කොෆී දෙකකුත් ඕඩර් කරලා අශේන් බැලුවෙ ආදේශ් දිහා.ඒ ගෑණු ළමයගෙ වගේ ෆේස් කට් එකක් තිබ්බත් ආදේශ්ටත් හිතුනෙ තමන්ගෙ දුවගෙ ෆේස් කට් එකත් මේ වගේමයි නේද කියලා.

"ආදේශ් මොකද කරන්නෙ?"

කතාවකට මුල පුරන්න හොද මාතෘකාවක් මතක් නොවුණ නිසා තමා අශේන් ආදේශ් මොනාද කරන්නෙ කියලා ඇහුවෙ.

"මම නම් බිස්නස් කරන්නෙ.අශේන් සමහරවිට දන්නවත් ඇති **RS group** එකේ චෙයාර්මන්..."

අශේන් **RS group** එකත් එක්ක බිස්නස් කරන්නෙ මීට අවුරුදු ගානකට කලින් ඉදන්.ඉතින් **Rs group** එක අශේන් හොදටම දන්නවා.

"මොකෝ මන් නොදන්නෙ.මං හිතන්නෙ මං වැඩකරලා තියෙන්නෙ ආදේශ්ගෙ තාත්තා *මහේන්ද්‍ර ශාක්‍යසිංහ* එක්ක."

ආදේශත් කරේ ඒක දන්නවා කියන්න ඔළුව වනපු එක.

"දුවගෙ නම මොකද්ද?"

"*අශානයා ආදේශ්චි ශාක්‍යසිංහ*"

*දොළොස්වන පරිච්චේදය*

අශානායා එයාගෙ අප්පච්චිගෙ කාර් එකෙන් ඇවිත් බැස්සෙ එයාගෙ ඉස්කෝලෙ මේන් ගේට් එක ළඟින්.කාර් එකෙන් බැස්ස අශානායා කෙලින්ම ගියේ බොක්සින් රින්ග් එකට.

"මේ මොකෝ බ්න් මේ?වයි මේ මල පැනලා."

අශානායාගෙ හොඳම යාලුවා වෙච්ච *නේත්‍යා සඳතැන්න* අශානායාගෙන් ඇහුවෙ වෙනාදාට හිනාවෙලා ඉන්න අශානායා අද ආවෙ තරහෙන් කියලා නේත්‍යාට බැලූ බැල්මටම තේරුණා.

"මොකෙද්ද මන් දන්නෙ නෑ රට හරකෙක් බයික් එක හැප්පුවා.අප්පච්චිගෙ කාර් එකේ ආවෙ."

'ඒකතමා මේ' කියලා කියන ගමන් නේත්‍යා අශානායාගෙ ග්ලවුස් දෙක අශානායාගෙ ස්පෝට් බෑග් එක ඇරලා එළියට ගත්තා.

"දන්නවද වැඩක්?"

නේත්‍යා අශානායාගෙ වෝටර් බොට්ල් එක එළියෙන් තියනගමන් අහද්දි අශානායා කරේ නේත්‍යාට අවදානෙ දුන්න එක.

"දන්නවද අශේන් පලිහක්කාර කියලා කෙනෙක් ගැන.?"

අශානායා කරේ නෑ කියන්න ඔලුව වනන එක.මොකද ඉතින් එයා ඒ කෙනා ගැන දන්නෙ නැහැනෙ.

"මාෆියා එකේ කෙනෙක්.හැබැයි හිත හොඳයිලු."

අශානායා නේත්‍යා දිහා බැලුවෙ හිනාවෙන ගමන්.

"මාෆියා එකේ ඉන්නවද ඉතින් හිත හොඳ අය?"

අශානායා කින්ඩියට විගේ ඇහුවත් නේත්‍යා කරේ අශානායාට රවපු එක.

"මන් දන්නෙ නැහැ.මොකෝ මට ඔය මනුස්සයාව දැකලා තියෙනවද?අපේ තාත්ති තමා කිව්වෙ"

ඔවු.නේත්‍යාගෙ තාත්තා වැඩකරේ අශේන්ගෙ ඔෆිස් එකේ.

"අදාල නෑනෙ."

නේත්‍යාගෙ කතාව මගෑරපු අශානායා කරේ බොටමයි ටීෂට් එකයි ගලවලා දාලා ශෝට් එකයි ආම් කට් ටීෂට් එකයි එක්ක රින්ග් එකට ගිය එක.

"ඔයා කතාව මගාරිනවා."

අශානායා කරේ කට කොනට හිනාවෙලා ග්ලවුස් දෙක දාගත්ත  එක.

මේ අතරෙ අශේන් හිටියෙ තිශේනායාගෙ කාමරේ.මදිපාඩුවට යෂුත් තිශේනායාගෙ ඇඳ උඩින් ඉඳගෙන හිටියා.අශේන් හිටියෙ තිශේනායාගෙ ෆොටෝ එකක් අතේ තියාගෙන.

"ආදේශ්වි........ලස්සන නමක්........එයා ඔයා වගේමයි.මන් විශ්වාස කරන්නද ඒ ඉන්නෙ ඔයා කියලා.?"

අශේන් තිශේන්‍යාගෙ ෆොටෝ එක එක්ක කතා කරන දිහා බලන් හිටිය යෂ්ට ඉබේම බර හුස්මක් පිටවුණා.

"ඔයා ආදේශ් එක්ක සතුටින් ඉද්දි මන් කොහොමද මැනික ආපහු ඔයාගේ ජීවිතේට එන්නෙ?ඔයා ඒ විදිහමයිනෙ මැණික...ඒ උඹ නෙවෙයි කියලා දැන දැනම මං කොහොමද පුතේ උඹේ ජීවිතේට ආපහු එන්නෙ?එක්කො උඹ නැතුව ඉස්සරහට ජීවත් වෙන්න විදිහක් ආපහු ඇවිල්ලා කියලා දීලා පලයන් පුතේ...මේ අප්පච්චිට දැන් බලාගෙන ඉදලම ඇතිවෙලා..."

අශේන් තිශේන්‍යාගෙ ෆොටෝ එක එයාගෙ පපුවට තුරුල් කරගනිද්දි යෂ් කරේ ඒ දිහා බලන් හිටිය එක.යෂ් කියලා වෙන මොනා කරන්නද?

"මං ආදේශ්ව් එක්ක කතා කරොත් තිෂූ තරහා වෙයිද යෂ්?"

යෂ් කරේ අශේන්ගෙ බැල්ම අගෑරලා අහක බලපු එක.

"මං අහන ප්‍රශ්න වලට උත්තර මන් ළගවත් නැතුව යෂ් ළග කොහෙන්ද?"

අශේන් තිශේන්‍යාගෙ ෆොටෝ එක තුරුල් කරගත්තා.

"මාස්ටර්...ආදේශ් ශාක්‍යසිංහ ඇවිත් ඉන්නවා එයාගෙ දුවත් එක්ක.මොකක් හරි බිස්නස් වැඩකට."

ගාඩ් එකට හිටිය කෙනෙක් ඇවිල්ලා කියද්දි යෂ් වගේම අශේන් කරේ මූණට මූණ බලාගත්ත එක.

*මෙය අවසානයද?එසේත් නැතිනම් තවත් ආරම්භයක්ද?*

*~~~~~~~~~(අ)ප්‍රකාශිත හැඟීම් ගොන්නක නිමාව~~~~~~~~~*

*~~~~~~~~~~නිහඬ හදවත් තුලින් හමුවෙමු~~~~~~~~~~*



## පසුවදන

අධ්‍යාපන අමාත්‍යාංශය අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත් කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම වැඩසටහනක් ඌ බව අධ්‍යාපනඥයන් ගේ පිළිගැනීම නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කර ඔන්නට යොමුවීම ව්‍යාපෘති ගමන් මගේ හැරවුම් ලක්ෂයකි ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම්පරාව ට අනාගත ලෝකය පෙන්වා දෙන නූතන පාසල නූතන තාක්ෂණ මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළ යුතු බව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවකු ලබන ආස්වාදය අන් කිසිවකුගෙන් වත් ලබා ලබාදිය නොහැකි නිසාය තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම් මෙන්ම මානව දැනුම ගබඩාවී ඇති පොත පතින් ලක්ව ගන්නට මෙන්ම අධ්‍යාපනය ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහමායාබාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් හේමාලා උපහාර ග්‍රන්ථ කරන ව්‍යාපෘතිය දියත් වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයෙන් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සයිබල ගැන්වීමට ඉතිහාසයේ යුග මෙහෙවරක් ඉටු කළ හෙම්මාලා දැක්වීමද මෙහි මූලික අරමුණයි මහනුවර මහාමායාබාලිකා විද්‍යාලයේ දියණියන් විදුහල්පති පුතුමිය ගුරුබවතුන් දෙමව්පියන් ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද දියවඩන නිලමේ තුමන් ඇතුළු ශ්‍රී දළදා මාලිගාවේ කාර්යමණ්ඩලයට ද මෙම කාර්ය වෙනුවෙන් ස්තුතිවන්ත වෙමු.

සෙනවිරත්න මහ ලේකම් (ව්‍යාපෘති නිර්මාතෘ)